2020 නොවැම්බර් මස 03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්රි |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම

**01.01** 2020.10.06 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව හා 2020.10.23 දින පැවති විශේෂ සභා වාර්තා සම්මත කිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.10.06 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

2020.10.06 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.10.23 දින පැවති විශේෂ සභා වාර්තා සම්මත කරන ලෙස ඉල්ලා සිටිනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

2020.10.23 දින පැවති විශේෂ සභා වාර්තාව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

2020.10.06 වන දින පැවති මාසික සභා රැස්වීමේ මාගේ කතාවේ 22 පිටුවේ මාගේ කතාවට යට පේළි තුනට උඩ තිබෙනවා . එහි තිබෙනවා මේ ටෙස්ට් ක්‍රීඩාංගණ දෙක කියා. එකක් ලෙස සංශෝධනය කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ ජාත්‍යාන්තර ක්‍රිඩාංගණයක් හදන්න. එච්චරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම ටෙස්ට් ක්‍රිඩාංගණ දෙක නෙමේ. එක ක්‍රිඩාංගණයක් ලෙස සංශෝධනයක් විය යුතුයි. ඊළඟට 26 වෙනි පිටුවේ මාගේ කතාවේ 4 වෙනි තිරුවේ මිනිසුන්ට ඕක ලොකුවට කා වදින කොටසක් කියන එක. සභා වාර්තාවේ වචන වල තිබෙනවා ගොඩක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැවතිමේ තිත ගොඩක් එහාට ගිහිල්ලා. ඔබතුමාගේ වචන ටික තිබෙනවා. නැවතිමේ තිත තැබිමේ වරද විතරයි තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සභා වාර්තාවේ 106 පිටුවේ 12.08 න් පසසේ අපි මේ සභාවේ හිටියේ නැහැ. අපි ගියා අර සෝභිත මන්ත්‍රිතුමාගේ මළ ගෙදර යන්න. එය සටහන් වෙලා නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මන්ත්රිවරු කවුරුත් අත්සන් ලේඛණයේ අත්සන් කර තිබෙන්නේ 9.30ට. මෙතන 11.00 එනකෙනාත් 9.30 දමා අත්සන් කරනවා. එමනිසා ඔයාගේ වගකිම තමයි මන්ත්‍රිතුමා එන වේලාව ලියා ගෙනතිබෙනවා නම් මෙහි සටහන් කරන්න. මොකද ප්‍රශ්නයක් තිබෙනවා. මේ කියන කරුණ ඇත්ත. ඒ මන්ත්‍රිතුමා මෙතැන නැතිනම් එයට වගකියන්න බැහැ. ඊළඟට මෙතැන ප්‍රමාද වෙලා එනවා. දැන් මෙතැන ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රිවරු 3කු නැහැ. ඉතිං ඒ තුන්දෙනා මෙතැන හැමදාම 9.30 දමා අත්සන් කරනවා. 9.30 දමා අත්සන් කරන්න එපා. 11.00 නම් 11.00 දමා අත්සන් කරන්න. 12.00 නම් 12.00 අත්සන් කරන්න ඕන. ඒ සියළු කොටස් වලට ඒ මන්ත්‍රිවරුන් වගකිමෙන් නිදහස් වෙනවා. ඒ වගේම මටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ මන්ත්‍රිවරු වෙලාවට නොපැමිණිම සම්බන්ධව. මට ඇත්තටම කණ්ඩායමක් වශයෙන් මාගේ පක්ෂයට දැනුම් දෙන්න විදියක් නැහැ. මේ හැම එකේම හැම කෙනාම 9.30 තමයි දමා තිබෙන්නේ. ඔය ගියපු වේලාව මෙහි වදින්න ඕන. අනිවාර්යෙන්ම මන්ත්‍රිවරයා පැමිණිම සම්බන්ධයෙන්. එක හරි එය අතුලත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ සම්බන්ධව තීරණයක් තිබුණා එකක

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

සංශෝධනය කරන්න ඕන පිටුව කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ සංශෝධන වලට නෙමේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එහෙමනම් වාඩිවෙන්න ඔබතුමා. මේ වේලාවේ සංශෝධන ඇරෙන්න වෙන කතාවක් කරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. මේහි ඒකමතිකව කියන එක. මේ නැරඹුම් මැදිරියට අපි විරුද්ධ වුණේ නැහැ. මට ඕන කරන්නේ මා ප්‍රකාශ කර තිබෙනවා. මේ නගර සභා ප්‍රතිපාදන වලින් කරන්න එපා. ප්‍රතිපාදනයක් අරගෙන කරන්න කියන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා එය පැහැදිලිව තිබෙනවා. මන්ත්‍රීවරයෙකුට යෝජනාවක් ඉදිරිපත් විමේදි විරුද්ධ විම පක්ෂ වීම දක්වන්න. එය කිසිම ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහෙමයි. ඔබතුමා මේවා එකපාරට කියනවා. මන්ත්‍රීවරුන්ගෙන් වෙන වෙනම අහන්නේ නැහැ. එකපාරට ඒකමතිකව තීරණය කරයි කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමනේ මන්ත්‍රීතුමා මා අහනවා. කවුරු හරි විරුද්ධ අය ඉන්නවාද කියා. එහෙම විරුද්ධ කවුරුත් නැතිනම් එය ඒකමතිකව සම්මත වුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒකමතිකව තීරණය කළා කියා මගේ ගැටළුවක් නැහැ. සටහන් වෙන්න ඕන ටික සටහන් වෙලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මාගේ කතාවේ 48 වෙනි පිටුව නිවැරදි කළ යුතුයි. 6 වන පේළියේ. මන්ත්‍රීධුරය සම්බන්ධව කියන එක නෙමේ. මන්ත්‍රීවරයෙක් කියන එක. මාගේ කතාවේ අන්තිම කොටස.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

උඩ සිට පහළට

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිධුරය සම්බන්ධව කියන එක මන්ත්‍රීවරයෙක් ලෙස සංශෝධනය විය යුතුයි. මෙහෙම එකක් තිබෙනවා. මෙය හිතලා කරන එකක් නෙමේ. වචනේ හල් කිරිමෙන් පාපිල්ලෙන් ගොඩක් වෙනස් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහිදි මන්ත්‍රීවරුන් සියළු දෙනාටම දැන ගැනීමට කිව යුතුයි. මේ කතාවේ හැම දෙනාටම එම නිසා තමයි හඩ පටයක් ලබා දෙන්න තින්දු කළේ. මෙහි වැදගත් වෙන්නේ යෝජනාව ස්ථිර කිරිම මන්ත්‍රීවරුන්ගේ ඡන්දය පාවිච්චි කිරිමේ කොටස ඇරෙන්න මේ කතා කරන දේවල් මෙතැන ඇතුළත් කිරිමේ වැදගත් කමක් නැහැ. ඔබතුමලාගේ සියළුම කරුණු සලකා බලා තමයි මෙහි වැඩ කටයුතු කරන්නේ. මෙහි මන්ත්‍රීවරයෙක් සාධාරණ විවේචනයක් කළොත් මන්ත්‍රීවරුන් 20 එකඟ වුණාත් ඒ හැම මන්ත්‍රීවරයෙකුගේම හොඳ අදහසත් පිළි ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඒ වුණාට සභා වාර්තා ලැබිය යුතුයි. එය ලැබිය යුතුයි අපිට මන්ත්‍රීවරු විදියට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන්න ඕන. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයේ 2013.05.17 ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් මහතා 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පණත සංශෝධනය කරලා ගැසට් පත්‍රයකින් පළකර තිබෙනවා. ඒ පළකරපු ගැසට් එකේ 08.04 වගන්තිය යටතේ මෙන්න මෙසේ සඳහන් කර තිබෙනවා. සභා රැස්වීමේ දි සභිකයන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සහ ප්‍රකාශයන් සභා වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය. එසේ වුව ද කිසියම් සභිකයෙකු විසින් සභාවේ දී ඉදිරිපත් කරන ලද කරුණු හෝ ප්‍රකාශ පසුව දැන ගැනීමට අවශ්‍ය වන්නේ යයි නගර සභාව අදහස් කරන්නේ නම් එකී සභා රැස්වීමේ හෝ රැස්වීම්වල කාර්යය පවත්වාගෙන යාම පිළිබඳ හඩ පට වෙනම පිළියෙල කර නගර සභාවේ ආරක්ෂිතව තබා ගැනීම සහ සභිකයන් අතරේ බෙදා දිම සිදු කළ යුතුය. ඒ කියන්නේ පැහැදිලිව අපි මේ වාර්තා තැබිමේ අපේ නීති මාලා උල්ලංඝනය කිරිමක් ලෙස සලකන්න වෙනවා. මොකද අපිට දිපු නීතිය හැටියට හිටපු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් මහතා දිපු මේක අනුව කියා තිබෙන්නේ වාර්තාව දෙන්න හඩ පටියකින් යෝජනාව සහ ස්ථිර කිරිම මන්ත්‍රීවරු ඡන්දය දිම පමණක් වාර්තාවේ සඳහන් කරන්න කියා. ඒ අනුව තමයි අපිට ක්‍රියා කරන්න වෙන්නේ කියා මතක තියා ගන්න. මෙම පසුගිය වාර්තාව බැලුවාම පිටු 110කින් සමන්විතයි. හඩපට ලබා දුන් මාසයේ සභා වාර්තාව පිටු 32න් අපි අවසන් කර තිබෙනවා. මේ වාර්තාව වුණත් අපි හඩපට සමඟ වාර්තාවේ සංශිප්තය දෙනවා නම් මෙය අපිට කොළ 30කින් විතර අවසන් කරන්න පුළුවන්. මේ කොළ 110 කියන්නේ අපි හැමදාම මේ වාර්තා 40ක් මුද්‍රණය කරන්න ඕන. මන්ත්‍රීවරු 21ටත් අදාළ ස්ථාන වලට අපි යවන්න ඕන. කරුණු නිසා මේ වගේ පිටපත් 40ක් . සාමාන්‍ය යෙන් කොළ ගත්තොත් එහෙම 500 පැකට් 05ක් අවශ්‍ය වෙනවා. ඒ අනුව අපේ නිතිය දි තිබෙන දෙය අනුගමනය කිරිම අපේ සභාවට ඉතාමත් වාසිදායකයි. හඩපට ලබා දිමේදි මේ විදියට සංශෝධන ඉදිරිපත් කිරිමට අවශ්‍ය නැහැ. තමන්ගේ හඩපට ඒ විදියටම තිබෙනවා. ඒ කියපු කතා ඒ විදියටම

තිබෙනවා. ඉතිං මා හිතන්නේ සභාවක් විදියට අපිට දීපු නිති ක්‍රියාත්මක කිරීම හොඳයි කියා. මොකද අපි එය උල්ලංඝනය කරන්න හොඳ නැහැ. පනවා තිබෙන්නේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා මෙය පනවා තිබෙනවා. ඒ අනුව අපි ක්‍රියාත්මක කිරීම වඩා සුදුසුයි කියා සභාවට දැන ගැනීමට කියනවා. ඒ අනුව ක්‍රියා කරන්න අපි ඉදිරියට කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියන්න ගිහින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ එක වෙනම කතන්දරයක්. නැහැ මා ප්‍රධාන අමාත්‍යතුමා වරද්දලා නෙමේ. මේක ප්‍රධාන අමාත්‍යතුමාට නෙමේ. මෙය මධ්‍යම රජයෙන් ගසා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක ගිහින් දෙන්න කියවන්න. රාහුල මහතාට සිංහල තෙරෙනවා. මෙය සිංහලෙන් ගසා තිබෙන්නේ. මෙය ගසා තිබෙන්නේ කවුද කියා බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමාට සිංහල තෙරෙනවා වැඩියි. අපේ විරෝධතාවය මෙන්න. මෙය සභාගත කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුලින්ම ඔය පොත කියවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි 5 දෙනෙකු අත්සන් කරලා විරෝධතාවයක් ඉදිරිපත් කරනවා. ඔබතුමාගෙන් ඉදිරි දිනයකදී විවාදයක් ඉල්ලනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විවාදය දැන් පවත්වන්න. පොත කියවන්න ඕන නම් දැන් පවත්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ආඥා පනත අනුව දින 14ක් ඇතුළත විවාදයක් ලබා දෙන්න. මට වැඩක් නැහැ ඕක. මොකද හේතුව ඕක කියවා බලන්න. මා වැඩිපුර කාලය ගත කරන්න යන්නේ නැහැ. මා ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්නම්. මට ඒ සම්බන්ධව විවාදයක් ලබා දෙන්න. ආඥා පනත අනුව දිනයක් නම්කරන්න. දින 14ක් ඇතුළත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පාසැල් ගියේ නැති නිසා කියවන්න ආමාරු ඇති. පාසැල් ගිහින් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි පාසැල් ගිහින් තිබෙනවා. මේක නොමග යවන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඊට ඉස්සෙල්ලා සභාවේ වාර්තාව ලබා දෙන පොරොන්දුව මත සභාව ක්‍රියාත්මක වෙලා තිබුණා. නැවත මේ මසේ වාර්තාව ලබා දි තිබෙනවා. එතකොට මේ සභා වාර්තා අපිට ලැබිය යුතුයි කියා මන්ත්‍රිවරු විදියට. ඔබතුමා දැන් ඉදිරිපත් කරනවා නිති ප්‍රශ්නයක්. මේ අහවල් පණත අනුව . මේ අහවල් සංශෝධනය අනුව. මේක ලබා දීම අවශ්‍ය නැහැ කියා. අපි මන්ත්‍රිවරු වශයෙන් දකිනවා එය අවශ්‍යයි කියා. මේ මන්ත්‍රිවරුන්ගේ අන්‍යතාවය මේ වාර්තාව කියන්නේ. වෙන මොකක්ද මේ සභාවේ මන්ත්‍රිවරුන්ගෙන් කෙරෙන්නේ. මොකක්ද මන්ත්‍රිවරුන්ගේ අන්‍යතාවය. මේ සභාවේ. අපි මේ මාසයකට දවසක් ඇවිත් මේ සභාවේ ලිඛිත ප්‍රකාශයක් වෙන එකයි වෙන්නේ මේ සභාවේ. ඔබතුමායි මේ අවශය විදියට මේ සභාව අරගෙන යන්නේ. දැන් මේ චක්‍රලේඛන මේ සභාවේ සිටින කවුරු හරි දන්නවාද? මේ මන්ත්‍රිවරු ගාව තිබෙන්නේ මේ පණත විතරයි. එහෙනම් ඔබතුමා මේ දක්වා නිකුත් කරපු චක්‍රලේඛ , අණ පණත් සියල්ල මේ මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න. එකින් එක . එහෙමනම් ඔබතුමා මේ සභාව මෙච්චර දිනක් ගෙනහින් තිබෙන්නෙත් නීති විරෝධිව. හරි ඉදිරියට මෙය නිත්‍යානුකූල වෙන්න ඕන. එහෙමනම් මේ සියළු මන්ත්‍රිවරුන්ට පරිශිලනයට මේ අණපනත් ලබා දෙන්න. හෙට තව එකක් කියයි මෙහි තව පණතක් තිබෙනවා කියා. මාත් මෙය බැලුවාම තව පණතක් තිබෙනවා 2012ත එහෙම එහෙම පණත් සම්මත කරපුවා තිබෙනවා. ඉතිං මෙය 1952 සිට තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පණතක් නොදැන සිටිම අපේ වරදක්. පාර්ලිමේන්තුව විසින් පළ කළාම එය ප්‍රසිද්ධ ලෙස සියළු දෙනා දැන ගත්තා සේ සලකනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ මන්ත්‍රිවරුන් ඇවිත් ඉන්නේ අවුරුදු තුනකටයි. මෙහි සේවය කරන්න. මහජනතාවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සම්මත කරන ඉතිහාසය පුරා සියළුම අනපණත් පරිශිලනය කිරිමේ හැකියාවක් නැහැ. අපට වැදගත් වෙන්නේ නගර සභාව සම්බන්ධව නිකුත් කර ඇති ගැසට් නිවේදන හා අණපනත් පමණයි. ඒ මන්ත්‍රිවරු යම් මට්ටමක අවබෝධය තිබෙන්නේ මේ පණත පමණයි. එතකොට ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරි පළාත් පාලන කොමසාරිස්තුමා හරි එවන ලද චක්‍රලේඛණ මා වගකිමෙන් අහනවා ඉතිහාසයේ ඔය ගැසට් එක මේ සභාවේ ගැසට් කර තිබෙනවාද කියා. ඔබතුමා දන්නවා. නැහැනේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා නම් දන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේ සභාවේ සභාගත කරලා නැහැ. පුළුවන් නම් පෙන්වන්න. මා අභියෝග කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2013.05.17 අවුරුදු 7ක් වෙනවා මෙය නිකුත් කරලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඒ තිබෙන්නේ 2008 අතුරු ව්‍යවස්ථාව. එක මාගේ ගාවත් තිබෙනවා. ඕක නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක අපේ වරදක් නෙමේ. මේ පණත මන්ත්‍රීවරයෙක් වශයෙන් සියළුම දෙනා දිවුරුම් දුන් දවසේම පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මඟින් ඔබ සියළු දෙනාටම මෙහි කොටස් ලබා දී තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙකේ කොටස් ලබා දී තිබෙනවා. ඕක නැහැ. මා ගාවත් ඔය ලබා දුන් ඔක්කොම ඒවා තිබෙනවා. අපි කියන්නේ ඔය පණත් ගත් තැන් හරි එක්කෝ නගර සභාවට ගෙන්වා හරි ලබා දෙන්න සියළුම මන්ත්‍රීවරුන්ට. ඊට පස්සේ මන්ත්‍රීවරු ඕනම නීතියක් ක්‍රියාත්මක කරයි. එක ගැටළුවක් නැහැ. නිත්‍යානුකූලව අපි වැඩ කරන්න ඕනේ. අනික ඔබතුමා කිවුවා මෙහි මුදල් ඉතිරි කරන්න පුළුවන්. කාලය ඉතුරු කරන්න පුළුවන්. මා වගකිමෙන් කියනවා මේ නගර සභාවේ ලක්ෂ 4 , 5 ක් වැඩිපුර වියදම් වෙනවා කියා. අකාරක්ෂමතාවය නිසා. සුළු සේවකයන්ට ගෙවනවා ලක්ෂ 6ක් මාසයට. මේ ටෙන්ඩර් කිරිම් වල බඩු මිලදී ගැනිම් වල මේ යන රුපියල් දහ පහළොස්දාහ ගැනද කතා කරන්නේ. මේක වියදමක් කියා. මේ ගරු මන්ත්‍රීවරුන්ට පොතක් ලබා දෙන එක. මේක ලිඛිත සාක්කියක්. මාගේ දරුවෙකුගේ දරුවෙක් හරි කියවයි. ඉතිහාසයේ. දැන් ඔබතුමා අතේ තිබෙන 1930 ගණන් වල කොහොන්ද හම්බ වුණේ ලිඛිතව තිබ්බේ නැතිනම්. හැට ගණන් වල හරි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2013 ප්‍රධාන අමාත්‍යතුමා විසින් නිකුත් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා ඒ ගැසට් එක නෙමේ කියන්නේ. අපේ ලිඛිත වාර්තා 1934 සිට මේ දක්වා තිබෙනවා. නගර සභාව පටන් ගත් දිනයේ සිට. ඒ තිබෙන්නේ මේ වාරතානේ. ඒක ක්‍රමයෙන් ක්‍රමයෙන් වර්ධනය වී ඇවිත් මේ දක්වා වැඩිවෙලා තිබෙනවා. හැබැයි මා එක දෙයකට ඔබතුමා සමඟ එකඟයි. මේ

සභාවේ වාර්තාවේ පිටු ගණන වැඩියි. ඒ ඔබතුමා මෙය විවාද මණ්ඩපයක් කරන නිසා. එක මන්ත්‍රීවරයෙක් එක වතාවක් කතා කරලා මොන හේතුව නිසා වත් දෙවැනි පාර කතා කරන්න දෙන්නේ නැතිනම් මෙතනින් මේ සභාව පිටු භාගයට එනවා. එහි ඒ සම්ප්‍රදාය රකින්න. නමුත් මේ පොත දෙන්න. මේ කෙටි කිරිමක් අවශ්‍ය නැහැ. මට කරුණික ඉල්ලීමක් කරන්න තිබෙන්නේ. මෙය මන්ත්‍රීවරුන්ගේ අන්‍යතාවය. අයිතිය. මන්ත්‍රීවරයෙකුට කවදාහරි දිනයක තමන්ගේ දරුවෙකුට හරි නගර සභාව වෙනුවෙන් තමන්ගේ හෘද සාක්කියට අනුව පෙන්වන්න තිබෙන්නේ මේ පොත විතරයි. ලිඛිත සාක්කියක් විදියට. මේ අවස්ථාවත් නැති කරන්න එපා. එමනිසා කාරුණික ඉල්ලීමක් කරනවා. මේ වාර්තා පොත මේ ආකාරයෙන් ලබා දෙන්න. නමුත් ඔබතුමාට බලය තිබෙනවා මේ සභාවේ ගරු මන්ත්‍රීවරු හසුරුවන්න. මේ අරගෙන බලන්න මේ විශේෂ සභා වාර්තාව මෙහි කොච්චර කරුණු තිබෙනවාද මෙහි මන්ත්‍රීවරු නැගිටනවා කතා කරනවා . වාඩිවෙනවා. නැවත නැගිටිනවා කතා කරනවා. ඔබතුමා පාලනය කරන්න උත්සාහ කරනවා. හැබැයි ඒවා අයින් කරනවා. එක මන්ත්‍රීවරයෙකුට එක වතාවයි. මාතෘකාවක් සම්බන්ධව. ඔබතුමා සභාපතිවරයා . අවසන් තින්දුව දෙනවා. එය පිළිගන්න. ගරුත්වය ගන්න. ඒ ක්‍රමවේදයට යන්න. හැබැයි මේ වාර්තා පොත ලබා දෙන්න කියන ඉල්ලීම මා කරනවා. එච්චරයි මා කරන ඉල්ලීම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වාර්තා තැබිම සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. රාහුල ලලිත වික්‍රම මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු 6කු අත්සන් කර තිබෙනවා. ධනසේන මාදුවගේ, සෝභිත රංජිත්, ඉන්ද්‍රා අයිරාංගනී , චම්පා සුමුදු කුමාරි, ඉනෝකා ක්‍රිශාන්ති . නිලානි මන්ත්‍රීතුමිය යන අය අත්සන් කර තිබෙනවා. ඔබගේ ගැසට් පත්‍රය ඔබගේ 2020.10.07 අම්/නස/01/07 හා 2013.05.13 ගැසට් පත්‍ර යේ නගර සභා අතුරු ව්‍යවස්ථා ලිපිය හා බැඳේ. ඒ අනුවම පෙනෙවා සරත් මන්ත්‍රීතුමා ඔබතුමා දන්නේ නැහැ කියන්නේ මේක මන්ත්‍රීවරුන්ට මෙය යවා තිබෙනවා. ඔබගේ ලිපිය මඟින් දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අපගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. එමඟින් ( 01) ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ අයිතින් උල්ලංඝනය විම. ( 02) ජනතාවගේ තොරතුරු දැන ගැනීම අහිමි විම. (03) තම ජනතාව වෙනුවෙන් මහජන නියෝජිතයන්ගේ අදහස් දැක්වීම් සමාජයට ප්‍රේරනය නොවීම මගින් මහජන නියෝජිතයන්ගේ අයිතිවාසිකම් වලට හානියක් සිදු වීම.( 04) හඩ පටයක පවතින නීතිමය වලංගුභාවය පිළිබඳව ගැටලුව හා සම්ප්‍රදායික සභා වාර්තාවක පවතින නීතිමය වලංගු භාවය ( 05) යම් රාජකාරි කටයුත්තක් උදෙසා හඬ පටයක් ඉදිරිපත් කිරිමට හැකියාවක් නොමැති වීම. පරිවර්ථනය පිලිබඳ අවබෝධය නොමැති විම සහ අවශ්‍ය උපකරණ නොමැති විම. ( 06) කිසියම් මහජන නියෝජිතයෙකුගේ ශ්‍රවනය පිළිබඳ ගැටලුවක් තිබේනම් හෝ මතුවිය හැකි වුවහොත් දැඩි අසීරුතාවයකට ලක් විම යන මූලික කරුණු සැලකිල්ලට ගෙන මෙම විරෝධතාවය ඉදිරිපත් කරන අතරම , එකී අතුරු ව්‍යවස්ථාවේ අනෙකුත් වගන්ති මඟින් මෙහි තත්ත්වයන් වෙනස් ලෙසින් අර්ථ නිරූපනය වීම නීතිමය ගැටලු සහගත තත්ත්වයක් පැන නැගී ඇති බැවින් අප හට මහජන නියෝජිතයන් ලෙස නගර සභා අඥාපනත මඟින් ලැබී ඇති අයිතිවාසිකම් අනුව කටයුතු කල හැකි බවද මෙයින් සදහන් කර තිබෙනවා. මේ ඉල්ලීම ගැන සලකා බලමින් මේ ඉල්ලීම ක්‍රියාත්මක කිරිම සඳහා මේ වෙනුවෙන් උපදෙස් දීමට පළාත් පාලන කොමසාරිස්තුමා සමඟ මේ සභා රැස්වීම සතියකට කල් තියෙනවා. ලබන අඟහරුවදා 2.30ට කැඳවනවා.

- පෙරවරු **09.59** ට සභාව **2020.11.10** වන දින දක්වා අඩාලව කල් තබන ලදී.

2020 නොවැම්බර් මස 10 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති කල් තබන ලද මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රි ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |

| | |
|---|---|
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

❖ **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව ප.ව2.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී .**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අඩාලව කල්තියෙන ලද රැස්වීම ආරම්භ කරනවා. ඒ අනුව ප්‍රථමයෙන්ම පළාත් පාලන කොමසාරිස්තුමාට කරුණු දැක්වීම සඳහා මෙම සභාව කාරක සභා අවස්ථා බවට පත් කරනවා.

- පස්වරු 2.35 ට පමණ ගරු සභාව කාරක සභා අවස්ථාවට පත් කරනවා.
- නැවත පස්වරු 3.15 ට පමණ ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ කියන කාරණා සම්බන්ධයෙන් නිතිය මා නම් පිළිගන්න සූදානම් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයා පිළිගන්නේ නැතිනම් වාඩි වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේ මන්ත්‍රීවරුන්ගේ අයිතිය පිළිබඳව ඔබතුමා කොමසාරිස්තුමා කිවුවාට දැන් ගරු රාහුල මන්ත්රිතුමා ඉදිරිපත් කලානේ. එකට වඩා බලවත්නේ මේ නීතිය. මේක පුළුවන් කියා. සභාපතිතුමා එක හංගලා ගහන්න හදනවානේ. මේ වාර්තාව ලැබෙන්න ඕනේ අපට. මේක නිත්‍යානුකූලයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි. මේක බලවත් විත්තිය ඇත්ත. මේ ව්‍යවස්ථාව වෙනස් කරන්න අවශ්‍යනම් මේකට අනුව ක්‍රියා කරලා වෙනස් කර ගන්නයි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේකේ තිබෙනවා කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔකේ තිබෙන්නේ කියලා වෙනස් කරගන්න විදියයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙහි තිබෙනවා. පණත බලවත් කියා . අතුරු ව්‍යවස්ථාවට වඩා . අතුරු ව්‍යවස්ථාව කොහොමද මේකට වඩා බලවත් වෙන්නේ. අතුරු ව්‍යවස්ථාව බලවත් වෙන්න විදියක් නැහැනේ. මේ සභාවනේ බලවත්. සභාවට බලය දී තිබෙනවා ඕන නම් සම්මත කර ගන්න. ඕන නම් එපා. එකනේ පැහැදිලිව අතුරු ව්‍යවස්ථාවේ තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා නිකං කෑගහන්නේ නැතුව ඉන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මං කෑගහන්නේ මන්ත්‍රීවරුන්ගේ අයිතියක් එය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ එහෙම කෑගහන්න අයිතියක් නැහැ කාටවත්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අපි එහෙම කෑගහන්නේ නැහැ නිකං. අපි මේ අයිතිය වෙනුවෙන්. ඔබතුමා එක පාගන්න හදන නිසානේ කතා කරන්නේ. නැතිනම් මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්නේ. එහෙම කරන්න දෙන්න බැහැ. අපිට මේ වාර්තාව ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අතුරු ව්‍යවස්ථාව සම්මත කිරිමේදි විශේෂයෙන්ම කියන්න ඕන අපි 2016 වෙනකොට මේ සභාවක් තිබ්බේ නැහැ. ගරු කොමසාරිස්තුමා ප්‍රකාශ කළා මන්ත්‍රීවරු සිටියා සේ පිළිගෙන මෙය සම්මත කර තිබෙනවා කියා. එහෙම සම්මත කිරිම පිළිබඳව මා හිතන්නේ නිතිය අනුව ඇති. නමුත් මේ මන්ත්‍රීවරු මහජනතාවගෙන් පත්වෙලා එන මන්ත්‍රීවරුන් මෙතැන ඉන්නේ. එතකොට නිලධාරින් මේවා සම්මත කළා කියන්නේ ඉතාමත්ම කනගාටුදායකයි. මොකද මන්ත්‍රීවවරයෙක් පැමිණ ජනතාවගේ ප්‍රශ්න මෙතැන කතා කරනකොට එය සභාවේ වාර්තා වෙන්නේ නැතිනම් ඉතාමත් කනගාටුදායකයි. මොකද ඒ බලය නිලධාරින් විසින් ගෙන තිබෙනවා නම් එය ගැටළු සහගතයි. ඒ නිලධාරි බලය තිබෙන කොට කොමසාරිස් වශයෙන් ගෙන ඇති තින්දුව මා හිතන්නේ නැහැ වලංගු වෙන්නේ නැහැ. කොමසාරිස්තුමා කොච්චර ප්‍රකාශ කළත් මේ සභාවට වලංගු වෙන්නේ නැහැ. මාගේ දැනිමේ හැටියට. මොකද මෙහි ඉන්නේ මහජනතාව

පත්කරපු මන්ත්‍රීවරු. එමනිසා අපි ඉල්ලා සිටින්නේ දීර්ඝ කාලයක් ලබා දීගෙන ආ මේ සභා වාර්තාව ලබා දෙන්න. තව අවුරුද්දයි තිබෙන්නේ මේ සභාව. එමනිසා ඒ සභා වාර්තාව ලබා දෙන්න. කොමසාරිස්තුමා කියන්නේත් නිලධාරියෙක්. නමුත් මේ ගරු සභාවට ගරු මන්ත්‍රීවරු පත්කර එවන්නේ ජනතාව. එතුමා නිලධාරියෙක් . නමුත් මේ ගරු සභාවට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු පත් කර එවන්නේ ජනතාව. එකට අභියෝග කරන්න කොමසාරිස්තුමාට බැහැ. විශේෂයෙන්ම කියන්න ඕන කොමසාරිස්වරයෙකුට එහෙම අභියෝගයක් කරන්න බැහැ. ජනතාව මෙතැනට පත්කර එවන මන්ත්‍රීවරු ගන්න තීන්දු වලට. එමනිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටන්නේ මෙය දිගින් දිගටම ගෙන යා යුතු නැහැ. මා 1997 සිට මේ සභාව නියෝජනය කරනවා. හැබැයි මේ වගේ සභාවක් අපි හැමදාම ගාල ගොට්ටි ඇතිකරගත් සභාවක් අර අපේ සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි ඉතාමත් සමකාමීව ගිය සභාවක් . එමනිසා මේ සභාව නැවත වරක් ඒ තත්ත්වයට ඇද ගන්න එපා. නැවත වරක් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ සභාවාර්තාව ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභා වාර්තාව ගිය සභා වාරයේදීත් ලබා දුන්නා. ඊළඟ වතාවේදීත් ලබා දෙන්නම්. නමුත් මා කිවුවේ පවතින නීතිය. නීතිය මේකයි ලේකම්තුමිය. මට වාර්තා එපා. මට සීඩී තැටියක් දෙන්න . සභාවේ සංශිප්තිය විතරක් දෙන්න. අනිත් කට්ටියට දෙන්න. මා මේ සම්බන්ධයෙන් ඡන්දය විමසනවා. සභා වාර්තාව සම්පූර්ණම ලබා දිය යුතුද නැද්ද කියන එක ඔගොල්ලන් යෝජනා කරන්න. මුලින් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ඡන්ද විමසන එක කරන්න එපා. මන්ත්‍රීවරු අපසහුතාවයට පත්වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නිත්‍යානුකුල පණත තුළ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එළිපිට යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සභා වාර්තා ලබා දෙන්න කියා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔයවගේ ඡන්දයක් විමසන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අදහසක් තිබෙනවානේ ඔගොල්ලන්ගේ. එම අදහසට ගරු කරලා ඡන්දය විමසන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ඔබතුමා මන්ත්‍රීවරුන්ට සැලකිල්ලක් නැහැනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු උප සභාපතිතුමා, අවශ්‍ය කට්ටියට යෝජනාව කර ගන්න දෙන්න .

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපිත් කියනවා එය ඕන කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙනම් යෝජනා කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ ගරුසභාවට කලින් දිපු විදියට සභා වාර්තා ලබා දෙන ලෙස යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ස්ථිර කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඡන්දයක් ඔනේ නැහැනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂ අය ඉන්නවානම් අත ඔසවන්න. සියළු දෙනාම පක්ෂයිනේ. එහෙනම් මා විරුද්ධ විමට හේතුව ශ්‍රී ලංකා ප්‍රජාතන්තවාදි සමාජවාදි ජනරජයේ 2013.05.17 දිනැති ගරු දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් පලකර ඇති ගැසට් පත්‍රයේ 08.04 වගන්තියට පටහැනිව මෙම යෝජනාව සම්මත වන බැවින් ඒ සඳහා වැයවන මුදල සභාවට බරක් ලෙස සලකා මා විරුද්ධ විමට හේතුවක් වශයෙන් දක්වනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා, මට පක්ෂ විමට හේතු දක්වන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පක්ෂ විමට හේතු දක්වන්න බැහැ. මට වැඩ වගයකට එළියට යන්න තිබෙනවා. ඔබතුමා මුලාසනයට එන ලෙස දන්වා සිටිනවා. උප සභාපතිතුමා එන්න. ඇවිත් ඕන දෙයක් කර ගන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මෙය ඔබතුමාට කලින් 2018 දි ගන්න තිබුණානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක වෙනම දෙයක්. මා දැන් මේ ඡන්දය දිමට විරුද්ධ ප්‍රකාශ කළේ මාගේ අයිතියට මිසක ඔගොල්ලන්ගේ අයිතියට මේවා කළේ නැහැ. ඔගොල්ලන්ගේ අයිතියට අනුව ලබන පාර සිට ඔය සියළුම දේවල් ලැබෙව්. නමුත් මෙය නීති විරෝධි වැඩක් වින්තිය මා දන්නවා. එමනිසා මා එම නීති විරෝධි වැඩට හවුල් වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඇයි එදාම කලේ නැත්තේ ඕක. මෙහෙම අවුලක් වෙන්නේ නැහැනේ. එදාම එහෙම කළානම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔය කියන මේවා වාර්තා කර ගන්න ඕන නම් ගරු උප සභාපතිතුමා මේ පුටුවේ වාඩි කරලා මා යන්නම් එළියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි වාඩි කරන්න. අපි කැමතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔයා නෙමේ වාඩි කරන්නේ. වාඩි කරන්නේ එයා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි කියන්නේ නිතියට කරන්න.

**තීරණය**

අතුරු ව්‍යවස්ථාවට අනුව සභා වාර්තාව ලබා දිම පිළිබඳ ඡන්ද විමසිමක් කළ අතර ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා පමණක් විරුද්ධ වූ අතර විරුද්ධ විමට හේතුව ශ්‍රී ලංකා ප්‍රජාතන්තවාදි සමාජවාදි ජනරජයේ 2013.05.17 දිනැති ගරු දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් පලකර ඇති ගැසට් පත්‍රයේ 08.04 වගන්තියට පටහැනිව මෙම යෝජනාව සම්මත වන බැවින් ඒ සඳහා වැයවන මුදල සභාවට බරක් ලෙස සලකා විරුද්ධ වන බව ප්‍රකාශ කර අතර ගරු සෝභිත රංජිත් මහතා පමණක් එදින සභාවට නොපැමිණිව සිටි අතර අනිකුත් සියළුම මන්ත්‍රිවරු පක්ෂව ඡන්දය පාවිච්චි කරන ලදී.

03. ලැබී ඇති ලිපි හා පෙත්සම් සලකා බැලිම

**03.01 2020 සැප්තැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

- **පස්වරු 3.30 ට පමණ ටෙන්ඩර් විවෘත කරන ලදී.**

- ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පස්වරු 3.30ට පමණ සභාවෙන් පිටව වීම

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සැප්තැම්බර් මස වාර්තාව. මාසය තුල ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව 1015, මාසය තුල බෙහෙත් ශාලාව විවෘත තැබූ මුළු දින ගණන 19 ½ මාසය තුල රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධවල වටිනාකම රු.70,598.95 ක් වියදම් වෙලා තිබෙනවා. මෙය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා.

**තීරණය**

2020 සැප්තැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාවේ දැනගැනිම පිණිස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.02 අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා යකඩ පලංචි ප්‍රේම් 30 ක් හා ඊට අදාල අනෙකුත් කොටස් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කේ.ජේ.ඒ . සිල්වා වැඩ ක්ෂේත්‍ර පරිපාලක, යකඩ පලංචි 30ක් හා ඊට අදාල අනිකුත් කොටස් මිලදී ගැනීම. නගර සභාව මගින් නඩත්තු කරනු ලබන ගොඩනැඟිලි හා ප්‍රධාන කාර්යාලය අලුත් වැඩියා කටයුතු සඳහා අවශ්‍ය පලංචි සෙට් 30ක් ඊට අදාල ජොයින්ට් පින් කතිර ඇතුලුව පලංචි උඩට දමන ප්ලේට් 10ක් සමඟ මිළදීගෙන භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙනමෙන් ඉල්ලා ඇත.ඒ සම්බන්ධව තාක්ෂණසේවා නිලධාරි මහතාත් එය නිර්දේශ කර තිබෙනවා. ලේකම්තුමියත් නිර්දේශ කර තිබෙනවා. ඒ අනුව එය අනුමත කරන ලෙස ඉල්ලා සිටනවා.

- ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පස්වරු 3.35ට පමණ නැවත සභා ගර්භයට පැමිණිම.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙහි ඇස්තමේන්තුවක් අනුමත කර තිබෙනවාද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙහි ඇස්තමේන්තුවක් නැහැ. ඉල්ලීම තිබෙන්නේ. මෙය මිලදී ගැනිමක්. එතකොට මිලදී ගැනීමක් වුණාම ඉල්ලීම විතරයි. ටෙන්ඩර් කරනවා ඉල්ලීම.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා යකඩ පලංචි සෙට් 30 ක්, ප්ලේට් 10 ක් සහ ඊට අදාල ජොයින්ට් පින් කතිර ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.03 අම්බලන්ගොඩ නගර සභාව මගින් ලබාදෙන ලද කන්ද නිවාස යෝජනා ක්‍රමයේ කැබලි අංක 08 හි කේ.ඩබ්.අශෝක රංජිත් මහතාගේ නිවසට බටහිරින් ඇති පාර රජයේ තක්සේරුවට අනුව ඔහුට ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව තාක්ෂණසේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කේ.ඩබ්.අශෝක රංජිත් මහතා අංක 08, කන්ද මාවත , පටබැඳිමුල්ල , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මාගේ ඉඩම පිහිටි ස්ථානයේ ඇති බිම් ප්‍රමාණයක් මිලදී ගැනීම. ඉහත ලිපිනයේ ඇති වරිපනම් අංක 3/3 , 3/3ඒ අංක දරණ ඉඩමට යාබද ඇති පාර කොටස මා මිලදී ගත් අවස්ථාවේ සිට අවුරුදු 35ක පමණ කාලයක් මා විසින් බුක්ති විද ඇත. එම ඉඩමේ මායිමේ පෙන්නා ඇති පාර මේ වන විට පාවිච්චි නොකරන අතර එම ඉඩම් කොටස රජයේ තක්සේරු මුදලකට මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. ඒ සඳහා අපි තාක්ෂණසේවා නිලධාරි වාර්තාවක් කැඳෙව්වා. මේක වෙලා තිබෙන්නේ කන්ද මාවත. මෙන්න මේ විදියට අම්බලන්ගොඩ නගර සභාවෙන් බෙදා තිබෙනවා. මේ බෙදා තිබෙන කන්ද මාවතේ . මෙය නගර සභාවට අයිති ඉඩමක්. පාර කොටස නිවාස වලට අල්ලා ගෙන තිබෙනවා. මේ මහතා ඉල්ලා සිටිනවා එය එයාට විකුණන ලෙස.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මා හිතන්නේ අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩම් සැහෙන කොටසක් ජනතාව අල්ලා ගෙන සිටිනවා. එහෙමනම් ඔබතුමා මේ පුද්ගලයෙකු විසින් ඉල්ලා ඇති දෙයට එකඟ වුවහොත් නගර සභාවට අයිති ජනතාව අල්ලා ගෙන සිටින සියළුම ඉඩම් ජනතාව සතු කරන්න වෙනවා. මා හිතන විදියට එය නුසුදුසුයි කියන එකයි මාගේ මතය. අපි එහෙම දෙනවා නම් ගොඩක් ජනතාව සිටිනවා එහෙම අල්ලා ගෙන. අර අපි කිවුව මානිම්මුල්ලේ හැරවුම් වෘත්තය හදන ස්ථානය අල්ලාගෙන සිටිනවා. මහ අම්බලන්ගොඩ ඔය වගේ සැහෙන ඉඩම් ජනතාව පාවිච්චි කරනවා. එහෙමනම් අපි එක සභා තීරණයක් එන්න ඕන අපි සැමදෙනා සමඟම මේ නගර සභාව සතු ඉඩම් යම්කිසි තක්සේරුවක් කරලා යම්කිසි වටිනාකමකට ලබා දෙන්න. එහෙම නැතුව එක පුද්ගලයෙකුට පමණක් දෙනවාට මා මන්ත්‍රීවරියක් වශයෙන් මෙයට පුද්ගලිකව විරුද්ධයි.

- ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා පස්වරු 3.50ට පමණ සභා ගර්භයෙන් පිටවීම

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා නිලානි මන්ත්‍රිතුමියගේ අදහසට සම්පූර්ණම විරුද්ධයි. නිලානි මන්ත්‍රිතුමිය කියන්නේ මේ ඔක්කොම ටික ලියා දෙන්න කියා. එක්කෙනෙකුටවත් දෙන්න එපා. ඔක්කොටමත් දෙන්න එපා. මා නම් කියන්නේ. දැන් මේකේ දි විශේෂයෙන් පාරක්නේ. එක්කෙනෙකුට පාර කැල්ල දුන්නායි කියන්න. තුන්දෙනෙකුට දුන්නායි කියන්න. එක්කෙනෙකු ඉල්ලුවොත් මට පාර ඕන කියා. අපිට පාර ගෙන දෙන්න වෙනවානේ. තිබිච්ච පාරක්නේ. මෙම ඉල්ලීම ඉවත දැමිය යුතු යෝජනාවක් හැටියට තමයි මා දකින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්</u>**

මා ඉල්ලීමක් කරනවා මේ එක එක්කෙනා කරන විදියට දෙන්න එපා. ඔබතුමා නගර සභාවට එය පවරා ගන්න. මොකද මෙය මා දන්නා විදියට නගර සභාවේ ඉඩම් අල්ලාගෙන අනවසර ඉඩම් තිබෙනවා. අරයට පැවරීමක් කළහොත් ඔබතුමාලාට මෙවා ගන්න විදියක් නැහැ. නගර සභාව සතු වත්කම් පිටට දෙන්න එපා. ඒවා නගර සභාව සතුව තියා ගන්න. මේ පුද්ගලයාට විරුද්ධව නෙමේ. සමහර විට එයාගේ අවශ්‍යතාවය මත එයා ඉල්ලුම් කරනවා ඇති . අපේ නගර සභාව සතු ඉඩම් ඔය එක්කෙනාගේ තක්සේරු මුදලට දෙන්න හදන්න එපා. නගර සභාව සතු ඉඩම් නගර සභාව සතුව තබා ගන්න. මොනවා හරි වැඩක් කරන්න ගියාම තමයි ඉඩම් වල වටිනාකම පෙනෙන්නේ. තාම බොජුන් හලට ඉඩම් කැල්ලක් නැතුව ඉන්නවා. දෙන්න එපා කිසිම කෙනෙකුට නගර සභාව සතු ඉඩම්. තක්සේරු මුදලටවත් දෙන්න එපා. පාරක් අවශ්‍ය නම එය නගර සභාව සතුව තියා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි එහෙනම් ඒ අනුව කටයුතු කරන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව මගින් ලබාදෙන ලද කන්ද නිවාස යෝජනා ක්‍රමයේ කැබලි අංක 08 හි කේ.ඩබ්.අශෝක රංජිත් මහතාගේ නිවසට  බටහිරින් ඇති පාර රජයේ තක්සේරුවට අනුව ඔහුට ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉවත් කරන ලදී.

### 03.04 හිරේවත්ත හා පෝරඹ ශාඛා පුස්තකාල වරුවක් වසා තැබීම සම්බන්ධව පුස්තකාලයාධිපතිතුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හිරේවත්ත /පෝරඹ ශාඛා පුස්තකාල වරුවක් වසා තැබීම සම්බන්ධවයි. කළමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා වු පරිදි පෝරඹ ශාඛා පුස්තකාලය සහ හිරේවත්ත ශාඛා පුස්තකාලය වරුවක්

වසා තබා එක් පුස්තකාල සහායිකාවක් ශාඛා පුස්තකාලයට වාර්තා කල යුතු අතර අනෙක් පුස්තකාල සහායිකාව ප්‍රධාන පුස්තකාලයට රාජකාරි කටයුතු සඳහා යෙදවීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධව සභාවේ අදහස් විමසනවා. ඒ අනුව මේ තීන්දුවට එන්න හේතු වුණේ පෝරඹ පුස්තකාලයත් හිරේවත්ත පුස්තකාලයත් අවම භාවිතයක් තිබෙන්නේ. ඒ අනුව දැනට ඉදිරිපත් කර තිබෙන ලේඛණ අනුව දවස පුරා ඇර තැබීම පලක් වෙන්නැති එකක් තිබෙන්නේ. භාවිතා කරන අය අඩුයි. ඒ අනුව යෝජනාවක් ඉදිරිපත් වුණා. මෙය දවසක් හැර දවසක් වහන්න කියා. ඒ අනුව වරුව වරුව වැසීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

- ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා පස්වරු 3.55ට පමණ නැවත සභා ගර්භයට පැමිණීම .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ජනතාවට දැන්වීමක් ඉල්ලන්න අහවල් දින සිට මෙය වසා තබනවා කියා. මෙහෙමයි ක්‍රියාත්මක වෙන්නේ කියා. නැතිනම් සමහර විට අපහසුතාවයට පත් වෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් පෝරඹ ගත්තොත් එහෙම නිරීක්ෂණය කරලාද මෙහෙම අඩු පැමිණීමක් තිබෙනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුස්තකාල කමිටුව සඳහා සෑම වේලාකම පැමිණීම සහ පොත් බැහැරදීමට පැමිණි අය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනවා. එහි දැනට තිබෙන දුර්වලම පැමිණීම තිබෙන්නේ හිරේවත්ත. ඊළඟට දෙවැනි එක තමයි පෝරඹ. පෝරඹ දැනට මිනිසුන් භාවිතා කරන්නේ කියවීමේ ශාලාවක් වශයෙන් විතරයි. පොත් ගැනීමක් කරන්නේ නැහැ. එමනිසා මෙය විවෘත කර තැබීමට එක්කෙනෙකුට රු.35000/= ක් විතර යනවා මසයකට. එතකොට එලක් වෙන්නේ නැහැ කියා අපි තින්වක් ගත්තා. හිරේවත්ත වරුවකුත් , පෝරඹ වරුවකුත් එම ඇර තැබීම කරන්න අපි තීන්දුවක් ගත්තා. එක සේවකයෙක් තමයි දෙපැත්තට දමන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිරේවත්ත සම්බන්ධයෙන් අපි හොඳාකාරවම දන්වා කියවීම සම්බන්ධයෙන් උනාන්දුවක් නැති පිරිසක් එම ප්‍රදේශයේ වාසය කරන්නේ. නමුත් පෝරඹ කියවීම් ශාලාවක් හැටියට හෝ භාවිතා කෙරෙනවා. පාරේ යනඑනවිට අපි දන්නවා. අපේ යමක් කමක් දන්නා අය පෝරඹ පුස්තකාලයට ගොඩවෙලා පුවත් පත් බැලීම මනාව කරනවා. එමනිසා පෝරඹ සම්බන්ධයෙන් හිරේවතේත් තීන්දුව ගැනීම අනුවණ කමක් හැටියටයි අපිට හැගෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිරේවත්තේ පුස්තකාලය 2004 සුනාමි ව්‍යසනයෙන් පස්සේ තමයි ඔය තත්ත්වයට වැටුණේ. 2004 පෙර සියළුම වාර්තා ගෙන බලන්න. හිරේවත්තේ එතකොට සියළුම

ධිවර ජනතාව සිටියා. ධිවර ජනතාවට සුනාමි නිවාස දිලා තල්ගස්ගොඩ , දළුක්කන්ද , ධම්මිකපුර ඉන්නේ. දැන් කියවීමට අඩුබව අපි හොඳාකාරවම දන්නවා. පසුගිය පුස්තකාල කමිටුවත් මා නියෝජනය කළා. මා එතකොටත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළා. මා දැන් සිටින ළමයින්ගේ සාමාජිකත්වය අරගෙන මෙය ප්‍රවර්ධනය කරන්න. කොරෝනා ව්‍යාසනය නිසා මෙය කරගැනීමට අපහසු වුණා. මට තව මාස දෙකක් කල් දෙන්න. මා මේ පුස්තකාලය වසන්න දෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ටික කාලයකට කල් දී මෙය බලන්න. අපි ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ මන්ත්‍රිවරු තිදෙනා මේ වගකීම ගන්නවා නම් අපි මෙය තව මාස තුනකට ක්‍රියාත්මක නොකර සිටින්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාත් අදහස් දක්වන්නේ මෙය අතහැර දමන්න නෙමේ. කට්ටිය අරගෙන මෙය ප්‍රවර්ධනය කර කළ යුතුයි. මෙය අතහැර දැමීම අපරාදේ. එක්කෙනා දෙන්නා හරි එකට අරගෙන මේ අයට සහායෝගය දිලා පුළුවන්තරම් වහන්නේ නැතුව ඉදිරියට ගෙනයා යුතුයි. අපේ අවශ්‍යතාවය ඒක. ඒවා අඩුකරගෙන අඩුකරගෙන යන එකනෙමේ අපි කරන්න ඕන. අපි කරන්න ඕනේ තව ටිකක් වැඩියෙන් අරගෙන හරි ඒ අය ප්‍රවර්ධනය කරන්න ඕන. එකයි මගේ අදහස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

මොකද දැන් ඕකන්දෙත් ඔය කතන්දරය කලින් තිබුණා. පස්සේ අපි එය වර්ධනය කළා. මන්ත්‍රිවරුන්ට පුළුවන් එය වර්ධනය කරන්න. මේ මන්ත්‍රිවරු දෙපලට පුළුවන්. ඇත්තටම ගත්ත තින්දුව හොඳයි. අපි ඔබතුමන්ට ස්තූතිවන්ත වෙනවා ගත්ත තින්දුවට.

**තීරණය-**

හිරේවත්ත හා පෝරඹ ශාඛා පුස්තකාල වරුවක් වසා තැබීම සඳහා පුස්තකාලයාධිපතිතුමිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධව තවත් ඉදිරියට මාස 03 ක කාලයක් සලකා බැලීම සුදුසු බවට ගරු  සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

- ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු උප සභාපතිතුමා , ගරු රාහුල ලලිත වික්‍රම මහතා පස්වරු 04.10ට පමණ සභා ගර්භයෙන් පිටවීම

**03.05 තාක්ෂණසේවා නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති මානිමුල්ල වටරවුම පිළිබඳව ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී**

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ මානිම්මුල්ල වටරවුම් පාර මා හිතන්නේ ඔබතුමා සභාපති පුටුවේ සිටින කොට තමයි ඔය මානිම්මුල්ල වටරවුම්පාරේ හැරවුම් වෘත්තය සැදුවේ. දැන් තාක්ෂණික නිලධාරිතුමිය ගිහින් පිඹුරුපත ඉල්ලුවාම ඒ මිනිසුන් පිඹුරුපත නැහැ කියන්නේ ඇත්තේ අසත්‍යයක් වෙන්නැති එය වහගන්න. කෙසේ නමුත් දැන් ඔය මානිම්මුල්ල වටරවුමේ ආදර්ශ නිවාස යෝජනා ක්‍රමයේ සැලැස්ම ගෙන බැලුවාම වටරවුමක් නැහැ කියන්නේ ඊට පස්සේනේ ඔබතුමලා සැලසුම් කරලා හැදුවේ. ඒ කියන්නේ ඔය නිවාස දෙනකොට තිබුණේ නැහැ වටරවුමක්. හැරවුම් වෘත්තයක්. එය සැදුවේ ඔබතුමාගේ කාලයේ. එතකොට ඒ මැනුමේ මුල් පිඹුරේ නැතුව ඇති. දැන් කෙසේ නමුත් තාක්ෂණසේවා නිලධාරිතුමිය එතැන වටරවුමක් නැහැ කියා වාර්තාවක් එවා තිබෙනවා. කෙසේ නමුත් වහාම මැනුම් කටයුතු කර ඒ හැරවුම් වෘත්තය තිබූ ආකාරයට පත් කරන ලෙස ඉල්ලා සිටිනවා. කිසිම වාහනයක් ගිහින් හරවාගෙන එන්න විදියක් නැහැ. මොකද එතැන තිබෙනවා නිවාස 31කට වැඩියේ. ඒ 31 කට්ටිය එතනින් ගිහින් තමයි වාහන හරවා ගත යුතු වන්නේ. එමනිසා ඉතා ඉක්මනින් එම හැරවුම් වෘත්තයේ වැඩකටයුතු නිම කර දෙන්න. ඒ තිබුණ ආකාරයට ස්ථාපනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මි මන්ත්‍රීතුමිය කිවූ පරිදි ඇත්තටම ඔබතුමා දන්නවා මේ නිවාස යෝජනා ක්‍රමය රජයෙන් සාදන ලද නිවාස යෝජනා ක්‍රමයකි. එහෙමනම් ඒ නිවාස යෝජනා ක්‍රමය ජනතා අයිතියට පවරන කොට ඒ වගේ මිනුම් සභාවට ලැබිලා තිබෙනවා. පසුගිය කාලයේ ඔය දේ සාර්ථක කරන්න ජනතාවට පොරොන්දු වුණා. ඒ දේ කරලා දෙනවා කියා. ඔබතුමාගේ පාර්ශිකයන්. ජේමතිස්ස මහතා ඔබතුමාගෙන් ඉල්ලන කොට ඔබතුමා එය කරනවා කිවුවා. වාහනයක් ගියාම එන්නේ රිවස් එකේ. හරිම අවදානම් තත්ත්වයක් . අපි එහි යන නිසා අපිට ඒ බව පෙනෙනවා. ජනතාව ගොඩක් දුෂ්කරතාවයකට පත් වෙනවා. වාහනයක් ගියාම. ඔබතුමා ඇත්තටම එයට මැදිහත්වෙලා ඒ සඳහා ජනතාවගේ අවශ්‍යතාවය වන ඒ හැරවුම් වෘත්තය සකසා දෙන ලෙසයි. ඔබතුමා දන්නවා ඒ ප්‍රදේශය තිබුණේ කොහොමද කියන එක. මොකද සභාපතිවෙලා හිටිය කාලයේ නිතරම ඔය ප්‍රදේශය නිතරම අවධානය යොමු වූ ප්‍රදේශයකි. එමනිසා මේ සඳහා මැදිහත්වෙලා එම කාර්ය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

- ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා හා ශ්‍රේෂන් කෙරමිණියගේ පස්වරු 4.15ට පමණ නැවත සභා ගර්භයට පැමිණීම.

**තීරණය-**

මානිමුල්ල වටරවුම පිළිබඳව  තාක්ෂණ සේවා නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින්  ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**03.06 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ ඇති පවත්නා ක්‍රීඩාගාරයේ පවතින දොර ජනෙල් හා උළුවහුවල සිදුකළ යුතු අලුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගණයේ ඇති ක්‍රිඩාගාරයේ දොර ජනෙල් හා උළුවහු වල සිදුකළ යුතු අලුත්වැඩයාවන් නගර සභා වඩු කාර්මික ශිල්පියා මඟින් ඉටුකරවීම සඳහා අවශ්‍ය වන ලී දඬු හා දැව ලී ඉල්ලා ඇත. එය ලබා දීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. නගර සභාවේම සේවකයෙකු ලවා කර ගන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ස්තුති වන්ත විය යුතුයි. මෙයට අපේ කර්මාන්ත අංශයේ සේවකයන් ඉටු කරන කාර්ය.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රිතුමා මෙයට අනුමැතිය ලබා දෙන්න. කතා කරන්න දෙයක් නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්**

ඒය ලබා දෙන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ ඇති පවත්නා ක්‍රීඩාගාරයේ පවතින දොර ජනෙල් හා උළුවහුවල සිදුකළ යුතු අලුත්වැඩියාවන් සිදුකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| 01. | 1  1/8“ සනකම 9” පළල ලෑලි අඩි 07 දිග | = 08 |
| 02. | 1  1/8“ සනකම 9” පළල ලෑලි අඩි 03 දිග | = 04 |
| 03. | 2”x4“  දිග අඩි 08 | = 02 |
| 04. | 3”x4“  දිග අඩි 3 1/2 | = 02 |
| 05. | 3”x4“  දිග අඩි 03 | = 01 |
| 06. | 3”x4“  දිග අඩි 07 | = 02 |
| 07. | 1”x4“  රේගල් දිග අඩි 04 | = 04 |
| 08. | 1”x4“  රේගල් දිග අඩි 02 | = 04 |
| 09. | දොර ලොක් (අඟුලු) | =03 |
| 10. | පිත්තල සරණේරු 2  1/2”x4“ | =10 |
| 11. | පිත්තල පැනල් පින්ස් | =100g |
| 12. | වීදුරු කෝටු | =අඩි 100 යි |
| 13. | ජනෙල් වීදුරු 13  3/8”x12  3/8“  කෑලි | =10 යි |
| 14. | එත්ෆික්ස් ලී අලවන ගම් 500 ml gska | =02 |

| | | |
|---|---|---|
| 15. | එනමල් තීන්ත | =ලීටර් 02 |

**03.07 වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය කිරීම යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමිය වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය කිරීම. උක්ත කරුණ සම්බන්ධයෙන් අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් එවන ලද අංක DSG/LND/AGR/02 හා 2020.10.20 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව ග්‍රාමිය කුඹුරු හා අශ්‍රිත වැව් ජලාශ හා වාරි මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් අතිරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ කුඩා වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝජනා යොමු කරන ලෙස දන්වවා ඇත. මිට අමතරව 2021/2022 වාරි මාර්ග සැලැස්ම සඳහා ගොවිජන සේවා මට්ටමින් ලබා ගන්නා ලද වාරි ප්‍රතිසංස්කරණ යෝජනා ද ඔබගේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරමි. එම යෝජනා වලට අමතරව මෙම වැඩසටහනට ඇතුලත කළ යුතු වෙනත් යෝජනා පවතී නම් නගර සභාවට අදාල මහජන නියෝජිතයන් දැනුවත් කර 2020.10.29 දිනට පෙර එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටි බව පවසා ලිපියක් එවා තිබෙනවා. ඒ අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අම්බලන්ගොඩට අදාල තල්ගස්ගොඩ දළුක්කන්ද සිමාවේ පවතින සුදුවැල්ල ඇළට සම්බන්ධව වන අතුරු ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම. තල්ගස්ගොඩ ඩී ග්‍රාමසේවා කොට්ඨාශය. නිව්යෝර්ක් ගම්මානය ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රම වලින් කුඹුරු වලට බැහැරවන අපද්‍රව්‍ය ඉවත් කිරිමට ක්‍රමවේදයක් සැකසීම සහ ඇළේ රොන් මඩ ඉවත් කර පිටුවාන පළල් කිරිම. සුදුවැල්ල ඇළට සම්බන්ධවන ඇළ මාර්ගය පිටුවාන නිව්යෝරක් ගම්මානය දක්වා සකස් කිරිම. තල්ගස්ගොඩ ගම්මානය. පනියන්දුව කන්නගග්ගර ඇළ ප්‍රතිසංස්කරණය කිරිම. අංක 84ඒ පනියන්දුව, සුදුවැල්ල ඇළ ප්‍රතිසංස්කරණය කිරිම 86ඩී තල්ගස්ගොඩ, පොරුක් ඇළ ප්‍රතිසංස්කරණය කිරිම 84 විලේගොඩ, පින්නදූව කෙරමිණිය ඇළ ප්‍රතිසංස්කරණය කිරිම . 86බී කෙරමිණිය. කළුවඩුමුල්ල සතිපොළ පාර පැතිබැම්ම බැඳ ප්‍රතිසංස්කරණය කිරිම. 86 ඒ කළුවඩුමුල්ල කියන යෝජනා එවා තිබෙනවා. මිට අමතරව ඇතුළත් විය යුතු යෝජනා තිබෙනවා නම් ඉදිරිපත් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, චම්පා මැතිණියත් දන්නවා. පින්නදූව විහාරස්ථානයට ආසන්නයේ එකල තිබුණා වැවක් . මේ වාරි සෞභාග්‍ය කිවුවාම ඇළවල් නෙමේ. වැව් විය යුතුයි. අන්න ඒ නිසා අපේ අන්න ඒ වැව කපා ගැනීමට හැකියාවක් තිබෙනවා ද ? වාරි සෞභාග්‍ය යටතේ

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

යෝජනා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

කෙරමිණිය පින්නදූව වැසියන් පවුල් 50 කට 60කට වැඩියේ යටවෙලා සහන බෙදන්නට අපිට සිදු වෙනවා. මේ සහන දීම නිසා නෙමේ අපි කියන්නේ ඔවුන් මහ විපතකටයි මුහුණ පා තිබෙන්නේ. මේ වාර්ෂා ජලය එකරාශී කිරිම සඳහා වැවක් මිට පෙර තිබුණා ප්‍රතිනිර්මාණය කරලා. එම වැව නැවත නවීකරණය කර දෙන ලෙස මේ අවස්ථාවේ මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කෙරමිණිය පින්නදූව ඇළට හා එම ජලාශය ප්‍රතිසංස්කරණය කිරිම හා යන යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ඒ යෝජනාවල් ඇතුළටම යාලදූව ප්‍රදේශයේ  අර විලේගොඩ කොට්ඨාශයේ ඇළ මේවා කරන කොට තව කොටසක් ඉතිරි වෙලා තිබෙනවා. යහලදූවට වෙනකම් ඒ කොටස. තුඩුවමුල්ල ප්‍රදේශයේ ඇළත් එකතු කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කන්නගගර ඇළ කියන්නේ එකනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

නැහැ පනියන්දූව ඇළ කියන්නේ එක නෙමේ. ඊට මෙහා තිබෙනවා තව ඇළවල් දෙකක්. චමින්දලා කියා ඉන්නේ කට්ටියක්. අන්න ඒ අයගේ නිවස අසළ. ඔබතුමාගේ මල්ලිගේ හෝටලයේ වැඩ කරන විදුලි වැඩ කරන කෙනෙක් ඉන්නේ . අන්න ඒ අයගේ නිවස අසළ.තුඩුවමුල්ලේ අපේ තරංගනී මහත්මියගේ අම්මලාගේ නිවස තිබෙන පාරේ ඇති ඇළ.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, 86 සි පෝරඹ ග්‍රාමසේවා වසමේ ඔබතුමා නගර සභාවෙන් හදපු මුත්තයියා ඇළ . උස්සා හැදුවා . එම මුත්තයියා ඇළේ වතුර ධාරිතාව වැඩිවෙනකොට ගංවතුර එනවා පහත්බිම් නිසා. තටාකයක් හදලා තිබුණා. එම තටාකය සාදා ගැනීම සඳහා මුත්තයියා ඇළේ රොන්මඩ හිරවෙලා තිබෙනවා. එය ලොකු වැදගත් දෙයක් පෝරඹ කොට්ඨාශයට. මා යෝජනා කළා. එය දමා තිබුණේ නැහැ එකට. තටාකයට වැටෙන්න ඒ ඇළේ තිබෙන දිගටම රොන්මඩ ඉවත් කරලා ඇළ සංරක්ෂණය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තල්ගස්ගොඩ කියවුණා මා හිතන්නේ . නිව්යෝක් ගම්මානයේ දෙකක් කියවුණා. විශේෂයෙන්ම කෙරෙන්න ඕනේ ටි.එච්.ඩබ් නිවාස යෝජනා ක්‍රමයේ අර දළුක්කන්ද පැත්තට යන ඇළ

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එකේ යෝජනාව තිබෙනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එක ඔකේ නැහැ. එහි තිබුණේ නිව්යෝර්ක් ගම්මානයේ කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේකේ තිබෙනවා. තල්ගස්ගොඩ දළුක්කන්ද සීමාවේ සුදුවැල්ල ඇළට සම්බන්ධවන අතුරු මාර්ගයේ ඇළ ප්‍රතිසංස්කරණය කිරිම. නිව්යෝර්ක් ගම්මානය හා ධම්මිකපුර නිවාස වලින් කුඹුරු වලට බැහැරවන අපද්‍රව්‍ය ඉවත් කිරිම. යන දෙකම තිබෙනවා. නිව්යෝර්ක් ගම්මානයයි ධම්මිකපුරයි දෙපැත්තක්. එහි රොන්මඩ ඉවත් කිරිම. පිටවාන සකස් කිරිම. සුදුවැල්ල ඇළට සම්බන්ධ වන අතුරු මාර්ගයේ පිටුවාන නිව්යෝර්ක් ගම්මානය දක්වා  සකස් කිරිම. තව එකක් තිබෙනවා. සුදුවැල්ල ඇළ ප්‍රතිසංස්කරණය කිරිම.

- ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය හා ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  පස්වරු 4.30ට පමණ සභා ගර්භයෙන් පිටවීම

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, හල්වතුරේ විලේගොඩ කොටස විතරයි දමා තිබෙන්නේ. එතකොට කරිත්ත කන්ද කොටසත් නැහැ. කළුවඩුමුල්ල කොටසත් නැහැ. කළුවඩුමුල්ල කොටස කියන්නේ ඕකන්දෙන් එන විශාල ජල ධාරාව එතනින් බැහැලා මාර්ග සති පාර දිගේ නැවත පොරුක් ඇළේ කරිත්ත කන්ද වසම හරහා තමයි විලේගොඩ ඇළට සම්බන්ධ වෙන්නේ. ඒ ප්‍රධානම දේ මග හැරිලා . අර ඇළ ඇත්තටම සංවර්ධනය කරලා තිබෙන විදියට අර මාර්ග සති පාරේ සිට එන ඇළ . ඇළවත් නැහැ. එමනිසා එතැන පඤ්ඤාලෝක පටුමගේ සිට ඒ කියන්නේ ඕකන්දේ සිට එන එම කාණුව පොරුක් ඇළ දක්වා සංවර්ධනය විය යුතුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් මේ අපි මන්ත්‍රීවරු හැටියට එක එක යෝජනා කරනවා. මෙතනින් වැවක් හදන්න මෙහෙන් වැවක් හදන්න. මා එය හෙලා දකිනවා නෙමේ. නමුත් ඇත්තටම අපිට විද්‍යාත්මක අවබෝධයක් නැහැනේ. මේ වැව හදන්න ඔනේ කොතනද ? හදන්න ඕනේ නැත්තේ කොතනද කියා. ඉතිං ඔබතුමා අපි කියන එකට හරි මා එය හදන්නම් කියා කියනවා. එහෙම නෙමේ මේ පිළිබඳ විද්‍යාත්මක දැනීමක් තිබෙන පිරිස් මේ රටේ ඉන්නවා. තාක්ෂණික අවබෝධයක් තිබෙන කට්ටිය. අපි කියනවා. ඔබතුමා අනුමත කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි කියන්නේ. මහජන නියෝජිතයන් වශයෙන් අපිට යෝජනා තිබෙනවා නම් තාක්ෂණික දැනුම තිබෙන පුද්ගලයන්ට එවන්න. එගොල්ලන් තක්සේරු කරයි. එතකොට අපි කියන හැමදේම කරන්නේ නැහැ. අවශ්‍ය නම් විතරක් කරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා කියන්නේ තල්ගස්ගොඩ වෙල්යායම ගත්තාම ඒක තමයි වැව. වැහි කාලයේදි එම යායම පිරෙනවා. එය පිරුණාම පසු තමයි මේ අපේ පින්නදූව ගෙවල් වලට වතුර එන්නේ. එතකොට මට තෙරෙන්නේ නැහැ මේ වෙල් යායේ වැවක් හැරුවාම කොහොමද මේ වතුර එන එක නවතින්නේ කියා. මට එතැන විද්‍යාත්මක පැහැදිලි කිරිමක් නැහැ. ඔබතුමාට තෙරෙනවා ඇති මා කියන කතාව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ප්‍රශ්නයට පිළිතුරු චම්පා මහත්මිය දෙනවා ඇති. මොකද ස්පීර කලේ එතුමිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ ඔය මහේන්ද්‍රාරාම පිටුපස තිබෙන්නේ වැවක් නෙමේ. ඇළක් එහි ඉදුරු වැවිලා අපිම එහි බැස මේවා සුද්ද කර තිබෙනවා . වැවක් නෙමේ. ඇළත් එක්ක සම්බන්ධතාවයක් තිබෙන ප්‍රදේශයක්. එතැන වැවක් හැදෙන්නේ නැහැ සරත් මන්ත්‍රීතුමා. අන්න ඒ ටික පවිත්‍ර කර දෙන්න කියන යෝජනාව තමයි ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කළේ. එතකොට එක තමයි මා ස්පීර කළේ. අර විහාරස්ථානය පිටුපස එක පවිත්‍ර කරන්න ඕනේ. ඒවා ගලවන්න ඕන. එතනයි තිබෙන්නේ. එමනිසා එතන ජලය රැදි පවතිනවා. ඒ යෝජනාව තමයි මා ස්පීර කළේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනා ලේකම්තුමිය හෙට දිනයේම ප්‍රදේශිය ලේකම්තුමියට යවන්න මේ මන්ත්‍රීවරු යොමු කරන ලද යෝජනා ටික.

**තීරණය-**

**වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතින්ට අනුව ප්‍රතිසංස්කරණය කිරීම** යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය අනුව ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා ද අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

| අනු අංකය | යෝජනාව | යෝජනා කිරීම සහ යෝජනාව ස්පීර කිරීම |
|---|---|---|
| 01 | පින්නදූව, කෙරමිණිය වැව හා | යෝජනාව - ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් |

| | | |
|---|---|---|
| | ඇළ ප්‍රතිසංස්කරණය කිරීම. | කෙරමිණියගේ මහතා<br>ස්ථිර කිරීම - ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය |
| 02 | තුඩුවමුල්ල අතුරු මාර්ගයේ චමින්ද මහතාගේ නිවස අසල ඇති ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | යෝජනාව - ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය<br>ස්ථිර කිරීම - ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |
| 03 | පෝරඹ , රණසූරිය පාරෙහි මුත්තයියා ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | යෝජනාව - ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br>ස්ථිර කිරීම - ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |

## 03.08 ත්‍රීරෝද රථ කමිටුවට නව සභාපතිවරයෙකු පත්කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ත්‍රීරෝද රථ කමිටුවවේ සභාපති වශයෙන් කටයුතු කරන ලද ගරු උප සභාපතිතුමා ඉවත් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් නව සභාපතිවරයෙකු පත්කරන ලෙස ඉල්ලීමක් තිබෙනවා. ඒ සඳහා වැඩ කිරිමට මා එම කාර්ය කිරිමට භාර ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

අපි සතුටු වෙනවා ගරු සභාපතිතුමා එය භාර ගැනීම සම්බන්ධව. හොඳයි සභාපතිතුමා පත්කරන එක.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින**

ඕන නම් නිලානි නෝනාට දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

අපි ඔබතුමා යෝජනා කරන්න හිටියේ කොහොමත්.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම මෙය කාටද දෙන්නේ කියා අපි තරඟ කරන්න ඕනේ නැහැ. මා එය භාර ගන්නම්. මා මාගේ වගකීම තමයි මෙතෙක් කල් උප සභාපතිතුමාට භාර දී තිබුණේ. උප සභාපතිතුමා එය මැනවින් ඉටු කළා. අපි ඒ ගැන ස්තුති වන්ත වෙනවා. එතුමාට මෙය භාර දෙන දවසේත් මා කිවුවා මෙය භාර දෙන්නේ මේ හේතුව මතයි. ඒ හේතුව මත අද එතුමා යම්කිසි පීඩනයකට ලක්වෙලා තිබෙන නිසා එක මම භාර ගෙන කරන්නම්. ප්‍රශ්නයක් නැහැ.

**තීරණය-**

අම්බලන්ගොඩ රථවාහන හා ත්‍රීරෝද රථ කමිටුවට නව සභාපතිවරයෙකු පත්කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම සභාපති ධූරය තමා භාරගන්නා බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

- ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා පස්වරු 4.35ට පමණ නැවත සභා ගර්භයට පැමිණීම.

**03.09 අංක 252 -0730 දරණ කැබ් රථය සම්බන්ධව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අංක 252 -0730 දරණ කැබ් රථය සම්බන්ධව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එවා ඇති ලිපිය ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිට විස්තරය පොඩ්ඩක් ඕකේ දැන ගන්න ඕනේ. කොහේ යද්දිද වුණේ. කොමද ඕක වුණේ. රියදුරු මහතා කවුද ? පොඩ්ඩක් අපිට විස්තර දැන ගන්න ඕනේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා ඉල්ලීමක් කරනවා. රක්ෂණ සමාගමකට මේ වගේ තීන්දුවක් ගන්න බැහැ. රක්ෂණයක් කරලා තිබෙනවා නම් එහෙම තීන්දුවක් ගන්න පුළුවන්. එහෙමනම් රක්ෂණය කරන්න ඕනේ නැහැනේ වාහනයක්. එහෙම කරලා තිබේද්දි එහෙම තීන්දු ගන්න බැහැ. මා යෝජනා කරනවා. මා හිතන්නේ අම්බලන්ගොඩින් තමයි මෙය ප්‍රතික්ෂේප කර එවන්න ඇත්තේ. මෙය රක්ෂණ සංස්ථාවේ සභාපතිතුමාට හරි ලියන්න. මෙන්න මෙහෙම තත්ත්වයක් තිබෙනවා. මොකද මටත් ඔය වගේ සිද්ධියක් වුණා. මාගේ වාහනයක් ( ට්‍රිපර් රථයක් ) ගිහින් ඒ වගේ ගෙවන්න බැහැ කිව්වා. මා දිගින් දිගටම කතා කරනකොට අන්තිමට මට ඉල්ලීමක් කරන්න කිව්වා. එම ඉල්ලීම කළාට පසු එම ඇස්තමේන්තුවෙන් පොඩි ගණනක් අඩු කරලා මට ගෙව්වා. මට රු.190,000/= ක් තිබුණා. මට පොඩි ගණනක් අඩු කරලා එම ගෙවීම කළා. බැහැයි කිව්වාට මෙහි හේතුව විමසලා මෙයට ලිඛිතව නැවත වරක් ඉල්ලීමක් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා ඉල්ලීමක් අපි ගරු සභාපතිතුමා ලව්වා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි කිව්වේ අපිට මෙහි විස්තරය දැන ගන්න ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයාට දැන ගන්න ඕනේ නම් රියදුරු මහතා හමු වී දැන ගන්න. ඔහු මේ සභාවට කැඳවන්න අවශ්‍ය නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි ගෙවීම් වලට විරුද්ධ වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාම විමසීමක් පමණයි කරන්නේ.

- ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය පස්වරු 4.40ට පමණ නැවත සභා ගර්භයට පැමිණීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , දැන් ඒ කැබ් රථයේ ලොක් එක නැතුව යන්න බැහැනේ. එකට අපි ගන්න පියවර මොකක්ද ? වාහනය අත්‍යවශ්‍යයි සේවයට. එය හදන්නේ නැතුව යන්න බැහැ. එය හැදුවාද? එකට අනුමැතිය ගන්න ඕනේ සභාවෙන්. රක්ෂණ මුදල් ගෙවීමට යටත්ව අනුමැතිය ගන්න. නැතිනම් අධිවේගී මාර්ගයේ යන්න බැහැ.කොහොමත් යන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය තමයි එය පාවිච්චි කරන්නේ. මොකක්ද එහි වෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එහි ලොක් එක සවි කරගන්න. සභාවේ ආවරණ අනුමැතියට යටත්ව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කාලයක් යද්දි මේවා ගෙවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගෙවුනාට පසු ඇරෙනවා. අලුතෙන්ම ලොක් එක දමන්න ඕනේ. නැතිනම් මැනුවෙල් හදන්න ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ඉංජිනේරු මහතා කියා තිබෙන්නේ අලුතෙන් එකක් දමන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එහි ලොක් එක දමන්න . ආවරණ අනුමැතියට යටත්ව. අපි අනුමැතිය දෙන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ලොක් එක දමා ගන්න. නැතිනම් ඔබතුමිය අනතුරේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් අලුතෙන් එකක් ගන්න.

**තීරණය-**

අංක 252 -0730 දරණ කැබ් රථයේ බොනට් ලොක් එක ගැලවී යාම සම්බන්ධව රථවාහන රක්ෂණ ඔප්පුවෙන් ආවරණය නොවන බැවින් හිමිකම් ලබාදිය නොහැකි බවට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය වෙතින් දැන්වූවද නැවත මේ සම්බන්ධව ඉල්ලීමක් කරන ලෙසත් , එතෙක් කැබ් රථය භාවිත කිරීම සඳහා නව බොනට් ලොක් එකක් සවිකිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.10 ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්ථාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධව පුරාවිද්‍යා දෙපරේතමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්ථාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධව . මෙයට අපි තින්දුව ගත්තා මෙය පවරන්න බැහැ කියා. ඊට පස්සේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ලංකා රියැලිටි සමාගමට දන්වලා තිබෙනවා. ඒ කොටස බදු දිම සඳහා ඒ අය කැමතියි කියා. ඒ අනුව අපේ එකඟතාවය අසා තිබෙනවා. එම සමාගමට බදු දිමට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක කරන්න එපා. මොකද මේ අපේ ළමයෙකුට හරි ඕක බලන්න තිබෙන්න ඕන. ඒ සමාගමට දුන්නා කියන්නේ . ආපහු ඒ සමාගමෙන් අවසර අරගෙන තමයි ළමයෙකුට හරි බලන්න යන්න වෙන්නේ. එමනිසා මෙය නගර සභාව සතුව තියෙන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉපැරණි ඕලන්ද ස්තාල ගොඩනැගිල්ල යෝජිත සංවර්ධන ව්‍යාපෘතියේ පැරණි ගොඩනැගිල්ලක් එහි සංරක්ෂණ කටයුතු සඳහා වැයවන ප්‍රතිපාදන යෝජක ව්‍යාපෘති විසින් දැරිමට කැමැත්ත පළ කර ඇති බැවින් ඒ සඳහා පහත සඳහන් යෝජනා හා කොන්දේසි ඉදිරිපත් කර ඇත.

01)මෙම ගෙඩනැඟිලි සංකිර්ණයට අයිති ප්‍රදේශයට ආවේණික කළා, බිරළු වෙස්මුහුණු , අත්කම් හෝ වෙදකම් යොදා ගනිමින් පසු භාවිතය යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරයි.

02)එම භාවිතය මඟින් ගොඩනැඟිල්ල නඩත්තු කර පවත්වාගෙන යාමට හැකිවන පරිදි භාවිතා කිරිම.

03)ගොඩනැඟිල්ලේ බාහිර ස්වරුපය වෙනස් නොවිම.

04)තාවකාලිකව හෝ ස්ථිර ඉදිකිරිමක් නොකළ යුතුය.

05)ප්‍රදර්ශනය ආදිය ගොඩනැඟිල්ලෙන් පිටත ප්‍රදර්ශනය නොකිරිම.

06)ඇතුළත ගැලවිය හැකි පරිදි විභේදන කිරිම සඳහා ඉඩ ලබා දිය හැක. යන කරුණු මත දෙන්න පුළුවන් කියා පුරා විද්‍යා අධ්‍යක්ෂක ජනරාල් කියනවා.

දැන් මෙය මා සභාවට ඉදිරිපත් කළේ මා මෙය ඇත්ත වශයෙන්ම මෙය සභාව සතු දේපලක් . සභාව ඇත්තටම මෙය තාම පුරා විද්‍යාත්මක දෙපාර්තමේන්තුවට පවරා නැහැ. ඒ නිසා මේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව දැන් යෝජනා කරනවා එ අයට මෙය බදු දෙන්න. අපේ දේපල . මෙවැනි අවස්ථාවේදි අපි ගත යුතු පියවර මොකක් ද කියා මා සභාවෙන් විමසා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙය දෙන්න එපා. හේතුව මෙය නගර සභාව සතු දේපලක්. අපි ඒ සමාගමට දැන් පවරා තිබෙනවා කොටසක් . දිගින් දිගටම පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කියන්නෙත් මෙය සංවර්ධනය කරනවා. මෙයට මොකුත් කරන්න එපා කියා. නමුත් ඕක ඔය විදියට තියෙන්න හරින්න. ඒ ආයතනයට ඕන නම් නගර සභාවට බද්දක් අයවන ක්‍රමයට යන්න පුළුවන් නම් දෙන්න. නැතුව මෙය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවටත් පවරා ඒ අය මේගොල්ලන්ට බදු දිලා අපි නිකං පැත්තකට විසි වෙනවා. දැන් අපි මේක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පවරනවා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් බදු දෙනවා අර සමාගමට අදාල . එතකොට ඒ සමාගමයි පුරා විද්‍යා එකයි එක්ක තමයි මෙහි සම්බන්ධකම් තිබෙන්නේ. සභාව පැත්තකට යනවා. එමනිසා මා ඉල්ලිමක් කරනවා. මෙය ඓතිහාසික ස්ථානයක්. අම්බලන්ගොඩ නගරයට තිබෙන උරුමයක්. එමනිසා මෙය නැති කරන්න එපා. මෙය නගර සභාවේ මේ දේපල නැති කරන්න එපා. මොකද මෙය අපේ ළමයෙකුට හෝ බලන්න තිබෙන ස්ථානයක්. එමනිසා මෙය බදු දුන්නොත් එහෙම ඒ ආයතනයෙන් අවසර අරගෙන තමයි ළමයෙකුට හරි ඇතුල් වෙන්න වෙන්නේ. දැනටත් තිබෙනවා එම ස්ථානයට ඇතුළු වන තැනක්. මා දන්නා තරමට. ඕක නගර සභාව සතුව තියෙන්න හරින්න. කිසිම බදු දිමක් සිදු කරන්න එපා. මා කියන්නේ මගේ අදහස.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ ස්ථානය පිළිබඳ ප්‍රශ්නය කතා කරන කොට . දැන් අපි නගර සභා තානයම් භූමිය බදු දි ප්‍රශ්න ගණනාවකට මුහුණ දි තිබෙන්නේ. එගොල්ලන් අපිට බද්දක් ගෙවන

බව ඇත්ත. නමුත් එදා සිට මේ දක්වා ගඩොල් කැටයක් තියා බැම්මක්වත් බැඳ නැහැ. ඔය කියන ආකාරයේ අත්කම් නිෂ්පාදන ඔය කියන සුන්දර කතා ඔබතුමා හිතනවාද මේවා ඉෂ්ඨ වෙයි කියා. මේවා අරගෙන කිසිම ඉදිකිරිමක් තවම කර නැහැ. අපිට කියනවා සැලසුම අනුමත කර ගන්න මෙච්චර කාලයක් ගත වෙනවා කියා. මා දන්නේ නැහැ වසර කිහිපයක් ගත වුණා. අද වෙනකම් ගඩොලක් තියා සිමෙන්ති ටිකක් දමා නැහැ. එවැනි තත්ත්වයක් යටතේ මේ කියන ස්තාලයත් බාර දෙනවා ඔය කියන සුන්දර කතා වලට කරාවි කියන බලාපොරෝත්තුව නිසා. මේ කියන කිසි දෙයක් වෙන්නේ නැහැ. මෙතැන මොකක් හරි යට කුමන්ත්‍රණයක් යන්නේ. එමනිසා අපි මේ සිද්ධියට විරුද්ධයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙහි මාරු කතාවක් යන්නේ. පුරා විද්‍යා ඕලන්ද ස්තාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධයෙන් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කිරිම. ඉතිං මේ අය ඉන්නේ මේවා ආරක්ෂා කරන්නනේ. දැන් මෙහෙම එකක් තිබෙනවා. පුරා විද්‍යා පණත ඉතා ප්‍රබලයි. නමුත් දැන් මේ කියන කතන්දරයට කොහේත්ම දෙන්න බැහැ. දෙන්න බැහැ කියන්නේ මේක පුද්ගලික තැනකට දුන්නායින් පසු ඒ පාර එන ප්‍රශ්න ගැටළු , ඒ ජනතාවගෙන් එන ප්‍රශ්න ගැටළු එක නිසා මෙහි ඉතා ප්‍රශ්න සහගත තත්ත්වයක් තිබෙන්නේ. මා හිතන්නේ අපි මෙය තියා ගන්නවා වගේම පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ලිපියක් යවන්න මෙය ආරක්ෂා කිරිම තමුන්නාසේලා සතුයි කියා. එමනිසා මෙය බදු දිම නෙමේ මෙය ආරක්ෂා විය යුතුයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඇවිත් මෙය ආරක්ෂා කිරිමේ කටයුතු කරන්න. අපේ කිසිම ගැටළුවක් නැහැ. මේ බදු දිමට කැමති වෙන්න එපා. මේ යන ලිපියත් සමඟ බැලුවාම.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සභාවේ තින්දුව දැනුම් දෙන්න.

**තීරණය-**

**ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්ථාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම** යන මැයෙන් 2020.09.11 දිනැති MAI/SP/1/1 අංක දරණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමකට හා බදු ගිවිසුමකට එකඟ විය නොහැකි බවට ගරු සභාව විසින් තීරණය කළ අතර ඒ බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.11 අම්බලන්ගොඩ නගර සභා ආපදා කමිටුවට සාමාජිකයන් නම් කිරීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ආපදා කමිටුවට සාමාජිකයන් නම් කිරීම. අම්බලන්ගොඩ නගර සභා ආපදා කමිටුවට සහභාගිවිය යුතු නිලධාරින් කවුරුද යන්න ඉල්ලා සිටි. ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රීතුමා දැනට පැමිණෙන්නේ නැති නිසා ඒ වෙනුවෙන් නාගරික මන්ත්‍රීවරයෙක් නම්කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්**</u>

අතුල මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ආපදා කමිටුවට සහභාගී විය යුතු නිලධාරීන් ලෙස ලේකම්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ සේවා නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ සෞඛ්‍ය හා කර්මාන්ත අංශයේ වැඩ පරිපාලක යන නිලධාරීන් නම් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් තීරණය කළ අතර ගරු නගර සභා මන්ත්‍රීවරයෙකු ලෙස එම්.අතුල ප්‍රියන්ත මහතා නම් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.12 නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීමේ අයදුම්පත්වලට අත්සන් ලබාගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීමේ අයදුම්පත්වලට අත්සන් ලබාගැනීම. අම්බලන්ගොඩ නගර සභාව 2021 වර්ෂය සඳහා නොමිලේ අභ්‍යාස පොත් ලබා දිමේ වැඩසටහන සඳහා ගා ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා ලබා දුන් දුරකථන ඇමතුම සම්බන්ධයෙනි. එතුමා සඳහන් කළේ අම්බලන්ගොඩ නගර සභාව මඟින් නොමිලේ අභ්‍යාස පොත් බෙදා දිමේ වැඩසටහන සම්බන්ධයෙන් මහජනතාවට දුන් අයදුම් පතෙහි විදුහල්පතිතුමාගේ අත්සන යෙදිම සඳමා එම අයදුම්පත් එකවර අත්සනට එවන ලෙසය. අම්බලන්ගොඩ නගර සභාව විසින් මේ සියළුම අයදුම්පත් නාගරික මන්ත්‍රීවරුන්ට යොමු කරන විට නගර වැසියන්ට අයදුම්පත් ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කිරිම සඳහා ධර්මාශොක විද්‍යාලයේ විදුහල්පතිතුමා කියා තිබෙනවා විදුහල්පතිතුමාගේ අත්සන නැති සියළුම අයදුම්පත් සියල්ල එතනට එවන්න . සැරින් සැරේ අද රටේ පවතින කොවිඩ් - 19 වසංගතය නිසා. ඒ අනුව කටයුතු කිරිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ධම්සෝ විදුහල්පතිවරයාගේ ඉල්ලිම අපි පිළිගන්නවා නම් යම් හෙයිකින් අපේ අනෙකුත් විදුහල් වල විදුහල්පතිවරුත් මුණ ගැසිමේ අපහසුතාවයක් තිබෙනවා. ඒ පාසැල් සම්බන්ධයෙනුත් යම් සහන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ධර්මාශෝකය කියා අමුතු විශේෂයකින් සලකන්න බැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා ධර්මශොකේ විදුහල්පතිතුමා ඉල්ලිමක් කර තිබෙනවා. අනිත් විදුහල්පතිවරු ඉල්ලිමක් කර නැහැ. අපි එහෙම අවශ්‍යතාවයක් වුණොත් යවන්නම් ඕනම විදුහල්පතිවරයෙකුටම. හැබැයි විදුහල්පතිතුමා , ග්‍රාම නිලධාරිතුමාගේ , මන්ත්‍රිවරයාගේ අත්සන නැති වුණොත් මේක දෙන්න බැරි වෙනවා. එක මතක තියා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

නැහැ සභාපතිතුමා, අපේ සෙසු විදුහල්පතිවරු කොපමණ අපහසුතා මැද වුවත් ඔවුන් අත්සන් කර එවනවා. එමනිසා අපි ඔවුන් ඇහයිය යුතුයි. එමනිසා ඒ පාසැල් දරුවන් ගැනත් අපි සැලකිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කිසිම මේකක් නැහැ. අත්සන් නොකර තිබුණොත් අපි එම විදුහල්වලට ඒවා යවන්නම්. හැබැයි ග්‍රාම නිලධාරි නම් අත්සන් කර තිබිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රායෝගික ගැටළුවක් තිබෙනවා. පසුගිය දිනවල විභාග පැවතුණා. හුගාක් දිනවල විදුහල්පතිතුමලා හිටියා. සමහර කොට්ඨාශවල සිටිනවා වෙනත් කොට්ඨාශ වලට යන ළමයින්. අපේ කොට්ඨාශයේ සිටිනවා වතුගෙදරට යන ළමුන්. විදුහල්පතිවරු නැහැ අත්සන් කරන්න. ප්‍රායෝගික ගැටළු තිබෙනවා. ඒවාට මොකක් ද දන්නේ නැහැ කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොහොම ගියත් මේ නිලධාරින් අත්සන් කිරිමකින් තොරව නිත්‍යානුකුලව ලබා දෙන්න බැහැ. මොකද මෙහි යම්කිසි විදියකට විගණන ප්‍රශ්න ඇති වුණොත් එහෙම ඒ වගේ වේලාවට ලේඛණය ඉදිරිපත් කිරිමේ හැකියාව තිබෙන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

11 වෙනිදාටනේ දමා තිබුණේ කාලය. දැන් පාසැල් ආරම්භ කරන කාලයක් තිබෙනවා නේ. ඔබතුමා මෙය දෙන්න හදන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය දෙන්න හදන්නේ ජනවාරි මාසයේ පාසැල් යන්න. ඉතිං ඒ වෙනකොට සම්පූර්ණ කර තිබුණොත් අපි දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මටත් කතා කරන්න තිබෙනවා. මා දැක්කා දැන්වීමක් ගසා තිබෙනවා. අපගේ ගරු සභාපතිතුමාගේ සංකල්පයක් අනුව පොත් ලබා දෙනවා කියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඒ සංකල්පය එතුමාගේ තමයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

මට කතා කරන්න දෙන්න ඔබතුමා. ඔබතුමා කැමති නැද්ද මේ මන්ත්‍රීවරු 21නාත් ගෙන මේ මන්ත්රිවරු 21නාගේ සංකල්පයක් කියා දමන්න. අපිටත් දෙන්න. ඔබතුමා කරන දෙයට අපිත් කොටස්කරුවන්. ඔබතුමා තනි ඒකාධිපති තීරණ ගන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අයදුම්පත් සියල්ලම ඔබතුමලා ආශ්‍රිතව බෙදා තිබෙන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමිය 97 මැද භාගයේ සභාව නියෝජනය කලානේ. එතකොටත් ඔය වගේ තමයි බෝඩ් එක ගැසුවේ . එතකොට කතා කළේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

එතකොටත් 98 ඔය යෝජනාව දමනකොට කාගේද කියා දන්නවා ඔය යෝජනාව. වාර්තා අරගෙන බලන්න ඕන. මා කතා කරනකොට ඔබතුමා විරුද්ධ වෙන්නේ. ඔබතුමා වෙනම කතා කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මුලාසනයට කතා කරන්න. අවශ්‍ය දෙය විතරක් කතා කරන්න. ඔන්න ඕක තමයි කියන්නේ. මෙන්න මේ පිටු දික් වෙන්නේ එක්කෙනෙක් කතා කරන කොට අනිත් එක්කෙනා කතා කරනවා. ඊළඟ එක්කෙනා අර දෙන්නාගේම ඒවා එකතු කරලා තුන්වෙනි කෙනා කතා කරනවා. දැන් ඔයා පස්වෙනියා විතර එකතු කරලාම කතා කරන්න. එතකොට මේවායේ ලියන්න බැරි වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමා , දැන් වැරැද්ද කළේ මාද ? උප සභාපතිතුමානේ. දැන් නැගිටලා මා කතා කරන එකට අවහිර කළේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක හරියට නොමේරූ දරු උපත් ඒකකය වගේ වෙන්න එපා. කතා කරන්න පුරුදු විදියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

එ හින්දා තමයි හොඳ විදියට දරු උපත් කරන්න කියන එක තමයි මාත් සභාවෙන් ඉලන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිනම් කරලා තිබෙනවා. තාම ඔයාට බැරි වුණාට.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව මගින් නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීමේ වැඩසටහන සම්බන්ධව මහජනතාව ලබාදුන් අයදුම්පත් ඒ ඒ පාසැල්වලට එකවර විදුහල්පතිතුමාගේ අත්සන ලබාගැනීම සඳහා යොමුකරන ලෙස අම්බලන්ගොඩ ගා/ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් කරන ලද ඉල්ලීම අනුව එලෙස කටයුතු කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

### 03.13 නගර සභා සේවක බී.එච්.චමින්ද සිසිර කුමාර මහතාට නව පාපැදියක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා සේවක බී.එච්.චමින්ද සිසිර කුමාර මහතාට නව පාපැදියක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. මා භාරයේ පවතින පාපැදිය භාර දී නව පාපැදියක් ලබා ගැනීම. දැනට මා භාරයේ පවතින පාපැදිය භාවිතයට නොහැකි තත්ත්වයේ පවතින බැවින් මා සතු පාපැදිය ගබඩාවට භාර දී ගබඩාවේ තිබෙන පාපැදිය ලබාදෙන ලෙස ඉල්ලිමක් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ඒක ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

යතුරු පැදියක් ලබා දෙන්න

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා සේවක බී.එච්.චමින්ද සිසිර කුමාර මහතා භාරයේ පවතින පාපැදිය භාවිත කළ නොහැකි තත්වයට පත්ව ඇති බැවින් නව පාපැදියක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඔහුට නව පාපැදියක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප්

මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.14 කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඉදිරිපත් කරනවා. මේ සියළුම අය එකතුවෙලා යෝජනා කරනවා.

(01)මේ යකඩ එකතු කර සියල්ලෙම ටෙන්ඩර් ලබා දෙන අවස්ථාවේ එම යකඩ කිලෝ ගණනට ටෙන්ඩර් ලබා ගන්නා පුද්ගලයා ඉදිරියේදි කිරා මැන ගණනය කළ යුතු බව.

(02) කාර්යාලිය පරිශ්‍රයේදි හා නගර සභා මහජන ක්‍රිඩාංගණයේ ඇති භාවිතයට ගත නොහැකි සියළු යකඩ එම ස්ථානයේ සිටම ටෙන්ඩර් කළ යුතු බව.

(03)එම ටෙන්ඩර් කමිටුව සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරින්ට අමතරව මහජන නියෝජිතයන් වශයෙන් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ අධීක්ෂණය යටතේ කරන්න කියා යෝජනා කරනවා. ඒ අනුව කටයුතු කරන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මං නැති වුණාට කමක් නැහැ ඕකට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කමක් නැහැ. ගියපාරත් රූපවාහිනියේ හිටියානේ.

**තීරණය-**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, පහත සඳහන් සමීක්ෂණ මණ්ඩල යෝජනා අනුව කටයුතු කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

<u>සමීක්ෂණ මණ්ඩල යෝජනා</u>

01. යකඩ ටෙන්ඩර් කිරීමේදී කිලෝ ග්‍රෑම් එකක මිල ගණන් ඉදිරිපත් කර ටෙන්ඩරය ලබාදෙන අවස්ථාවේ එම යකඩ කිලෝ ගණන ටෙන්ඩරය ලබාගන්නා පුද්ගලයා ඉදිරියේ කිරා ගණනය කළ යුතු බව.
02. කාර්යාලීය පරිශ්‍රයේ හා නගර සභා මහජන ක්‍රීඩාංගනය ඉදිරිපිට ඇති සියලුම භාවිතයට ගත නොහැකි යකඩ එම ස්ථානවලම තබා ටෙන්ඩර් කළ යුතු බව.

03. මෙම ටෙන්ඩර් කමිටුව සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ නිලධාරීන්ට අමතරව මහජන නියෝජිතයෙකු වශයෙන් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ අධීක්ෂණය ද ලබාගැනීම සුදුසු බව.

**03.15 කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අපහරණ මණ්ඩලය පත්කිරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමික්ෂණ මණ්ඩලයක් පත් කිරිම. කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අපහරණ මණ්ඩලය වශයෙන් විශේෂ සමික්ෂණ මණ්ඩලය සඳහා පත් කළ නිලධාරින්ම පත් කරන ලෙස 2020.10.26 දිනැති කළමනාකරණ කමිටු තීරණය කරන ලදී. ඒ අනුව එම මණ්ඩලයේ නිලධාරින් වන එස්.රේණුකා නිලන්ති - සභාපති ,හර්ෂණ නිලමුනි - සාමාජික , ප්‍රභාවි නානායක්කාර මිය - සාමාජික,රජිතා ක්‍රිෂාන්ති - සාමාජික , ටී වන්න - සාමාජික , නාගරික මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා, නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා මේ සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා සභාවේ.

**තීරණය-**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අපහරණ මණ්ඩලය ලෙස එස්.රේණුකා නිලන්ති සිල්වා මහත්මිය, හර්ෂණ නීලමුණි මහතා, ප්‍රභාවි නානායක්කාර මහත්මිය, රජිතා ක්‍රිෂාන්ති මහත්මිය, ටී.වන්න මහතා, ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා පත්කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.16 අම්බලන්ගොඩ,මෝදර දේවාල පාර හෝටල් ව්‍යාපෘතියේ ඉදිකිරීම සම්බන්ධ ප්‍රගති වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ,තනායම ඉදිකිරිම සම්බන්ධයෙන් . දැනට ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු මෙහි තිබෙනවා. දැනට ඉදිරිපත් කර තිබෙනවා. Preliminary Planning Clearance කර තිබෙනවා 2020.02.05 , Survey Plan Approval 2020.06.23 දි තිබෙනවා. Electricity Clearance 2020.08.28 දි තිබෙනවා. Water Clearance 2020.08.06 දි තිබෙනවා. Fire Clearance 2020.08.12 දි තිබෙනවා. Archeological Clearance 2020.08.06දි තිබෙනවා. Solid Waste Clearance එක ලැබිය යුතුව තිබෙනවා. Coastal Conservation Clearance එක ලැබිය යුතුව තිබෙනවා Central Environmental Clearance එක ලැබිය යුතුව තිබෙනවා . PPC Approval of Sri Lank Tourism Development Authority එක 2020.10.07 දින ලැබි තිබෙනවා. ඒ අනුව ගතයුතු වාර්තා 10න් 07ක් ලබා ගෙන තිබෙනවා. දැනට මේ තමයි ඉදිරිපත් කර ඇති වාර්තාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , දැන් මෙහි කාලය අවසන් නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාලය ඉවර නැහැ. කාලය තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

මාස හයකට කල් දුන්නා. එමනිසා එගොල්ලන්ගෙන් අහන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මන්ත්‍රීතුමා මේක මතක තියා ගන්න. සංචාරක ව්‍යාපාරය කියන්නේ දැන් සම්පූර්ණම වැටිච්ච අවස්ථාවක්. මේක නැවත ටෙන්ඩර් කළහොත් මේක රු.25000/= කටවත් යන්නේ නැහැ. එක තේරුම් ගන්න. එමනිසා මේ අනුව පවත්වගෙන යාම සුදුසුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

පවත්වාගෙන යන්නේ කොයි කාලයකට කියා ඒ අයගෙන් අහන්න. මොනවා කළත් මෙය හදන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සමාගමට දන්වා තිබෙනවා දැනට සියළුම මන්ත්‍රීවරු සමඟ කෙරිච්ච වැඩ ඉදිරියට කරන වැඩ මොන විදියේ වැඩද කියන එක සියළුම මන්ත්‍රීවරු දැනුවත් කිරිමේ වැඩසටහනක් කරන්න කියා. එගොල්ලන්ට එන්න බැහැ මේ කෝවිඩ් - 19 නිසා. යම් ප්‍රමාදවුණා. ඒ අනුව මේ සියළුම මන්ත්‍රීවරු කැඳවා ඒ අදාල දැනුවත් කිරිම කරාවි.

**තීරණය-**

අම්බලන්ගොඩ, මෝදර දේවාල පාර හෝටල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධ ප්‍රගති වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සබාවට ඉදිරිපත් කරන ලදී.

**03.17 අම්බලන්ගොඩ, බෝගහවත්ත,අංක 15 හි පදිංචි ජී.සාගර ධනංජය මහතා විසින් 2020 ඔක්තෝම්බර් මස 12,13,14,15 යන දිනයන්හිදී මානාන ක්‍රීඩාංගනයේ ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම සඳහා නගර සභාවට ගෙවන ලද මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රීඩාංගනය වෙන්කිරීම වෙනුවෙන් නගර සභාවට ගෙවන ලද මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඇත. කෝවිඩ් -19 වසංගතය නිසා. අන්න එක පැහැදිලි කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න. නැතිනම් අසාධාරණයක් වෙන්නේ.

**තීරණය-**

2020 ඔක්තෝම්බර් මස 12,13,14,15 යන දිනයන්හිදී මානාන ක්‍රීඩාංගනයේ ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම සඳහා නගර සභාවට ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ගාස්තු ලෙස රු.16000/- ක මුදලක් සහ ඇප තැන්පතු මුදල් ලෙස රු.4000/- ක් ගෙවූ අතර, රටේ පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එය පැවැත්වීමට නොහැකි වූ හෙයින් එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, බෝගහවත්ත,අංක 15 හි පදිංචි ජී.සාගර ධනංජය මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.18 පෝරඹ ප්‍රජා මණ්ඩලයට කැනපි හට් එකක් මිලදී ගැනීමට රු.60,000/- ක් නිදහස් කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෝරඹ ප්‍රජා මණ්ඩලයට කැනපි හට් එකක් මිලදී ගැනීමට රු.60,000/- ක් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. ප්‍රජා සංවර්ධන නිලධාරි නිර්දේශ කර තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රජා මණ්ඩලයේ ලේකම්තුමා විසින් එවන ලද ලිපියට ප්‍රජා මණ්ඩලය සඳහා කැනපි හට් එකක් මිලදී ගැනීම සඳහා කරන ලද යෝජනාව ස්ථිර කරනවා. එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේක ලබා දුන්නාට ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. මේ ජනතාවගේ මුදල් නේ. එහෙම දෙනකොට එය සභාව සතු විදියට ද තියා ගන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රජා මණ්ඩලය සතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ප්‍රජා මණ්ඩලයට අයිති මුදල් . කොන්ත්‍රාත්කර ලැබුණු මුදල්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය  කතා කරමින්</u>**

ඒ වුණත් අයිති සභාවටනේ. ජනතාවගේ මුදල්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මුදල් ඇවිත් ප්‍රජා මණ්ඩලය සතු මුදල්. එතකොට ප්‍රජා මණ්ඩලයේ මුදල් පාවිච්චි කරන්න පුළුවන් අපේ සභාවේ අනුමැතියට යටත්ව. ඒ අනුමැතිය තමයි ඉල්ලන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්</u>**

එහෙම දෙයක් කරන එක හොඳයි විනෝද චාරිකා යනවාට වඩා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය  කතා කරමින්</u>**

කැනපි එක දෙන්නේ පෝරඹ සමිතියට විතරයි. වෙනත් අයට නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩටත් හොඳ එකක් ගන්න පුළුවන්. එතකන් වැඩ ටිකක් කරන්න.

**තීරණය-**

පෝරඹ ප්‍රජා මණ්ඩලයට කැනපි හට් එකක් මිලදී ගැනීම සඳහා  ප්‍රජා මණ්ඩල ගිණුමෙන් රු.60,000/- ක මුදලක්  නිදහස් කරදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 03.19 2020.02.11 දින සභා රැස්වීමේ අංක 10.07 තීරණය වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොලේ කාණු පද්ධතියේ ආවරණ පුවරු සැදීම සඳහා රු.950,000/= ක මුදලකට 2020.02.11 දින සභා තීරණ අංක 10.07 යටතේ අපි සම්මත කර තිබෙනවා. ඒ අනුව එය සභා අරමුදලින් අපි සම්මත කර තිබෙනවා. ඒ අනුව මේ ප්‍රවාහන අධිකාරිය මඟින් අපේ මුදල් වලින් කරන්න කියා තිබෙන්නේ. ප්‍රවාහන අධිකාරියේ අපේ ඉතිරි මුදල් වගයක් තිබෙනවා. ඒ මුදල් වලින් කරන්න කියා ඔවුන් අනුමැතිය දි තිබෙනවා. ඒ අනුව එම තින්දුව වෙනස් කිරිම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ කියන්නේ මෙය සභා අරමුදලින් නෙමේ. මෙය කළ යුතුයි කියා යෝජනා කරන්න. එතකොට ඔන පැත්තකින් මුදල් ගෙවන්න පුළුවන්.

**තීරණය-**

2020.02.11 දින සභා රැස්වීමේ අංක 10.07 තීරණය වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව අනුව එය වෙනස් කිරිමට ඉල්ලා ඇත. ඒ අනුව අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කාණු පද්ධතිය සඳහා යකඩ දැල් ආවරණ පුවරු සවිකිරිම සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2020.07.22 දිනැති ලිපිය පරිදි රු.950,000/= ක මුදලක් එම ආයතනයෙන් ලබාගත යුතු බවටත් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.20 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ගෙවතු වගා වැඩසටහන සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරිමට නියමිත ගෙවතු වගා වැඩසටහන. අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරිමට නියමිත ඉහත වැඩසටහනේ උපදෙස් මාලාව හා ගෙවතු නාම ලේඛණය මේ සමඟ අමුණා ඇත. එමෙන්ම මෙම උපදෙස් මාලාව අමුණා ඇත. එමෙන්ම මෙම උපදෙස් මාලාව සහ නාමලේඛන පිළිබඳ එක් කොට්ඨාශ මන්ත්‍රිවරුන් දැනුවත් කරන ලෙස එවා තිබෙනවා. ඒ අනුව මෙහි පිටපත බැගින් සියළුම මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න.

**තීරණය-**

දිළිඳුකම පිටුදැකීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන සම්බන්ධව ගාල්ල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එවා ඇති ලිපියේ පිටපත් සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.21 පින්නදූව තොටුපල මාර්ගය පුළුල් කිරීම සම්බන්ධව ලිපිගොනුව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පින්නදූව තොටුපල මාර්ගය සකස් කිරිම සම්බන්ධයෙන් මෙහි අත්පත් කර ගැනිමට තිබෙනවා. මෙහි කේ.ඩබ් . රමණී මහත්මිය අඩි 10 ට කරන්න එයා දෙන්න කැමතියි කියා තිබෙනවා. මේ ප්‍රශ්නය විසඳන්න කියා අපි මන්ත්‍රිතුමාට කිවුවා. මන්ත්‍රිතුමා මොකද ප්‍රශ්නය දැන්.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි දිගු කාලයක් බලා සිටි මාර්ගයක්. ඔබතුමාගේත් ලොකු උද්යෝගයක් තිබෙනවා මේ මාර්ගය අවසන් කරන්න. එනමුත් මේ මාර්ගයේ වසන ජනතාව එක පිරිසක් අඩි 10 ට මාර්ගය දීම ප්‍රතික්ෂේප කර සිටියේ. ඊයේ පෙරේදා ඔබතුමා මුණ ගැසි කිවුවා අඩි 10ට දෙන්න එකඟයි කියා. ඇය එකඟ වෙනවිට සෙසු මාර්ගයේ පහළ පදිංචිකරුවන් කියනවා අඩි 10ට බැහැ. අඩි 15 ½ ට මෙම අත්පත් කරගැනීමේ ක්‍රමයටම යා යුතුයි කියා. එමනිසා දෙපාර්ශවය එකඟ

නොවන නිසා එම උසාවි ක්‍රියා මාර්ගය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට යා යුතුයි කියා තමයි බහුතර පිරිසගේ මතය. නමුත් අපි කැමතියි මෙය අඩි 10ට හෝ අපේ දැස් පියවෙන්න කලින් මාර්ගයක් දකිනවා නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එච්චර වයස නැහැ. දෙපැත්තටම කියා හරි යන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔය ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කිවූ පරිදි රමණී මහත්මිය හැමදාම වැඩේ කරගෙන යන්න එනවිට මොකක් හරි අලුතින් අදහසක් ප්‍රකාශ කරනවා. එය නැවැත්වීමේ අදහසක් තිබෙනවාද කියා මා දන්නේ නැහැ. දැන් එහෙම අඩි 10ට ඔය මාර්ගයේ ඉන්න කිහිප දෙනෙක් කැමතියි. එත් තව අය කියනවා ඇයි මේ සමූහිකව පවුල් 07ක් එකතු වෙලා ගත් තීරණයක් එක්කෙනෙකුගේ මතයට අනුව වෙනස් වෙන්නේ කියා. ඔකත් එක්ක මට තිබෙන ගැටළුව මේ පාර හැදෙන්නේ නැද්ද කියන ප්‍රශ්නය මට තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය මෙහි එක ප්‍රශ්නයයි අහන්නේ . අඩි 10ට කරනවාද ? නැතිනම් අත්පත් කරගෙන කරනවාද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

අපිට එක ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමලා දෙන්නා සිටිනවානේ. මටනම් කොහොම කළත් ප්‍රශ්නයක් නැහැ. ඔගොල්ලන් ගමේ මන්ත්‍රීවරු. ඔය දෙන්නා කියන්න මෙය අඩි 10ට කරන්නද අත්පත් කරගෙන කරන්නද කියා. මන්ත්‍රීතුමා ඔය දෙපැත්තටම නැති කතාව මොකක්ද ? එකක් කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

දැන් අඩි 10ට කරන්න කැමතියි කිහිප දෙනෙක්ම. අපේ අර නිලූකා එගොල්ලන් නේද කැමති නැත්තේ අඩි 10ට. තුනදෙනෙක් කැමති නැහැ. ඒ කියන්නේ ඔය පාරේ වැඩය කෙරෙන්නේ නැති එකයි. මා නම් කියන්නේ අඩි 10ට කරන්න කියා. එගොල්ලන්ගේ කැමැත්තක් තියෙනවා නම් අඩි 10ට කරන්න කියන එක. බහුතරයේ කැමැත්ත අනුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි සභාව සතු අභිමතානුසාරි බලය පාවිච්චි කරලා අඩි 10ට මේ මාර්ගය කළ හැකිව තිබෙන්නේ නම් හොඳයි කියන එක තමයි මාගේත් පෞද්ගලික මතය. එනමුත් මේ මාර්ගයේ වසන්නන්ගෙන් පාර්ශව හතක් පමණ ඒ ඉඩම් හිමියන් පිටත් සිටිනවා. ඔවුන් කියන්නේ උසාවිය ලබා දුන් තින්දුවට හිස නමලා වර්ෂ 10 ක් හෝ 15 ත් ගියත් කමක් නැහැ. ඒ උසාවි තින්දුවට අනුව කටයුතු කරන්න කියා තමයි ඔවුන් කියන්නේ. එමනිසා බහුතර කැමැත්තට හිස නැම්මයි වඩා සුදුසු. අපි යම් කාලයක් බලා සිටිමට වෙනවා එහෙම වුණොත්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නඩු තින්දුවක් නැහැ. මෙය අත්පත් කර ගැනීමක්. ඔබතුමා ඒ මනින අවස්ථාවේත් කිවාලු නඩු තින්දුවක් කියා. ඒ මිනිසුන් ආවා මා ගාවට උසාවි තින්දුව දෙන්න කියා. උසාවි තින්දුවක් නෙමේ මේක. රජයට අත්පත් කර ගැනීමක්. අත්පත් කර ගැනීමට දැනට අපි මැනුම් කටයුතු කර තිබෙන්නේ. අපිට තිබෙන්නේ වන්දි කොපමණ ගන්නවාද කියා තින්දු කිරිම. අපි වන්දි ගෙවා තමයි ගන්න වෙන්නේ. නැතුව කාගේවත් ඒවා අපිට බලෙන් ගන්න බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා  කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි,  මේ මාර්ගයේ 7කුම කිසිම වන්දියකින් තොරව ලබා දීමට එකඟ වෙලා තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීතුමා එහෙනම් ඔබතුමා ඒ අය සමඟ එකතු වෙලා මේ වැඩය කරන්න. මුදලුත් දෙන්නම්. මේක අහන්න දෙයකුත් නැහැ. දැන් මේ සභාවෙන් අපි ලක්ෂ 8ක මුදලක් වෙන් කරලත් අවසන් . ඔකට වැටි බැදිම සඳහා. මන්ත්‍රීතුමා වැඩය පටන් ගන්න. නැතිනම් කරන්න වෙන්නේ මෙකයි. හැබැයි ඔගොල්ලන් හරි තීන්දුවක් ගත්තේ නැතිනම් ඔගොල්ලනුත් අර පාරේ යන මිනිසුන් බවට පත් වෙනවා. මා 1997 සිට මේ පාරේ යනවා. මේ පාරේ සිටින කිසිම කෙනෙකු කැමැත්තෙන් මෙය දෙන්නේ නැහැ. එක නිසා හොඳම දේ තමයි. හැබැයි හදන්න කියා හැමදාම කෑ ගසනවා. ඒකනිසා හොඳම දෙය තමයි අත්පත් කරගෙන හැදුවාම ඉවරයි. ඔය කියන කට්ටිය දෙන්නේ නැහැ. තේරුම් ගන්න. විශේෂයෙන්ම ඔය කැමතියි කියන තාම අපේ අර පෙර පාසල් ගුරුතුමිය තාම මිය ගිහින් නැහැනේ. ඇය ජිවත් වෙලා සිටිනකල් ඕක හම්බ වෙන්නේ නැහැ. මෙහි තින්දුව ඔගොල්ලන් හරි කෙලින් ගන්නේ නැහැනේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා  කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපි තව දින 7ක කාලයක් ඉල්ලනවා මේ සඳහා. මන්ත්‍රීතුමිය අපි අවසාන උත්සාහයත් දරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලබන සභාවට කල් තියෙනවා එහි තින්දුව.

**තීරණය-**

පින්නදූව , තොටුපල මාර්ගය පුළුල් කිරීම සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා ලිපිගොණුව 2020 දෙසැම්බර් මස සභා රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

**03.22 අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, අංක 87/බී හි පදිංචි එච්.ධම්මික නිරෝෂන් මහතා විසින් 2020.10.16 දින ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදීත**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, අංක 87/බී හි පදිංචි එච්.ධම්මික නිරෝෂන් මහතා විසින් 2020.10.16 දින ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන්කර ගැනීම සඳහා නගර සභාවට ගෙවූ මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඇත. අපි මීට කලිනුත් තීන්දුවක් ගත්තා. ඒ අනුව කටයුතු කරන්න.

**තීරණය-**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ 2020.10.16 දින ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම සඳහා නගර සභාවට ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ගාස්තු ලෙස රු.6000/- ක මුදලක් සහ ඇප තැන්පතු මුදල් ලෙස රු.7500/- ක් ගෙවූ අතර, රටේ පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එය පැවැත්වීමට නොහැකි වූ හෙයින් එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, අංක 87/බී හි පදිංචි එච්.ධම්මික නිරෝෂන් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.23ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතාට 2020.10.03 දින සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සරත් චන්ද්‍ර මහතාගේ ලිපිය අද තමයි කියන්න වෙන්නේ. සභාව කල් ගිය නිසා. ඒක කියන්න අවශ්‍ය නැහැනේ.

**තීරණය-**

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතාට 2020.10.03 දින සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ඉදිරිපත් කර ඇති ලිපියට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති

එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

04.

නැත

05. **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**05.01 ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 රොබට් වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

රොබට් වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය -**

රොබට් වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.02 පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය තාර දැමීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී. (අංක 144 නිවස සිට 144/3 නිවස දක්වා)**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය තාර දැමීම සුදුසු බවට යෝජනා කරනවා(අංක 144 නිවස සිට 144/3 නිවස දක්වා)

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය -**

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය (අංක 144 නිවස සිට 144/3 නිවස දක්වා) තාර දැමීම සුදුසු බවට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**05.01.03 පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී. (ආරම්භය වාමර මහතාගේ අංක 104 නිවස අසලින්)**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සුදුසු බවට යෝජනා කරනවා . (ආරම්භය වාමර මහතාගේ අංක 104 නිවස අසලින්)

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය -**

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම (ආරම්භය වාමර මහතාගේ අංක 104 නිවස අසලින්) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**05.01.04 මාර්ග සති පාර ඉතිරි කොටස කාණුව සහ බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාර්ග සති පාර ඉතිරි කොටස කාණුව සහ බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මා මේ ඉහත යෝජනා තුනම ලේකම්තුමියට දුන්නා. ඔබතුමා අයවැය යෝජනා කියා ඔබතුමාගේ යෝජනා විදියට දමා තිබෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. මෙම යෝජනා තාක්ෂණසේවා නිලධාරිතුමිය මුණ ගැසුනාම කලින් සභාවේ මේ යෝජනා තුන මා න්‍යාය පත්‍රයට ඇතුල් කර තිබුණා . මාගේ යෝජනා කියලා. යෝජනා 5ක් තිබුණා. ඔබතුමා න්‍යාය පත්‍රය දිග වැඩි නිසා

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා කළ යෝජනා තුනම පසුගිය අවුරුද්දේ මේ වසර අදාල අයවැය වාර්තාවේ යෝජනා අංක සහිතව එවා තිබෙනවා. ඒ අනුව මේ ඇස්තමේන්තුවට අනුව තමයි දෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

**දැන් මේ යෝජනා වලට ඇස්තමේන්තු හදලා තිබෙනවානේ. තාක්ෂණසේවා නිලධාරි මහත්මියට ගිහින් කිවුවාම මෙහි යෝජනා සම්මතවෙලා නැහැ. කලින් යෝජනා දමා තිබුණා. ඔබතුමා ගත්තේ නැහැ න්‍යාය පත්‍රයට.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙමයි . මෙය ඇතුලත් කළ යුතු නැහැ. අයවැය යෝජනා සම්මත වෙලා තිබෙන්නේ. එම යෝජනාව ඇතුළේ මෙය තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

එහෙනම් ප්‍රශ්නයක් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රශ්නයක් නැහැ.

**තීරණය -**

මාර්ග සති පාර ඉතිරි කොටස කාණුව සහ බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.05 නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල මායිම් තාප්පය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල මායිම් තාප්පය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා .

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා .

**තීරණය -**

නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල මායිම් තාප්පය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06 බෝ ගස අසල සිට ප්‍රධාන පාර දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බෝ ගස අසල සිට ප්‍රධාන පාර දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා .

**තීරණය -**

බෝ ගස අසල සිට ප්‍රධාන පාර දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07 නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ සිදුකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ සිදුකිරීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ යෝජනා සම්බන්ධයෙන් ගත්තාම මේ නගර සභා ක්‍රිඩා පිටියේ වැඩ කටයුතු අවසන් වෙලා තිබෙන්නේ. එදත් මා කිවුවා. මෙයට දැන් විශාල වශයෙන් වැය වෙලා තිබෙන්නේ. අත්‍යවශ්‍ය ඒවා ටික ටික කරගෙන යන්න. දැන් ක්‍රිඩාංගණයේ මූලික වැඩ කටයුතු ටික අවසන් වෙලානම් ඒ ටික කරගෙන යන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මන්ත්‍රිතුමා මෙහි මේක නැරඹීමට පහසුකම සලසනවා සේම මා ලබන සභාවට සියළුම විස්තර ටික ගෙන්නම්. එහිදි අප බලාපොරෝත්තු වෙනවා . මෙහිදි අපිට එක දිනයකට වියදම් කරන්න වෙනවා රු.15000/= ක්. එතකොට දින 30ක් ගත වෙනකොට යන වියදම හිතා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දිනකට රු.15000/= ක් කියන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දිනකට රු.15000/= ක් මෙහි නඩත්තු කිරිමට වියදම යනවා. එතකොට ඒ වියදම සපුරා ගැනීම කරන්න බැරි නම් වෙනින් පැත්තකින් ක්‍රිඩකයින්ට ක්‍රිඩා ගාරය ලබා දීම සඳහා යන මුදල ඉතා අධික වෙනවා. යම්කිසි ආකාරයකින් එය සපුරා ගැනිමේ ක්‍රමවේදයක් අපි මෙතනින්ම හදාගතහොත් අපිට මේ මුදල් අයකිරිම් ඔබතුමාලාට අපිට මේ සභාවට , ඒ පාසැල් වලට ඒ ළමයින්ට , ක්‍රිඩා සාමාජවලට යම් අඩු කිරිමක් කරලා දෙන්න පුළුවන්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

දැන් ඔබතුමාගේ ඔය කියන ගැටළුව කිසිදු ගැටළුවක් නැහැ. ඔබතුමා සාධාරණ හේතු නඩත්තු කිරිම් හරියාකාරව තිබෙනවා. ඒක නෙමේ මෙය මන්ත්‍රිවරුන්ට දමන කොට. ඇත්තටම අවශ්‍ය නැහැ මෙය කතා කරන්න. ඔබතුමා මෙය විස්තර කරන්න ඕනේත් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රිතුමා කිවු නිසා මෙය පැහැදිලි කළේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු ඒ මන්ත්‍රිතුමාටත් මෙය වැටහෙනවා මේක . මෙන්න මේකේ මෙන්න මේ හේතුව

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා දැන් ලබන සභාවට මෙතැන ඉදිකරන මේක සම්බන්ධයෙන් මේකට උදවු කරපු සම්පූර්ණ විස්තරයක් එක්ක ඔක්කොම පැහැදිලි කරන්නම්. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා මේ ක්‍රිඩාංගනයට අමතරව යම් කඩ සාප්පු කිහිපයක් ඉදිකරන්න. ඒ වගේම ක්‍රිඩකයන්ට නවතින ස්ථාන , යම්කිසි ක්‍රිඩා සාමාජයක් පවත්වාගෙන යාමට අවශ්‍ය නම් ඒ සඳහා තැනක් ඒ විදියේ ක්‍රමවේද. ඒ සියල්ලෙන්ම ආදායම ලබා ගන්න වෙන්නේ ක්‍රිඩාංගණයේ අර කියන කාරණා ඉෂ්ඨ සිද්ද කර ගැනීමට. මේ ක්‍රිඩාංගණය හදනවා වගේම මෙය පවත්වාගෙන යාම ගැනත් අපි කල්පනා කරන්න ඕනේ. එමනිසා සම්පූර්ණම වාර්තාව විඩියෝවක් මඟින් අපිට උදවු කරන මහතා ලවා කරවා සියළුම මන්ත්‍රිවරුන්ට අවබෝධයක් ලබා දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේවාට විරුද්ධ වෙනවා නෙමේ. මෙහි දමන විට ක්‍රිඩාංගණය ඉදිකිරිමට අමතර වැඩ කියා දමන්න. මේකේ ඇයි සැලසුමක් නැත්තේ වැඩක් කරන කොට.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සැලසුම තිබෙනවා. මා ලබන සභාවට දෙන්නම් සැලසුම.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අන්න එහෙම ඉදිරිපත් කරන්න අපිට. නැතිනම් අපි වැරදි මතයක්නේ යන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙකේදි මේ අය පලවෙනි පාර නම්කිරිමේ වරදක් . දැන් දකුණු පළාත් ඉංජිනේරු මහතා පැමිණ අපි කියපු කාරණය සම්බන්ධව . ඒ අය කිවුවා පියවර 01, පියවර 02, පියවර 03, පියවර 04 කියා නම්කර ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න කියා. අපේ තාක්ෂණසේවා නිලධාරින්ට උපදෙස් දුන්නා. ඒ උපදේශය අනුව ඒ වැඩ කටයුතු ඉදිරියට සිද්ධ වෙයි. අපි බලන්නේ යම්කොටසක මුදල් උපයා ඊළඟ කොටස ඉදිකරන්න. එහෙම තමයි කරන්නේ. නමුත් අපිට තාම මුදල් හම්බ වෙන කොටස ඉදිකර නැහැ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මා කියන්නේ එක තමයි. මේ කණු ගිහින් තිබෙනවා. මෙහි කියා තිබෙන්නේ සිදු කිරිමට සුදුසු බවනේ. සුදුසු නෙමේ. මෙකේ මේ වහල ගන්න යෝජනා කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එක තමයි මා සම්පුර්ණ විස්තරය ලබන සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

හරි මේක නැවත ස්ථිර කරන්නම්.

**තීරණය -**

නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මිළගට ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනාව.

## 05.02 ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා

05.02.01 කළුවඩුමුල්ල ජල ටැංකිය අසලින් පොල්වත්ත හන්දියට වැටෙන මාර්ගයේ නිමල් චන්ද්‍ර මහතාගේ නිවස අසල කාණු පද්ධතියේ මැද ඇති දුරකථන කණුව ඉවත්කර, ඉතිරි කර ඇති අඩි 20 ක් පමණ දිග කාණුව සකස් කළ යුතු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

කළුවඩුමුල්ල ජල ටැංකිය අසලින් පොල්වත්ත හන්දියට වැටෙන මාර්ගයේ නිමල් චන්ද්‍ර මහතාගේ නිවස අසල කාණු පද්ධතියේ මැද ඇති දුරකථන කණුව ඉවත්කර, ඉතිරි කර ඇති අඩි 20 ක් පමණ දිග කාණුව සකස් කළ යුතු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මා එම යෝජනාව ගැන කතා කළයුතුයි. මේ වනකොට ක්‍රියාත්මක කරලා අවසන්. ඒ ටෙන්ඩර් එකක් දි තිබෙන්නේ එම විදුලි කණුව ඉවත් කරන්න කියා. මේ ලිපියත් මේ වනකොට ගිහින් තිබෙන්නේ. එය ඉවත් කළාම යෝජනාවක් හැටියට එන්න ඕනේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඉවත් කරලා නැහැ මේ වෙනකම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම කොහොමද යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්නේ . මේ කරන ලද කාරණය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා ඒක අපේ ඇස්තමේන්තුවේ තිබෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඔව් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඇස්තමේන්තුවේ තිබෙනවා නම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඔය ටිකටම ඇස්තමේන්තුව කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මෙහෙමයි මේ ප්‍රශ්නය . මා එම ගෙදරටම ගියාම තමයි මා ඇත්ත සිද්ධිය කියන්න එපායි. එම කාණුවේ කොළ හිර වෙලා . ඒ අය කිවුවා බලන්නකෝ මේ කොන්ත්‍රාත්කරු මේ ටික ඔක්කොම ඉතිරි කරලා. එම කොන්ත්‍රාත්කරුගේ නමත් කිවුවා. අම්මා අරගෙන තිබෙන්නේ . පුතා එම කොන්ත්‍රාත් එක කරලා තිබෙන්නේ. නම් කියන්න අවශ්‍ය නැහැ. මෙන්න මේ කොන්ත්‍රාත්කරුගේ වැඩ. එතැන කණුව තිබෙද්දි කණුව ගලවා ගන්නේ නැතුව එහෙම ගිහිල්ලා.

මා කියන්නේ මා ගියාම ජනතාව කියපු එක. මා එම ගෙදරට හදිස්සියේ ගියා. මා යනවිට බැලුවා මොකද මෙතැන විතරක් කුණු ගොඩ එකතුවෙලා තිබෙන්නේ කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මේ කරුණ සිද්ධ වෙනවා. මේ කණුව ඉවත් කරන්න කොන්ත්‍රාත්කරුට බලයක් නැහැ . අපේ නගර සභාවටත් එම කණුව ඉවත් කරන්න බලයක් නැහැ. එය අපි අදාල ආයතනයට දැනුම් දිලා ඒ අය ඒක ඉවත් කරනකම් අපිට කරන්න බැහැ. කිසි ගැටළුවක් නැහැ. එකත් එක්කම දිලා තිබෙන්නේ කොන්ත්‍රාත්කරුට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමිය, එහෙම දිලා තිබෙනවා නම් අපි මේ යෝජනාව ඉවත් කරනවා.

**තීරණය -**

කළුවඩුමුල්ල ජල ටැංකිය අසලින් පොල්වත්ත හන්දියට වැටෙන මාර්ගයේ නිමල් චන්ද්‍ර මහතාගේ නිවස අසල කාණු පද්ධතියේ මැද ඇති දුරකථන කණුව ඉවත්කර, ඉතිරි කර ඇති අඩි 20 ක් පමණ දිග කාණුව සකස් කළ යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත වූ අතර, එම කාර්යය සම්බන්ධව අවශ්‍ය කටයුතු මේ වන විට කරගෙන යන බවට ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ප්‍රකාශ කළ බැවින් ගරු සභාපතිතුමා විසින් එම යෝජනාව ඉවත් කරන ලදී..

**05.02.02 නගර සභා මන්ත්‍රීවරුන්ගේ සාමූහික ඡායාරූපය සකස්කර ලබාදෙන ලෙස යෝජනා කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපි මන්ත්‍රිවරු සියළු දෙනාගේම සමුහික ඡායාරුපයක් ගත්තා. මා යෝජනාවක් කරනවා නගර සභා මන්ත්‍රීවරුන්ගේ සාමූහික ජායාරූපය සකස්කර නගර සභාවෙන් ලබාදෙන ලෙස යෝජනා කරනවා. එම ඡායාරුපය අපිට ලබා දෙන්න. අපේම බටපොළ ප්‍රාදේශීය සභාවේ ආදායම් අඩු කිව්වත් සියළුම මන්ත්‍රිවරුන්ට එම ඡායාරුපය ලබා දී තිබෙනවා. රාමු කරලා ඔක්කොම කරලා. අපිටත් ඒක ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. ආර්. පේෂලා මහත්මිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එක ගත්තා. මා විරුද්ධව කතා කරනවා නෙමේ මගේ සහෝදර මන්ත්‍රිතුමියට. මේක ගත්තා. අපිට එදා දැනුම් දුන්නේ ඒ අදාල පුද්ගලයාට අපි මුදල් ගෙවා ගන්න කියා. දැන් අපේ ගෙදර මා එය ගෙන රාමු කර එල්ලා තිබෙනවා. එදාම කිවුවා මට මතක විදියට.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

කලින් දුන්නේ නගර සභාවේ මුදල් වලින්. මේ පාර වෙන්නැති ඕක. එතුමිය කියන මෙය සාධාරණව බලා එය ලබා දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

එතකොට තව එකක් ලැබෙනවා. මට තව ගෙදරක ගහන්න පුළුවන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගෙවල් දෙකක් තිබෙනවානේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙය ලබා දෙන්න. හැබැයි සභාවේ මුදල් වලින් ලබා දෙන්න කියා නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

නගර සභා මන්ත්‍රීවරුන්ගේ සාමූහික ජායාරූපය සකස්කර එය සභාවේ අරමුදලින් ලබාදෙන ලෙසට යෝජනා කරනවා.

**තීරණය -**

නගර සභා මන්ත්‍රීවරුන්ගේ සාමූහික ජායාරූපය සකස්කර ලබාදෙන ලෙසට ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත වූ අතර, එම සාමූහික ජායාරූපය සභා අරමුදලින් සියලු ගරු මන්ත්‍රීවරුන්ට ලබාදෙන ලෙසට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**05.03 ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01 හෙප්පුමුල්ල පිහිටි වරිගනෙත්තිවත්ත පාරට මුහුණලා ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට කර ඇති යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**</u>

හෙප්පුමුල්ල පිහිටි වරිගනෙත්තිවත්ත පාරට මුහුණලා ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කර තිබෙනවා ඒ සියළුම ලිපි. පාර පවරා ගැනීමේ සියළුම ලිපි. එතකොට එම මාර්ගයේ නිවැසියන් දෙදෙනෙකුගේ තිබෙනවා තාප්ප දෙකක්. ඒ ගොල්ලනුත් කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. ලිපි දෙකකුත් තිබෙනවා ඕතන. ඒ අයගේ තාප්ප දෙක කඩා අඩි තුන තුන දෙන්න. ඒ අය ඉල්ලීමක් කර තිබෙනවා. එම තාප්ප දෙක නගර සභාවෙන් බැඳ දෙන්න කියා. එම ලිපි දෙක තිබෙනවා. අපේ තාක්ෂණ නිලධාරි හර්ෂණ මහතා ගිහින් එය මැන එම වාර්තාව ගත්තා. එතන නඩුවක් තිබුණා. එම නඩුව අවසන් වෙලා එම නඩු තීන්දුවත් ඔය ලිපිගොණුවේ තිබෙනවා. එමනිසා මේ පාර තාර දමා සකස් කර දෙන ලෙසට මා සභාවෙන් ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි.

**තීරණය -**

හෙප්පුමුල්ල පිහිටි වරිගනෙත්තිවත්ත පාරට මුහුණලා ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.04 ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.04.01 කෙරමිණිය ප්‍රජා මණ්ඩලය සඳහා දම්රෝ වර්ගයේ ප්ලාස්ටික් පුටු 50 ක් ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ ගමක් හැටියට නැගී සිටිය යුතු නිසා ප්‍රජා මණ්ඩලයට මුල්තැන දී කටයුතු කරන ගමක් හැටියට පත්වුණා. මෙන්න මේ ප්‍රජා මණ්ඩලය බල ගැන්වීමක් හැටියට කෙරමිණිය පින්නදූව ප්‍රජාව වෙනුවෙන් ප්ලාස්ටික් පුටු 50ක් ලබා ගැනීමට අප මණ්ඩලයේ මුදල් නිදහස් කරන ලෙස මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කෙරමිණිය ප්‍රජා මණ්ඩලය සඳහා දම්රෝ වර්ගයේ ප්ලාස්ටික් පුටු 50 ක් කෙරමිණිය ප්‍රජා මණ්ඩල අරමුදලින් ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06. **කාරක සභා වාර්තා සලකා බැලිම**

**06.01 2020.09.21 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවැත්වූ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020.09.21 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවැත්වූ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.09.21 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්දව පවත්වනු ලබන කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.02 2020.10.21 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවැත්වූ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020.10.21 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවැත්වූ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.10.21 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්දව පවත්වනු ලබන කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.03 2020.10.23 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.23 දින ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.10.23 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2020.10.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ නගරයේ අනවසරයෙන් වෙළදාම් කරන පුද්ගලයන් ගැන කතා වේලා තිබෙනවා. ඒ ගැන මොකක්ද ගන්න තීරණය. මෙකේ මුකුත් සටහන් වෙලා නැහැ.

**තීරණය-**

2020.10.26 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.05 2020.10.23 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.26 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ක්‍රිඩා කමිටුව දමන අතරට මගේත් යෝජනාවක් දමනවා. මා හිතනවා ඔබතුමා තීරණය කළා ක්‍රිඩාංගණය විවෘත කරනවා කියා. ඒ විවෘත කිරිමේ අවස්ථාවට මා යෝජනා කරනවා අපගේ ගාලු දිස්ත්‍රික්ක පාර්ලිමේන්තු මන්ත්‍රි ෂාන් විජයලාල් මැතිතුමාත් සහභාගි කරවන ලෙස.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ ඉතිං අවශ්‍ය නැහැ කතා කරන්න. මුදල් දුන් කට්ටිය ලැජ්ජාවක් තිබෙන අය ඒවි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , ඔය කතාව කියන්න එපා . මේ ඔයාගේ පෞද්ගලික බුදලයක් නෙමේනේ. මුදල් දී තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මුදල් දිපු මන්ත්‍රිවරු එන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ අම්බලන්ගොඩ ආසනය තුළ , දිස්ත්‍රික්කය තුළ ඡන්දය ඉල්ලා දිනලා පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක් වශයෙන් දිනා ගිහින් තිබෙන්නේ. ඉතිං අපේ නායකතුමා හැටියට මේ ආසනයේ අපි ඉල්ලිමක් කරන්න. ඔබතුමා එය කරන්න. කඩ කැඩුණු වචන කියන්න එපා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපි එතුමාටත් ආරධනා කරනවා. එතුමාගේන් මෙයට තව කියක් හරි ඉල්ලා දෙන්න. මොකද සතයක්වත් අද වෙනතුරු එවලා නම් නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එතුමාට අයිතියක් තියෙනවා. එහෙම නැතුව ඔබතුමාගේ බුදලයෙන් නෙමේ මේක.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මගේ බුදලයක් නෙමේ මේක.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඔක යෝජනා කරන්න දෙයක් නෙමේ. අපේ සභාවේ වගකීමක් වෙනවා මේක. වගකීමක් හැටියට එතුමාට ආරධනා කරන්න. ඕක යෝජනා කරන එක ඔබතුමලා නැවත වරක් ගැටුමක් ඇති කරන්න තමයි ගත්තේ. මෙය තාම විවෘත කළේ නැහැනේ. ඒක ලේකම්තුමියගේ , සභාපතිතුමාගේ, මන්ත්‍රිවරුන්ගේ වගකීමක් වෙනවා ආරධනා කරන්න. ඔය ෂාන් විජයලාල් මන්ත්‍රිතුමාට විතරක් නෙමේ. මේ පක්ෂයේ තව මන්ත්‍රිවරු ඉන්නවා. ඒ අයට ආරධනා කරන එක අපේ වගකීමක්. ඔබතුමලා ඕක යෝජනා කර ගෙනාවේ නැවත ආපහු ගැටුමක් ඇති කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ක්‍රිඩා කමිටු වාර්තාව බැලුවාද ඔබතුමා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ. ක්‍රිඩා කමිටුව සම්බන්ධයෙන්

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා කමිටුවට එතුමිය සම්බන්ධ නිසා එතුමිය කතා කළා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ආරාධනා කරනවා. අපි බලාපොරෝත්තු වෙනවා ක්‍රිඩා පිති හා පන්දු ටිකක් හරි ගෙන එතුමා එයි කියා. අපේ ක්‍රිඩකයන්ට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මටත් වචනයක් කතා කළ යුතුයි ඒ සම්බන්ධව. පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක් විදියට තේරු පත් වු එතුමා. මට දේශපාලන පක්ෂ වැඩක් නැහැ. අපි කතා කළ යුතුයි. මහජන ක්‍රිඩාංගනය ජනතා අයිතියට පත් කිරිමේදි පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක් විදියට එතුමාට ආරාධනා කිරිම අපේ යුතුකමයි. ඒක අපි වැදගත් විදියට කළ යුතුයි. එතුමාගෙන් ලබා ගත යුතු දේවල් අපි ඉදිරියේදි කටයුතු කරලා ලබා ගන්න කියා ඉල්ලිමක් කරනවා. එතුමාට අනිවාර්යෙන්ම ආරාධනා කළ යුතු බවයි මාගේ මතය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පසුගිය මේ ක්‍රිඩාංගණය විවෘත කිරිම සම්බන්ධව සභා රැස්විමක් පැවැත්වුවා මට මතකයි. එහිදි මා යෝජනා කළා

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද අපිට එම විවෘත කිරිම කරන්න එපා කියා සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය මඟින් අපිට ෆැක්ස් මඟින් දැනුම් දිමක් කර තිබෙනවා. ක්‍රිඩාංගණය විවෘත කිරිමක් කරන්න එපා කියා. අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගණය විවෘත කිරිම සම්බන්ධවයි. උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2020.10.21 දිනැති ලිපිය හා බැඳේ. අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගණය විවෘත කිරිමේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම කැඳවා ප්‍රදර්ශනාත්මක තරඟයක් හා උත්සවයක් පැවැත්වීමට සංවිධානය කරන බව සඳහන් කරමින් ඒ සඳහා උපදෙස් ඉල්ලා ඇත. ඒ 2020.11.01 දින නිකුත් කරන ලද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්ගෙ සෞඛ්‍ය මාර්ග උපදේශනයට අනුව එළිමහන් උත්සව පැවැත්වීමට අවසර ලබා දීමට අවසර නොදෙන බව දන්වා සිටිමින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම හා ක්‍රිකට් තරඟයක් පැවැත්වීම විශාල පිරිසක් එකරාශි විය හැකි කරුණක් බැවින් ඒ සඳහා අවසර ලබා දීම කළ නොහැකි බව දන්වන අතර මේ පිළිබඳ නගර සභාවේ සභාපතිතුමා දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි.ප්‍රාදේශිය සෞඛ්‍ය නිලධාරි විසින් දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂක විසින් ලිපියකින් දන්වා තිබෙනවා. අපිට පිටපත ඇවිත් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , අපි මේක විවෘත කරන්නේ නැහැ කවදාවත්. උත්සවයක් තියන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ උපදේශ පිළිගන්න වෙනවා. මේ වේලාවේ. නැතුව අපිට කරන් බැහැ ඇත්තටම. මා දුටුවා ඊයේ රූපවාහිනියේ දැන් මේ ඔබතුමලා දිගට ඉන්නේ මීටරයක පරතරය තබා ගෙන සභාව කරගෙන යා යුතු නිසා. වෙන සභාවක උසාවි නියෝගයක් දි තිබෙනවා. සභාව නතර කරන්න කියා. මට සභාව මතක නැහැ. මාවනැල්ලේ සභාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මට මතක් කරන්න ඕන වුණේ එක නෙමෙයි. මට උවමනා වුණේ. මා එදා කිවුවා සංකේතාත්මක වෙනත් ක්‍රිඩාවක් පවත්වන්න කියා. ඔබතුමා එකට කිවුවා මා ගැටුමක් ඇති කරන්නද හදන්නේ කියා. එහෙම ගැටුමක් ඇති වෙන්නේ කොහොමද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඔබතුමාට අපි ඊළඟ වසරේ අයවැයට දමා තිබෙන කරුණු අනුව සියළුම ක්‍රිඩාවලට මෙතැන අවස්ථාව තිබෙනවා. කිසිම මේකක් නැහැ. යම්කිසි ප්‍රශ්නයකට තිබෙන්නේ ගාස්තුව පිළිබඳව. යම් ඉහළ ගාස්තුවක් අයවීම පමණයි. එකට මමත් එකඟ නැහැ. නමුත් මේ යන ක්‍රමයට නොකර බැහැ. ඒ සඳහා මුදල් ලබාගත යුතු විදියක් සභාව විසින් කල්පනා කරලා එකෙන් උපයා එය ක්‍රිඩකයන්ට ලබා දිය යුතුයි. විද්‍යාලවලට ලබා දිය යුතුයි. ක්‍රිඩා සමාජ වලට ලබා දිය යුතුයි. දැනට තිබෙන අපේ එකඟතාවය තමයි අම්බලන්ගොඩ පාසැල් සහ රියෝ සහ සිංහ ක්‍රිඩා සමාජයට යම්කිසි සහන මුදලකට අපි මෙය ලබා දෙනවා කියා. ඒ ඇරෙන්න දිනකට මෙය නඩත්තු කරන්න රු.16000/= ක පමණ මුදලක් යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

කොහොම වුණත් අවසානයේ මේ ආපු තීරණය ගැන මා සතුටු වෙනවා. මා ඒ ගැන ස්තූති වන්ත වෙනවා. මොකද නගරයේ සියළුම දරුවන්ගේ සියළුම ක්‍රිඩා මෙතැන පවත්වන්න අවසර ලබා දීමගැන. එක තිල ගැටලුවක් වෙයි. මා දන්නේ නැහැ . එය කොහොම විසඳයි ද කියා. එකත් ආදාහනාගාරය වගේ විසඳෙයි කියා මා විශ්වාස කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මා පාපන්දු ක්‍රිඩකයෙක් . ඒ වගේම අම්බලන්ගොඩ පාපන්දු සංගමයේ සභාපතිතුමාත මා පාපන්දු ක්‍රිඩා කරන ක්‍රිඩකයෙක්. එමනිසා කවදාවත් එම ක්‍රිඩාවට කවදාවත් මදි පුංචි කමක් වෙන්න දෙන්නේ නැහැ.

**තීරණය-**

2020.10.23 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.06 2020.10.26 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.26 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.10.26 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.07 2020.10.20 දින පැවති සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.20 දින පැවති සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.10.20 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.08 2020.10.28 දින පැවති ආපදා කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.10.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**තීරණය-**

2020.10.28 දින පැවති ආපදා කළමනාකරණ කමිටු වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 07. ටෙන්ඩර් හා මිළ ගණන්

07.01 ටෙන්ඩර්

07.02 මිල ගණන්

07.02.01 වායු සමීකරණ යන්ත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී අම්බලන්ගොඩ | ගෝල්ඩ් මියුසිකල් ස්ටෝර්ස් ගාල්ල | කාවින්දි ඉලෙක්ට්‍රිකල් කන්දේගොඩ |
|---|---|---|---|---|
| **01** | වායු සමීකරණ යන්ත්‍ර සැපයීම | | | |
| | **12000BTU** | **82004/=** | **89300/=** | **86000/=** |
| | **24000BTU** | **119050/=** | **130000/=** | **128000/=** |
| | **60000BTU** | **317226/=** | **346600/=** | **410000/=** |
| | තැන්පත් මුදල | **2000/=** | **2000/=** | **2000/=** |

**තීරණය:-**

වායු සමීකරණ යන්ත්‍ර ලබාගැනීම සඳහා දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ විදුලි ඉංජිනේරු ජේ.පී.ජනත් මහතා, සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු ඩී.ජී.මානවඩු මහතා සහ අම්බලන්ගොඩ නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරී මහතෙකුගෙන් සැදුම්ලත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් සුදුසුකම්ලත් ආයතනයක් තෝරාගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 49-9436 රථයට රේඩියේටර් 01 ක් මිලදී ගැනීම සඳහා Browns සමාගම මගින් ඉදිරිපත් කර ඇති මිල ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | ප්‍රමාණය | Browins Thermal Engubeering |
|---|---|---|---|
| 01 | 49-9436 රථයට රේඩියේටර් 01 | 01 | 35000/=<br>With Vat |

**තීරණය:-**

49-9436 රථයට රේඩියේටර් 01 ක් මිලදී ගැනීම සඳහා Browns සමාගම මගින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී. (ට්‍රැක්ටර් රථය Browns සමාගමේ නිෂ්පාදිතයක් බැවින් සහ මේ දිනවල රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වෙනත් මිල ගණන් ලැබී නොමැත.)

**07.02.03 මානාන ක්‍රීඩාංගනයට Phoenix වර්ගයේ ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංක | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | Danushika Furniture Ambalangoda | සමගි ලී බඩු අම්බලන්ගොඩ | සුසන්තා ඩිස්ට්‍රිබියුටර්ස් කෙරමිණිය |
|---|---|---|---|---|---|---|
| 01 | 50 | 50 | Phoenix | 740/= | 790/= | 729/= |

**තීරණය:-**

මානාන ක්‍රීඩාංගනයට Phoenix වර්ගයේ ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, කෙරමිණිය, සුසන්තා ඩිස්ට්‍රිබියුටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.04 ලිපි ද්‍රව්‍ය මුද්‍රණය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන වල මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | ඩී.ආර්. ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | සුමුදු ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|
| 01 | පොත් බෙදා දීමේ වැඩසටහනට අවශ්‍ය අයදුම්පත්‍ර මුද්‍රණය A4 ප්‍රමාණය දෙපැත්ත මුද්‍රණය | 3000 | 2.75 | 3.25 | 3.10 |
| 02 | පොත් බෙදා දිමේ වැඩසටහනට අවශ්‍ය පොස්ටර් මුද්‍රණය 17 ½ *23 2 Colour | 200 | 34/= | 41/= | 44.75 |

**තීරණය:-**

ලිපි ද්‍රව්‍ය මුද්‍රණය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

08 ගෙවීම්

**08.01 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ලෙස රු.159,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:02 පින්නදූව රවුම් පාර පැති බැම්ම ඉදිකිරීම (සෝමරත්න මහතාගේ නිවස අසල) වෙනුවෙන් රු.257,159.62 ක් කෙරමිණිය ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:03 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ අංක 85 පටබැදිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.224,179.44 ක් අංක 85 පටබැදිමුල්ල ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇයි මේ වගේ දේවල් මුලා කමිටුවට ඉදිරිපත් කරන්නේනැත්තේ. දැන් මෙතන තිබෙනවා පොඩි ගැටළුවක්. මොකද සපිරි ගමක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ අංක 85 පටබැදිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.224,179.44 ක් අංක 85 පටබැදිමුල්ල ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට යෝජනා කරනවා. දැන් මේක සපිරි ගමක් යටතේ තමයි ඇවිත් තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා මේ සභාවෙන් මෙයට ලක්ෂට 20ට වැඩිවන මුදල සභාවෙන් ගෙවනවා කියා ඔබතුමලා සියළු දෙනා එකඟතාවයෙන් යුතුව කළා. ඒ අනුව අපිට ප්‍රාදේශිය ලේකම් තුමිය විසින් දන්වා සිටියා මෙන්න මේ අයිතම සඳහා ගිවිසුම් ගත වෙන්න කියා. ඒ ගිවිසුම් ගත වුණා එකට. දැන් වැඩය ඉවරයි. දැන් වැඩේ ඉවර වුණාම මුදල් ගෙවන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය ලේකම් එකට ඔය මුදල් දිලාද

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මෙය අපි විසින් ගෙවන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දෙන්න ඕන .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ කොටස අපේ තාක්ෂණසේවා නිලධාරින් අධික්ෂණය කරලා වාර්තාව දි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකක්ද වාර්තාව දි තිබෙන්නේ. මොකද දන්නවා ද හේතුව. නැතිනම් එගොල්ලන් මුදල් ගෙවා මොකක් හරි හේතුවක් ආවොත් එහෙම

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව සියළුම වාර්තා අපි ප්‍රාදේශිය ලේකම්ට යොමු කර තිබෙන්නේ. ඒ කියන්නේ දෙපාරක් ගෙවන්න වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකක් ද දන්නවාද හේතුව ගැටළුවත් ආවොත්.

**08:04 2020 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසයන්හි දුම්රිය බිල්පත් වෙනුවෙන් රු.22780/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:05 පළාත් බද සිවිල් අභියාචනා මහාධිකරණයේ නඩු අංක SP/HCCA/RA/GA/10/2020 නඩුවට පෙනීසිටීම හා පෙරකලාභී ඉදිරිපත් කිරීම වෙනුවෙන් නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතාට රු.40,000/- ක මුදලක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

පොඩ්ඩක් ඉන්න. 08.05 හා 08.06 දෙකම එකම අධිකරණ වල ගෙවීම් වගයක්. මේවා සභාවලට දමන්නේ . මොනවාද මේ නඩු. අපි දන්නේ නැහැ. මොනවත්. එකක රුපියල් 40000/= ක් තිබෙනවා. ලේකම්තුමිය බලන්න එපැයි. මොනවාද මේ බලපිටියේ අධිකරණයේත් තිබෙනවා. රු.40000/= ක් ගෙවනවා. මොකක්ද මේ නඩු. අපි දන්නේ නැහැනේ. අපි දැනුවත් නැහැ මේ නඩු. මේ සම්බන්ධව මොකක් ද කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ නඩු. නඩු අහන්නමද ? නඩු අවසන් කරන්නද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ නඩුව දකුණු පළාත් බද සිවිල් පළාත් බද මහා අධිකරණයේදි නඩුවක් පවරා තිබෙනවා. බලපිටිය වලගෙදර ගාලු පාරේ අංක 664 හි පදිංචි හදුන්නෙත්ති අතුල ශාන්ත ද සිල්වා පැමිණිලිකරු වශයෙන් ඉඳලා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව පලවෙනි මේකත් දෙක අම්බලන්ගොඩ නගර සභාව විත්තිකරු වශයෙන් බලපිටියේ දිසා අධිකරණයේ ඉඩම් 2747 වශයෙන් එම නඩුව මහා අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. එ සඳහා පෙනි සිටිම වෙනුවෙන්

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

සම්පූර්ණ නඩුව අවසන් වෙනකම් ගාස්තුද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒ කියන්නේ සම්පූර්ණ අවසන් වෙනකම්ද මේ ගාස්තුව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නැහැ. ඇපිල් එකට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

අපෝ සභාපතිතුමා රු.40000/= ක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමිය නිකං කරනවා නම් අපි දෙන්නම්. ඒ කියන්නේ ඉදිරිපත් වෙන්න එපැයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එහෙම අවතක්සේරු කරන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි නිතිඥ මහතුන්ගේ ගාස්තු කියන එක අපිට අඩු වැඩි කරන්න විදියක් නැහැ. අපි අඩු යවන නිතිඥ මහතාගේ එවන ලිපිය අනුව අපිට ගෙවන්න වෙනවා. ඔබතුමිය දන්නවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එත් ෆොක්සි එකක් දමන්න රු.40000/= ක් ගන්නවා කියන්නේ. ඇපිරනස් එකටත් රු.40000/= ක් ගන්නවා කියන්නේ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ ෆොක්සි එකට රු.15000/= යි. ඇපිරන්ස් එකට රු25000/=

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

නඩුවට පෙනි සිටිමට රු.25000/=ක් ගන්නේ නැහැ. අපිට සාමාන්‍ය නිතිඥ මහතෙකු සොයා ගන්න තිබ්බානේ. කවුන්සිලින් වලට වෙන කවුරු හරි යවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉතිං මේහෙමයි. රු500/= ටත් නිතිඥ මහත්වරු ඉන්නවා. රු.25000/=ටත් ඉන්නවා. ලක්ෂ 1000ටත් ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

අනිත් දවසේ මෙහෙම කරනවා නම් අපිත් දැනුවත් කරන්න. අපි නිකං කවුන්සිලින් වලට හොඳ කෙනෙක් ගන්න. ශ්‍රිමාල් විජේසිරි මහතාම කවුන්සිල් වලට ගන්න. සාමාන්‍ය කෙනෙක් දමා ෆොක්සිය දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ කවුන්සිලින් වලට ශ්‍රීමාල් විජේසිරි තමයි. එහි ෆොක්සිය දමා තිබෙන්නේ පලියහපිටිය මහතා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

එත් දිනකට රු.25000/= ක්

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ. එයාගේ ෆොක්සි එක රු.15000/= යි. අරයාගේ ඒවාට තමයි රු25000/= ක් දමා තිබෙන්නේ. එහෙම තමයි තිබෙන්නේ බිල.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

අනිද් දවසේ මේ නිතිඥ කටයුතු කරන කොට අපිටත් කියන්න. අපි දන්න කවුරු හරි මේවා කරන්න. ටිකක් අඩුවට හරි කරන්න. සභාවේ මුදල්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහෙමයි මන්ත්‍රීතුමිය . මේවා ඇවිත් සිවිල් අභියාචනා අධිකරණයේ තිබෙන නඩුවක්. ඉතිං එකට ගැලපෙන නිතිඥ මහතෙකු තෝරනවා මිසක නමට මහත්වරු යවා වැඩක් නැහැ. එකත් තේරුම් ගන්න ඕන. මේක ගාල්ලේ අභියාචනා අධිකරණයේ.

**08:06 බලපිටිය දිසා අධිකරණයේ ඉඩම් 3310 දරණ නඩුවට පෙනීසිටීම වෙනුවෙන් නීතීඥ එච්.දිනිඳු සමරසිංහ මහතා හට රු.40,000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

එක මොනවාට ගන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙකේ තිබෙන්නේ ඉහත අංක 01,02, විත්තිකරුවන් වන අම්බලන්ගොඩ නගර සභාවේ තාක්ෂණසේවා නිලධාරි හා අම්බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් 2015.02.02 දින 2019.05.29 දින දක්වා බලපිටිය දිසා අධිකරණයේ ඉහත අංක දරණ නඩුවට පෙනි සිටිම සඳහා නිතිඥ ගාස්තු අමුණා ඇති බිල්පත සඳහන් කර ඇත. සම්පූර්ණ නඩුවට.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

08.07 යෝජනා කරනවා. මෙහි කොටස් ගෙවිමක් තිබෙන්නේ. සම්පූර්ණ බිල නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කොටස් ගෙවීමක්නම් නැරඹුම් පඩි අදියර 01 කියා තිබෙන්නේ. කර්මාන්තය වෙනුවෙන්. 01 යටතේ එකටද මේ මෙච්චර මුදලක්. ලක්ෂ 15

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය රු.1589109.30

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඉතිං සභාපතිතුමා මේ පඩි ටිකට විතරක් කොච්චර මුදලක් යනවාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුදල් යන්නේ නැතුව පඩි කරන්න බැහැ. මෙහෙමයි මුදල් යන්නේ නැතුව වැඩ කරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ. මුදල් යන්නේ නැතුව සාමාන්‍යයෙන් මෙහෙමයි. අපි ලක්ෂ 20ට මෙහා ඇස්තමේන්තුවක් අපි අනුමත කරායි කියන්න. ලක්ෂ 20ට මෙහා ඇස්තමේන්තුවක් අනුමත කරන්න සාමාන්‍ය යෙන් නගර සභාවේ තාක්ෂණසේවා නිලධාරියෙකු සිටිය යුතුයි 11වන පන්තියේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි හරි එකට ඉංජිනේරු මහතා අත්සන් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඉංජිනේරු මහතා අත්සන් කර තිබුණාට මේකට නිර්දේශයක් කරන්න එපැයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිර්දේශ කර තිබෙන්නේත් එයා. තාක්ෂණසේවා නිලධාරින්ට ලක්ෂ 20 වෙනකම් හදන්න පුළුවන්. අනුමත කිරිමේ බලය තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මට දැන ගන්න තිබෙන්නේ මෙච්චරයි. මේවා හදලා ගෙවන එක වෙනම කතන්දරයක්. අපිට දැන ගන්න ඕනේ මේ චක්‍ර ලේඛයක් තිබෙනවා ප්‍රදේශීය ලේකම් මුදල් කියා. එහෙත් මෙහෙටත් එවා තිබෙනවා. පළාත් පාලන මේවා එකට. මෙහි තිබෙනවා මූල්‍ය වටිනාකම ලක්ෂ 20ට අඩු ඒවාගේ ඇස්තමේන්තු සකස් කිරිමේ බලතල පැවරේ. කොන්දේසි 1 වන ශ්‍රේණියේ ශ්‍රි ලංකා තාක්ෂණයේ 11 පන්තියේ තාක්ෂණසේවා නිලධාරින් සකස් කරන ඇස්තමේන්තු දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල පළාත් පාලන ආයතනවල සිටින 11වන ශ්‍රේණියේ

තාක්ෂණසේවා නිලධාරින් මෙයට අදාල වේ කියා තිබෙනවා. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 11 ඒ හෝ 1 පන්තියේ නිලධාරියෙකු විසින් නිර්දේශ කළ යුතු අතර ඒ සඳහා අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත කිරීමෙන් ලබා ගත යුතුය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය දිස්ත්‍රික් ඉංජිනේරු මහතාට යවා තිබෙන්නේ. ඔබතුමා කියන එක හරි. මෙහි දිස්ත්‍රික් ඉංජිනේරු මහතා අත්සන් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ එක හරි. දිස්ත්‍රික් ඉංජිනේරු අත්සන් කරයි කියන්න. අනිත් එවාටත් අපි හදනවානේ සමහර ඒවා. ඒක සම්බන්ධව මට ගැටලුව තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි ඔබතුමා කියන නීත්‍ය මටත් අදාලයි. මේනගර සභාවේ සිටින හැමෝටම අදාලයි.ඒ අදාලතාවය මත කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙනම් අපි මේවාට අපේ අනුමැතිය දෙන්නේ මුල්‍ය කමිටුවට ඉදිරිපත් කරන්න. මං එකට

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුල්‍ය කමිටුවට කර්මාන්ත දමන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඇයි දමන්නේ නැත්තේ. ලක්ෂ 5ට අඩු ඒවා විතරයි දමන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුල්‍ය කමිටුවට බලය පවරා තිබෙන්නේ ලක්ෂ 5ට අඩු විතරයි.කෝ ගණකාධිකාරි මහත්මිය. අපි බලතල පවරලා තිබෙන්නේ එහෙමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ ලක්ෂ 5 වෙනකම් විතර ද මන්ත්‍රිවරුන්ට බලන්න පුළුවන්. එතකොට කර්මාන්ත ගෙවීම් කරන්නේ කවුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සභාවෙන් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි සභාවෙන් කරන එක හරි. අනුමත කරන්න එපැයි මේක. අනුමත කරන එකේ මෙය හරිද වැරදිද විතරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මන්ත්‍රීතුමා ලක්ෂ 5ට අඩු මිලදී ගැනීම් විතරයි මුල්‍යා කමිටුවට බලය දී තිබෙන්නේ මේ සභාව. ඊට වැඩිය බලය දෙන්න ඕනේ නම් ආපහු යෝජනාව වෙනස් කරන්න. එච්චරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක හරි. ඔබතුමා කියන එක. අපිට මේකට ලක්ෂ 15ට අනුමැතියත් දෙන්න බැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවට දෙන්න තමයි තිබෙන්නේ. අපිට දිය හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේක හොයා ගන්න ඕනේ. මෙක කෙරෙන්නේ කොහොමද? අපිට අයිතියක් නැද්ද මුදල් මෙච්චර ගෙවනකොට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක තමයි කියන්නේ  මේ තියෙන්නේ බලන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි කියන්නේ බලලා ඉවර වෙලා ගෙවන්න කියා. දැන් නෙමේ මේවා කලින් බලන්න ඕන ඒවා. දැන් ගෙවනකොට අපි බලන්නේ කොහොමද? අපි හරි . ඔබතුමලා ගෙවා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.08 යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

08.07 ට විරුද්ධ වෙනවා. 08.08 කිවුවේ නැහැනේ. 08.08ටත් විරුද්ධයි අපි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.07 මොකක්ද කියන්නේ. බෙදීමක් ඉල්ලනවාද ඔබතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපි බලා තමයි අපි අනුමැතිය දෙන්නේ. 08.07 යි 08.08 යි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.07 යි සඳහා මා ඡන්දය විමසනවා. විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. විරුද්ධ අය 09 යි. පක්ෂ ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂ 08 යි ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කෝ. සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා මේකට ඡන්දය දෙන්නේ නැද්ද? මෙහෙමයි මන්ත්‍රීතුමියලා දැන ගන්න ඕන. ඔයා වඩිවෙන්න. මං කියන දේ අහන්න. මේ සභාව

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔයා කියන දේ අහලා තමයි මේ ඡන්ද විමසීම කළේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුල්‍ය කමිටුවට බලය දී තිබෙන්නේ ගෙවීම් කර්මාන්ත නෙමේ. සාමාන්‍ය සැපයුම් විතරයි.එතකොට මුල්‍ය කමිටුවට මේක වැටෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සභාව මේ සංස්කෘතියට යන්න එපා. අපි යම්කිසි පැහැදිලි කිරීමක් ඉල්ලනවා නම් එකට පසුබට වෙන්න එපා. එය පැහැදිලි කිරීම අපිට දෙන්න. ලිපිලේඛන අපිට දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ලිපිලේඛණය දැන් එවුවා ඔතනට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපි කිසි කලබලයක් නැහැනේ. අපි ඔබතුමා එක්ක බොහොම සහායෝගයෙන් එකතුවෙන් වැඩ කරනවා. ඇයි ඔච්චර ඔහොම කලබල වෙන්නේ ඇයි? ඒ සංස්කෘතියට යන්න එපා. මේක එකට ගියොත් වැරදි පූර්වාදර්ශයක් වෙනවා. එමනිසා මේ ආදාල ලියකියවිලි තිබෙනවා නම් ඇයි මෙහෙම වෙන්නේ මෙච්චර මුදලක් යන්නේ ඇයි ? ඒ සැලැස්ම පැහැදිලි කරන්න. කඩාගෙන යන්න එපා ඔහොම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැරදි වැටහීමකින් කටයුතු කළානම්. ඔය දිස්ත්‍රික් ඉංජිනේරු අත්සන් කර තිබෙන්නේ. මා මේක විශ්ලේෂණය කරන්න. අද එළිවෙනකම් වුණත් ඉන්නවා. දිස්ත්‍රික් ඉංජිනේරු අත්සන් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපිට එහෙම ඕන නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයාට ඕනේ නැතු වුණාට එහෙනම් අනිත් අය බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , දැන් ඔබතුමා ඡන්ද විමසීම් කළා. ඔබතුමා මේ හැමෝගෙම සහායෝගය ගෙන මෙය කරන්න බලන්න. අපිට මේ සියළු දේවල් වලට අනුමැතය දෙන්න බැහැ. ඔබතුමා අපිට නවක මන්ත්‍රිවරු විදියට ඇහුම් කන් දෙනවා. අපි ගොඩක් සතුටු වෙනවා . ගොඩක් ස්තුතියි. අපි මොනවා හරි කිවුවාම අපිට සතුටු දායක ප්‍රතිචාර දක්වනවා. ඒ වගේම සභාවේ මන්ත්‍රිවරුන් එකතු කරන් ඔබතුමාට මේක ලස්සනට අරගෙන යන්න පුළුවන්. සියළු දේවල් වලට අපි කවුරුවත් වෙනුවෙන් පෙනි සිටින්නේ නැහැ. කිසි කෙනෙක් කියන විදියට පෙනි හිටින්නේ නැහැ. මාගේ හෘද සාක්කියට එකඟව මා වැඩ කටයුතු කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මේ කොන්ත්‍රාත් වල මාගේ සම්බන්ධයක් නැහැ. එමනිසා මට මෙය අනුමත කලත් එකයි නැතත් එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නමුත් මොකක් හරි වුණොත් අපි අධිභාරයට පත්වෙනවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක අත්සන් කර තිබෙන්නේ ඉංජිනේරු මහතා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මේ වේලාවේ ඔක පෙන්නලා වැඩක් නැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් තමයි මේ යෝජනාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

යෝජනාව දමලා මෙයට ඇමිනුමක් හරි තියෙන්න ඕන. අපිට බලන්න. මොකද මෙක විනිවිදභාවයක් තියෙන්න එපැයි . ඔබතුමාගේ සභාපතිත්වයටවත් , සභාවේ වැඩ කටයුතුවත් පස්සට දමන්න කරන්න වැඩක් නෙමේ. මොකද අපට කවදා හරි දවසක ඔබතුමා මෙතන පුටුවේ ඉදිවි. නැතිවෙයි. කවදාහරි නැතුවූ දිනක අපි මන්ත්‍රීවරු විදියට තේරි පත් වුණොත් මේ දේවල් වලට අධිහාරය වුණොත් මොකක්ද තිබෙන ගැටළුව. ප්‍රශ්න තිබෙනවා මේ සභාවට. එමනිසා ඔබතුමා සමඟ කිසිම ගැටලුවක් නැහැ. වසර තුනක් තිස්සේ ගරු උප සභාපතිතුමා කිවූ පරිදි කිසිම මන්ත්‍රීවරු පිරිසක් මේ විදියට උදවූ කර නැතුව ඇති. අප අවංකවම හෘද සාක්කියට එකඟව අපි අම්බලන්ගොඩ නගරයේ දියුණුව වෙනුවෙන් වැඩ කටයුතු කරන්න සභායෝගය ලබා දී තිබෙනවා. එහෙම නැතුව එක්කෙනෙකුගේ ඇහුම්කන් දීම් වලට යටත්ව නෙමේ. එමනිසා ඔබතුමාට මේ ගරු සභාව ලස්සනට ගෙන යන්න පුළුවන්. එමනිසා මන්ත්‍රීවරුන්ගේ ගරුත්වයත් තියාගෙන ඔබතුමා ඒ සභායෝගය තියා ගෙන කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. මොකද අපිට බැහැ අධිහාර වෙන්න. ඔබතුමා පළාත් සභා ගියොත් එහෙම අපි මන්ත්‍රීවරු විදියට මෙතැන හිටියොත් එහෙම අපිට අධිහාර වෙලා මේ ප්‍රශ්න වලට මුහුණ දෙන්න බැහැ. එමනිසා ඔබතුමාට දෙන්න පුළුවන් උපරිම සභායෝගය ලබා දෙනවා. ඔබතුමා සමඟ පුද්ගලික තරහක් නැහැ. එමනිසා අපි මන්ත්රිවරුන් විදියට අපේ අයිතින් දිනා ගන්න ඕන.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පිළිගන්නවා. මේ සභාවේ ඒ ගෙවීම් සියල්ලම දෙන්න මේ සභාව සතියකට කල් තියෙනවා. සියළුම මන්ත්‍රීවරුන්ට ඒ කාලය ඇතුළත මේ ගෙවීම් වල වාර්තා ටික එවාවි. ලබන අඟහරුවාදා 2.30ට කැඳවනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

අනේ සභාපතිතුමා එහෙම කරන්න එපා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපේ නෝනා අද නිවාඩු දාලා ගෙදර ඉන්නේ. ඉතිං හැමදාම නිවාඩු දෙන්නේ නැහැනේ. ගිය අඟහරුවාදාත් එහෙමයි. ඊට ඉස්සෙල්ලා අඟහරුවදත් එහෙමයි. ඊළඟ සභාවට මං එන්නේ නැති වෙන්නත් පුළුවන්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහෙමයි මේක මාගේ පෞද්ගලික මේකක් නෙමේ. මෙහි ඉංජිනේරු මහතා අත්සන් කර තිබෙනවා නම් ඔගොල්ලන් මේ ලිපි ගොණුව බලා ඉවර වෙලා මේවා කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

අපි අත් දෙකම ඔසවා කියනවා මේ වැඩ කරන්න කියා. අපිටත් බයයි අධිහාරය වෙයිද කියා. අපි හරි කැමතියි ක්‍රිඩාංගණයේ වැඩ කරනවාට. වෙලා තියෙන්නේ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ කකුළෙන් අදිනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

අපිට බැරිද එහෙම කරන්න. මා මේ දන්නේ නැති නිසා අහන්නේ. මේ ඔක්කොම වියදම් කරන ඒවා මුල්‍යා කමිටුවට දමා ඊට පස්සේ සභාවට දමා ගන්න බැරිද? එතකොට අපි අනුමත කරනවානේ. අපි දන්නවා මුල්‍යා කමිටුව යමක් බලා වැඩ කරන්නේ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉතිං යෝජනා කරන්න. මාත් කැමතියි ගෙවීම් සියල්ලම මුල්‍යා කමිටුවට දමනවාට. එහෙනම් යෝජනා කරන්න. කවුරු හරි මන්ත්‍රිවරයෙක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් සභාව කල් තියනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ දැන් සභාව පවත්වාගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා යෝජනා කරනවා මෙසියළුම ගෙවීම් මුල්‍යා කමිටුවට යෝජනා කරලා මුල්‍යා කමිටුවේ අනුමැතිය ගත් පසු සභාවට දැම්මාට පසු අපි දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සභාව මා ඉල්ලිමක් කරනවා . නැවත වරක් කල් තියන්න එපා කියා. මොකද මේ කොන්ත්‍රාත්කරුවන් විශාල අර්බුදයකට හසු වෙනවා. මේ කොන්ත්‍රාත්කරුවන් වැඩ කරලා මුදල් ගන්නේ. එමනිසා අපි කවුරුත් ඒ පැත්තත් බලන්න ඕන. සභාව නැවත වරක් ආරම්භ කරන හැටියට ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒපි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රාහුල මන්ත්‍රීතුමා පොඩ්ඩක් නිහඬ වෙන්න. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මෙය සභාවක් විදියට මෙහෙය වන්න කියා. ඔබතුමා සභාපතිතුමා විදියට. මෙය කෝලාම් මඩුවක් වගේ. කිසිම හික්මීමක් නැහැ. විනයක් නැහැ. එක පාරක් එක්කෙනාට කතා කරන්න දෙන්න. දැන් මා කවදාවත් එකපාරට වඩා කතා කරන්නේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ලක්ෂ්මි මන්ත්‍රීතුමිය සමඟ එකඟ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒපි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මේක කෝලමක්නේ. විහිලුවක්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ සභාව 4 වතාවක් මෙහෙයවපු සභාපතිවරයෙක්. මා දැක්කේ නැහැ මේ කාලය තුල මේ වගේ සභාවක් තිබුණා කියා. අපි පුරුදු වුණේ හිටපු මන්ත්‍රිවරුන්ගෙන්. මේ සභාවට එනවිට ගරු සභාපතිතුමාට ගරු කරලා එන්න ඔනේ. හිසනමාලා . මෙතනට එනකොට එහෙමයි එන්න ඕනේ. යනකොට එහෙමයි යන්න ඕනේ. මේ සභාවේ නම් ජීවිතයට මේ සභාව පටන් ගත් දිනයේ සිට මා දුටුවේ නැහැ. එක මා හිතනවා ගරු සභාපතිතුමාගේ අඩු පාඩුවක්. සභාපතිතුමා මුල සිට එය නිවැරදි කළේ නැහැ. එක තමයි මූලික කාරණය වුණේ. අද අපි අපේ ජංගම දුරකථනය කාර්යාල කාර්ය සහායක මහතාට හරි භාර දෙන්නේ ඒ අපිට තිබුණ පුරුදු නිසා. මේ දුරකථන නාද වෙනවා ඕන තරම් මේ මේස උඩ. ඉතිං ඒවා මා ගරු සභාපතිතුමාට මීට කලිනුත් වරක් කියා තිබෙනවා. මේ ගරු සභාව මේ වසරේ හරි හරි මගට ගන්න.මේක මේ විදියට හැසිරෙන්න දෙන්න එපා මන්ත්‍රිවරුන්ට. එමනිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

ඔබතුමා මටද එය කියන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමා පරණ මන්ත්‍රිවරයෙක්. ඔබතුමා දන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහකා කතා කරමින්</u>**

මන්ත්‍රිවරු කියන්න එපා. එමනිසා

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. රාහුල මන්ත්‍රීතුමා වඩිවෙන්න. නිකං කෑගහන්නේ. මන්ත්‍රිවරයෙක් කතා කරන කොට එකට විරුද්ධව කතා කරන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එමනිසා තමයි මේ සභාව නැවත වරක් නිවැරදි මාර්ගය ගන්න. මේ සභාව අන්තිම නරක පැත්තට ගිහින් තිබෙන්නේ දැන්. කිසිම මන්ත්‍රීවරයෙකුට මේ ගරු සභාපතිතුමාට ගරු කරන්න දන්නේ නැහැ. මා කියන්නේ මේ පැය ගණන අපි අරුණ ප්‍රදිප්ට නෙමේ ගරු කරන්න ,ඕනේ. මේ ගරු සභාවේ සභාපතිවරයා හැටියට. අම්බලන්ගොඩ නගර සභාවේ. මේක කරන්නේ නැහැ. මා දකින්නේ නැහැ. මා 97 වසරේ සිට මා මෙය නියෝජනය කරනවා. මා හිතන්නේ නැහැ කිසිම මන්ත්‍රීවරයෙක් මේ සභාව මේ විදියට වැඩ කරලා නැහැ. සභාව නැවත වරක් හරි මාර්ගයට ගන්න.මේ අවුරුද්දේ හරි ගන්න කියන මේ ඉල්ලිමකරනවා. සභාව නැවත වරක් පවත්වා ගෙන යන ලෙස ඉල්ලිම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්**

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමා එකවරක් කතා කළා. වාඩිවෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා කතා කරන්න ගියේ. මට කතා කරන්න අවස්ථාවක් දුන්නේනැහැ. මමත 2011 සිට මේ දක්වා ඔබතුමලා එක්ක ඉන්නවා. ඔබතුමා මාත් එක්ක ඉන්න දෙවැනි වරට සිටින සභාපතිවරයා. ඊට කලිනුත් ඔබතුමා මේ සභාවේ ඉඳලා තිබෙනවා. මේ වගේ අපි මොකක් හරි විනයානුකුල හැසිරිමක් තියෙන්න ඕන. එක මාධ්‍ය වලින් දකිනවා. ගැලරියේ ගමක මිනිසෙකු පැමිණ සිටියොත් හරිම අශෝභනයි අපේ හැසිරීම් රටාව . එක පාරට එක්කෙනෙකුට වඩා කතා කරන්න එපා. ගැටුම් ඇති කර ගන්න එපා. ගැටුමක් තිබෙනවා නම් අපි 21 සමඟ කිසිම ගැටුමක් නැහැ. ගැටුම ඇති වෙන්නේ නගර සභාව සම්බන්ධයෙන්. අපි කිසිම මන්ත්‍රීවරයෙකුට පුද්ගලික ගැටලු නැහැ මෙතන.  මෙ නගරයේ දියුණුව පතා මේ නගරයේ යහපත තකා තමයි මේ තර්ක විතර්ක කරන්නේ . එකනිසා ලොකු ගැටලුවක් ඇති වෙන්න දෙන්න එපා. එමනිසා මා තමුන්නාසේලාගෙන් ඉල්ලා සිටිනවා මේ සභාව වැදගත් විදියට ඉදිරියට ගෙන යන් කියා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ලක්ෂ ගණන් දමා තිබෙන්නේ . මා ඉල්ලිමක් කරනවා ගරු මන්ත්‍රීවරුන්ට ගිහින් මේ හදන තැන් අධික්ෂණය කරන්න කියා. එතකොට වැටහිමක් ඇතිවෙනවා නේද මේවා පිළිබඳ . ඒ සම්බන්ධව. එහෙම අධික්ෂණය කරලා මේ සම්බන්ධව කතා කළහොත් හොඳයි. ඒ

වුණත් මේ කොටසට ගෙවන්න පුළුවන්. මුදල් වියදම් කර තිබෙන්නේ මොන කොටසටද කියා. ඒ සම්බන්ධව අවබෝධයක් ගන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

අපි ඉංජිනේරුවෝද?

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ඉංජිනේරුවෝ නොවුණත් සාමාන්‍ය අවබෝධයක් ලබා ගන්න පුළුවන්. අපි මෙහි විස්තරයක් ඇත්තෙත්නැහැ. දන්නේත් නැහැ. නිකං බොරුවට කෑගසා වැඩක් නැහැ. රාහුල මන්ත්‍රීතුමා බොරුවට කෑ ගසනවා. එහෙම කෑ ගැසුවාම සභාව ගෙනියන්න බැහැ. ඔබතුමා හැම එකටම කතා කරනවා. රණ්ඩුවටමයි කතා කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රාහුල මන්ත්‍රීතුමා කට වහන්න. නිශ්ශබ්ද වෙන්න. වාඩි වෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ඔබතුමා රණ්ඩුවට කතා කරන්නේ. විස්තරයක් අහන්න එහෙම සභාවක් ගෙනියන්න බැහැනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රාහුල මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න. ඔයා වාඩිවෙන්න. ඔයා හරි විදියට හැසිරෙන්න.

**08:07 මහජන ක්‍රීඩාංගනයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීමේ (Pavillion) කර්මාන්තය වෙනුවෙන් රු.1,500,000/- ක් පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි (පළමු කොටස ගෙවීම) ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ඡන්ද 08 ක් සහ විපක්ෂව ඡන්ද 09 ක් ලැබීම හේතුවෙන් එම ගෙවීම ප්‍රතික්ෂේප විය.**

| | |
|---|---|
| පක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා |

| | |
|---|---|
| | ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා |
| විපක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පී.කේ. ද සිල්වා මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය |
| ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |
| රැස්වීමට පැමිණ ජන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා |

- ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා පස්වරු 5.00ට පමණ සභා ගර්භයෙන් පිටවීම.

**08:08 මහජන ක්‍රීඩාංගනයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීමේ (Pavillion) කර්මාන්තය වෙනුවෙන් රු.463,882/- ක් ඕකන්ද ජෞෂ්ය පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:09 නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු පද්ධතියේ කොටසක් ඉදිකිරීම වෙනුවෙන් රු.144933.65 ක් තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:10** **මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසල නැරඹුම් වේදිකාවේ වහලය සඳහා ආධාරක කුළුණු ඉදිකිරීම වෙනුවෙන් රු.689248.96 ක් ඔකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම , ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය පස්වරු 5.00ට පමණ සභා ගර්භයෙන් පිටවීම

**08:11** **අම්බලන්ගොඩ බස් නැවතුම්පොල පොදු වැසිකිළිය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම (අදියර 02) වෙනුවෙන් රු.765000/- ක් විලේගොඩ ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම (පළමු කොටස ගෙවීම) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:12** **ඇණවුම් අංක 2549 යටතේ ඇණවුම් කරන ලද 252-0730 දරණ රථයට ටයර් 04 වෙනුවෙන් රු.80256/- ක මුදලක් සුමිත් මාර්කටින් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:13** **ඇණවුම් අංක 2550 යටතේ LL 7642 රථයට ඇණවුම් කරන ලද ටයර් 03 ක්, රිම් ටේප් 06 ක්, ටියුබ් 06 ක් වෙනුවෙන් රු.50694/- ක් සුමිත් මාර්කටින් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:14** **කාර්ය නිමකිරීමේ පත්‍ර අංක 0541 යටතේ E පුස්තකාලයේ ඇති වායු සමීකරණ යන්ත්‍රය අලුත්වැඩියාව වෙනුවෙන් රු.35500/- ක මුදලක් Thushan Air Engineering ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා පස්වරු 5.10ට පමණ සභා ගර්භයෙන් පිටවීම

**08:15** ඇණවුම් අංක **2525** යටතේ මුද්‍රණය කරන ලද ත්‍රීරෝද රථ වාර්ෂික බලපත්‍ර **230** ක් වෙනුවෙන් රු.**15525/-** ක මුදලක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:16** ඇණවුම් අංක **2530** යටතේ ඇණවුම් කරන ලද ගෑස් වෙනුවෙන් රු.**39920/-** ක් එස්.එච්.එන්.අරුණ ශාන්ත ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**08:17** ඇණවුම් අංක **2525** යටතේ මුද්‍රණය කරන ලද ප්‍රජා මණ්ඩල පෝස්ටර් **325** ක් වෙනුවෙන් රු.**10562.50** ක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:18** ඇණවුම් අංක **2538,2539,2540** යටතේ ඇණවුම් කරන ලද භාණ්ඩ වෙනුවෙන් රු.**27204/-** ක් **B.K.S.Company(pvt)ltd** වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:19** ඇණවුම් අංක **2546** යටතේ මුද්‍රණය කරන ලද මුදල් භාරගැනීමේ කුවිතාන්සි පොත් **75** ක් වෙනුවෙන් රු.**24225/-** ක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:20** ඇණවුම් අංක **2548** යටතේ මුද්‍රණය කරන ලද කොවිඩ් **19** වසංගත රෝග තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීමේ අත්පත්‍රිකා **10000** ක් හා වර්ණ පෝස්ටර් **200** ක් වෙනුවෙන් රු.**49750/-** ක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:21** ඇණවුම් අංක **2537** යටතේ ඇණවුම් කරන ලද පරිගණක ටෝනර් සඳහා රු.**135006/-** ක මුදලක් සී/ස.රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:22** **ඇනවුම් අංක 2532 යටතේ ඇණවුම් කරන ලද සෞඛ්‍ය අංශයට අවශ්‍ය උපකරණ වෙනුවෙන් රු.113292.86 ක මුදලක් සී/ස.රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:23** **ඇණවුම් අංක 2551 යටතේ ඇණවුම් කරන ලද විෂබීජ නාශක අත් සේදුම් දියර ලීටර් 20 ක් ලබාගැනීම වෙනුවෙන් රු.20000/- ක මුදලක් නයන රංජන සේල් පොල වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:24** **නිරෝධායනයට ලක්කරන ලද පවුල් 16 ක නිවැසියන්ගේ පරිහරණය සඳහා ලබාදුන් සහනාධාර සඳහා රු.73760/- ක මුදලක් අම්බලන්ගොඩ විවිධසේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:25** **කම්කරු කාර්යාලය විසින් ඒස්.ඒල්.ඒච් නන්දසෝම මහතා වෙත 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ 12 වගන්තිය යටතේ ගෙවීමට නියෝග කර ඇති රු.95076.07 ක පාරිතෝෂික දිමනාව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

**ගරු සභාපතිතුමනි, 08.26**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.26 නැහැනේ. 26 ක් නැහැ. අපේ තිබෙන්නේ 25ට මේ සභාවේ මේ න්‍යාය පත්‍රය හදන්නේ කවුද ? ඒ නිලධාරි ඉන්නවාද ? ඔය ළමයා නේද? ඔය ළමයාට මා කලිනුත් කිවුවානේ මේක හරියට හදන්න කියා. දැන් මේ මගේ එකේ 08.25. මන්ත්‍රිවරුන්ගේ එකේ 08.26

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකේ වෙලා තිබෙන්නේ 2020.11.10 සංශෝධිත න්‍යාය පත්‍රයට ඇතුළත් වූ කරුණු කියා තමයි එහි තිබෙන්නේ.

## 09. ගිණුම්

2020 සැප්තැම්බර් මස පොදු ගිණුම්, වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 සැප්තැම්බර් මස පොදු ගිණුම්, වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය සභාගත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය මා ස්ථිර කරනවා.

**තීරණය**

2020 සැප්තැම්බර් මස පොදු ගිණුම්, වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුවඒකමතිකව සභා සම්මත විය.

## 10. ඇස්තමේන්තුව

**10.01 රොබට් වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.620,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

රොබට් වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.620,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය. (2020 අයවැය ඇස්තමේන්තු 03)

**10.02 පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය තාර දැමීම (අංක 144 නිවස සිට 144/3 නිවස දක්වා) සඳහා රු.400,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය තාර දැමීම (අංක 144 නිවස සිට 144/3 නිවස දක්වා) සඳහා රු.400,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය. (2020 අයවැය ඇස්තමේන්තු අංක 04)

**10.03 පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සඳහා (අංක 104 චාමර නිවස අසලින් ආරම්භය) රු.520,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි.**

**තීරණය-**

පොල්වත්ත පාරෙන් අතුරු මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම සඳහා (අංක 104 චාමර නිවස අසලින් ආරම්භය) රු.520,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය. (2020 අයවැය ඇස්තමේන්තු අංක 05)

**10.04 මාර්ග සති පාර ඉතිරි කොටස කාණුව සහ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.4,100,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

මාර්ග සති පාර ඉතිරි කොටස කාණුව සහ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.4,100,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.05 නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල මායිම් තාප්පය ඉදිකිරීම සඳහා රු.850,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල මායිම් තාප්පය ඉදිකිරීම සඳහා රු.850,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.06 බෝ ගස අසල සිට ප්‍රධාන පාර දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

බෝ ගස අසල සිට ප්‍රධාන පාර දක්වා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.1000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.07 නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ සිදුකිරීම සඳහා රු.500,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ සිදුකිරීම සඳහා රු.500,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

11. වෙනත් කරුණු

12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

- ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා පස්වරු 5.25ට පමණ නැවත සභා ගර්භයට පැමිණීම

**12.01 කාර්ය මණ්ඩලය සඳහා නොමිලයේ අභ්‍යාස පොත් ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කාර්ය මණ්ඩලය සඳහා නොමිලයේ අභ්‍යාස පොත් ලබාදීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය අනුමත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පොත්ලබා දිමේදි ග්‍රාම නිලධාරිගේ හා විදුහල්පතිගේ නිර්දේශ අවශ්‍ය නැහැ නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අවශ්‍යයි. ඔබතුමා වෙනදා කර ගත්විදියට කර ගන්න.

**තීරණය-**

කාර්ය මණ්ඩලය සඳහා නොමිලයේ අභ්‍යාස පොත් ලබාදීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.02 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය විවෘත කිරිම සම්බන්ධව ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය විවෘත කිරිම සම්බන්ධව ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් එවා ඇති ලිපිය . මේ ගැන අපි කලිනුත් කතා කළා. එය කල්දමා තිබෙනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය විවෘත කිරිම සම්බන්ධව ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.03 ආයුර්වේද වෛද්‍යතුමිය විසින් කොරෝනා වසංගතය රෝගය සඳහා භාවිතා වන ප්‍රතිශක්ති වර්ධක පානය වන සුවධරනි ප්‍රතිශක්ති වර්ධක පානය ලබා දිම සඳහා රු.50000/= ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ප්‍රතිශක්ති වර්ධක පානය වන සුවධරනි ප්‍රතිශක්ති වර්ධක පානය ලබා ගැනීම. එම් කුරුප්පු නගර සභාවේ අයුර්වේද වෛද්‍යතුමිය. මේ දිනවල පැතිර යන කොරෝනා වසංගතය සහ භාවිතා වන සුවධරණි ප්‍රතිශක්ති වර්ධන පානය මෙම ආයතනයට ලබා ගැනිමට අදහස් කර ඇත. දෛනිකව මෙම ආයතනයට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන් මෙම ඖෂධය ගැන විමසන අතර

අඩු ආදායම්ලාභි අත්‍යවශ්‍ය පුද්ගලයන් හට මෙම පානය ලබා දිමට සුදුසු බව වැටහෙන හෙයින් මෙම ඖෂධය අප ආයතනයට ලබා ගැනීමට අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන වෙන්කිරිමට ඔබවිසින් කාරුණික වන ලෙස ඉල්ලා සිටි. මෙම ඖෂධ ග්‍රෑම් 100 ක මුදල රු.120/= ක් වන අතර ඒ සඳහා රු.50000/= ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එක හොඳයි. එය ලබා දෙන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි රු.50000/= ක මුදලක් වෙන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා ගියා හොයන්න. රාජගිරියේ පවා. ටිකක් ගන්න ආමාරුයි. ඒ අයට ගන්න පුළුවන් නම් ටිකක් වැඩිපුර ගෙන්වන්න. අපිටත් පාවිච්චි කරන්න පුළුවන් ඇත්තටම.

**තීරණය-**

ආයුර්වේද වෛද්‍යතුමිය විසින් කොරෝනා වසංගතය රෝගය සඳහා භාවිතා වන ප්‍රතිශක්ති වර්ධක පානය වන සුවධරනි ප්‍රතිශක්ති වර්ධක පානය ලබා දිම සඳහා රු.50000/= ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති ඉල්ලිම පරිදි එය ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 ආයතනයට අවශ්‍ය නිෂ්පාදිත ඖධධ ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලිමට අනුව ඒ සඳහා රු.454,290/= ක මුදලක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ආයතනයට අවශ්‍ය නිෂ්පාදිත ඖධධ ලබාගැනීම සඳහා රු.454,290/= ක ආයුර්වේද බෙහෙත් වගයක්. එය ලබා දීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න

**තීරණය-**

ආයතනයට අවශ්‍ය නිෂ්පාදිත ඖධධ ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලිමට අනුව ඒ සඳහා රු.454,290/= ක මුදලක් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 නාගරික සීමාවේ මාර්ග අලුත් වැඩියාව සඳහා අවශ්‍ය තාර සහ ගල් ලබා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් යොමුකරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නාගරික සීමාවේ මාර්ග අලුත් වැඩියාව සඳහා අවශ්‍ය තාර සහ ගල් ලබා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. 80/100 තාර බැරල් - 50, අඟල් 1 ½ ගල් කියුබ් 30, අඟල් ¾ ගල් කියුබ් 20, අඟල් ¼ චිප් ගල් කියුබ් 20 වශයෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

නාගරික සීමාවේ මාර්ග අලුත් වැඩියාව සඳහා අවශ්‍ය තාර සහ ගල් ලබා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතාගේ ඉල්ලීම පරිදි පහත ද්‍රව්‍යයන් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- 80/100 තාර බැරල් - 50
- අඟල් 1 ½ ගල් කියුබ් 30
- අඟල් ¾ ගල් කියුබ් 20
- අඟල් ¼ චිප් ගල් කියුබ් 20

**12.06 2021 වර්ෂයට අදාළව නගර සභාවේ වැඩ හා සේවා සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති ලිපිගොණුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2021 වර්ෂයට අදාළව නගර සභාවේ වැඩ හා සේවා සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

2021 වර්ෂයට අදාළව නගර සභාවේ වැඩ හා සේවා සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.07 ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ජී. සෝභිත රංජිත් මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු අනුමත කරදෙන මෙන් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු අනුමත කර දෙනමෙන් ඉල්ලා සිටිනවා. එය අනුමත කරනවා.

**තීරණය-**

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු අනුමත කරදෙන මෙන් ඉල්ලා ඇති ලිපියට අනුව නිවාඩු අනුමත කිරිම සුදුසු බවට බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා පස්වරු 05.30 ට පමණ නැවත සභා ගර්භයට පැමිණියහ.

## 12.08 එළවළු හා පළතුරු වෙළදාම් කිරිම් සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

**තීරණය-**

එළවළු හා පළතුරු වෙළදාම් කිරිම් සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය පරිදි මේ සඳහා ආදායම් පරික්ෂක මහතුන් ලවා ඔවුන් ඉවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

# වෙනත් කරුණු

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපේ ප්‍ර දේශයට තිබෙනවා ව්‍යසනයක් වෙච්ච වඳුරු කරදරය. එමනිසා මේ වනවිට අපේ විථී ලාම්පු ඉල්ලා වැටෙන බව මීට වසර 2කට පෙර මා කිවුවා. ඒ විථී ලාම්පු යථාත්වත් කරන්නට බැකට් වගයක් තිබෙනවා කියා විදුලි අංශ ප්‍රධානියා කියා තිබුණා. අන්න ඒ බැකට් සවිකිරිම තාම බැරි වුණා. අවුරුදු දෙකක් පමණ වෙනවා. එමනිසා එම සවිකිරිම අපිට කඩිනම් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. පහන් කැරකැවිලා ආලෝකය යන්නේ කැලයට. ඒ නිසා අන්න ඒ බැකට් එක අපිට ගෙන්වා දෙන්න. කලින් ගෙනත් තිබුණා. වෙනත් මාදිලියක එවා . එමනිසා ඒවා දමන්න බැරි වුණා. විදුලි අංශ ප්‍රධානියාත් ඉන්නවා අසන්නයේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මට කතා කරන්න තිබෙන්නේ තල්ගස්ගොඩ ත්‍රිරෝද රථ ගාල ගැන. තල්ගස්ගොඩ ඩිපෝ එක ළඟ තිබෙන ත්‍රිවිල් රථගාල ගැන. එම රථගාල සම්බන්ධව ගැටළුවක් ඇතිවෙලා තිබෙනවා. එය නිරාකරණය කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකද එය නිත්‍යානුකූලව

ගරු සභාවෙන් අනුමත වූ ත්‍රිරෝද රථගාලක්. නමුත් සභාව හැල්ලුවට ලක් වෙනවා. ත්‍රිවිල් කමිටුවෙන් ගත් තින්දුවක් . සභාවෙන් අනුමත කර තිබෙනවා. නමුත් පිටස්තර පුද්ගලයන්ට ඕන ඕන විදියට මේ කමිටුව ගත් තින්දු කරන්න බැහැ. එමනිසා ඉල්ලීමක් කරනවා එය ක්‍රියාත්මක කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට අපේ සහෝදර පාර්ශිකයනුත් ඒ වගේම අපේ අම්බලන්ගොඩ නගර වාසින් වෙළදාම් කරන අය අපිත් එක්ක ගොඩක් සුහදත්වයෙන් සිටින කොටසක්. ඔවුන් අපිට ලිඛිතවත් ඉදිරිපත් කළා. වරින් වර ඇවිත් වාචිකවත් ඉදිරිපත් කරනවා. ඔවුන්ගේ වෙළදාම් අඩාල වෙලා තිබෙනවා. අම්බලන්ගොඩ නගරයේන් පිට වෙළදුන් ඇවිත් වෙළදාම් කරලා ආදායම අහිමි වෙගෙන යන තත්ත්වයක්.ලිඛිතවත් ඉදිරිපත් කර තිබෙනවා. සභාවෙන් වහාම තීරණයක් ගෙන ඒ අනවසර වෙළදුන් ඉවත් කරන්න මොකක් හරි වැඩපිළිවලක් යොදන්න කියා මා මේ සභාවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම ලිපිය මා සභාවට ඉදිරිපත් කරනවා. එය සභාගත කරන්න කියා. 33ක් අත්සන් කර ලිපියක් මට හම්බ වුණා. මා එය සභාපතිතුමාට ඉදිරිපත් කළා. සභා වාර්තාවට ඇතුළත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පුංචි පොළේ වෙළදාම් කරන වෙළදුන් විසින් මුඛ ආවරණ දමා හිටියත් දමා සිටින්නේ නිකටට. බෙල්ලට එල්ලෙන්න. මා හිතන්නේ එය ඉතා භායනක තත්ත්වයක්. පුංචි පොළට බඩු ගන්න යන පාරිභෝගිකයන්ට මා හිතන්නේ ලොකු කරදරයක් සිද්ධ වෙනවා. මා මේ අවස්ථාවේදි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ සෞඛ්‍ය පරික්ෂක නිලධාරින්තුමන්ලා යවා ඒ අයට ආවවාද කරන්න. එහෙම නැතිනම් එතන දැන්වීමක් අලවන්න. පුංචි පොළේ වෙළදාම් කරන අයගෙන් ඒ අය මුඛ ආවරණ පලදින්නේ නැතිනම් ඒ අයගෙන් බඩු මිලදි ගන්න එපා කියා දැනුවත් කිරිමක් කරන ලෙස ඉල්ලා සිටිනවා. එතකොට ඒ රාජකාරිය හරියට කරාවි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි චෝදනාවක් කළා ගරු උප සභාපතිතුමා සභාපතිතුමාට කවදාවත් සභාපතිතුමා විදියට ගරුත්වයක් නැහැ කියා. අපි කවදාවත් එහෙම කළේ නැහැ. ඔබතුමා මෙතනින් යන විට මා හැමදාම නැගිටිනවා. ඔබතුමා ඕනැම දෙයක් කළොත් මාගේ කොට්ඨාශයට ඔබතුමාට එක දමා ගන්න නෙමේ කියන්නේ. ඔබතුමා මොනම දෙයක් කළත් එය අභය කිරිමක් කරනවා. ඔබතුමා නෙමේ ඔය පුටුවේ කවුරු හිටියත් ඒ ගැන කතා කරනවා. ඔබතුමා මෙතනින් යනවිට නැගිටිනවා. එනකොටත් ඒ වගේ. අපි උප සභාපතිතුමාගේ චෝදනාව මා පිළිකුල් සේ හෙලා දකිනවා. ඒ කියන්නේ එහෙම එකක් කවදාවත් සිද්ධ වෙලා නැහැ. අවුරුදු තුනක් අපි හිටියා. මේ අපේ සංවිධායකතුමා හිටියත් මා හොඳ කොන්ද කෙලින් තියාගෙන කතා කරනවා. ඔබතුමා හරි දෙයක් කරන්න හෙට වුණොත් කවුරු විරුද්ධ වුණත් මා ඔබතුමාට එකඟ

වෙනවා. එක වෙනම තැනක. අම්බලන්ගොඩ නගරය බුද්ධිමතුන්ගෙන් පිරිණු නගරයක්. අපි ධර්මාශෝක විද්‍යාලයට ගිහින් ඉගෙන ගත් පුද්ගලයන්. අපේ සමකාලීන මිත්‍රයන් පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපි මෝඩයොද කියා බලයි.  අපි මේවාට විරුද්ධ වුණාම. අපිට තෙරෙනවා. මට තෙරෙනවා මාගේ අධ්‍යාපන සුදුසුකම් අනුව හරි මේ දේ හරි කියා. ඔබතුමාව සභාපති පුටුවෙන් අයින් කරන්න වත් ඒ කිසිම චෝදනාවකට නෙමේ. මට හිතෙනවා නම් මෙය වැරදියි කියා මා ඕන වේලාවක කොන්ද කෙලින් තියාගෙන ඔබතුමාට උදවු කරනවා. හැබැයි මන්ත්‍රීවරයෙක් විදියට සභාවේ දෙයට උදවු කරනවා. ඒ ගරුත්වය නැති වෙන්න අපි වැඩ කරලා නැහැ. අනිත් එක තමයි මා කොන්ද කෙලින් තියන්න වැඩ කරන කෙනෙක්. මට සභා වාර්තාව අවශ්‍යයි. මා එය අදත් කියනවා හෙටත් කියනවා. ඒ වගේ තමයි මේ නගර සභාවේ මහජන ක්‍රීඩාංගණය ඒ වගේම තනායම දෙකම අපිට තිබෙන ඒ දෙකම මහජන නියෝජිතයන් විදියට ජනතාව බලාපොරොත්තු වෙන දේවල්. අපිට ඕනතරම් අවස්ථාව තිබුණා. මේ ගෙවීම් සියළු දේවල් නතර කරන්න. අපි මන්ත්‍රීවරු කවදාවත් ඒ තත්ත්වයට වැටුණේ නැහැ. ඔබතුමා නගරයේ ප්‍රධාන පුරවැසියා විදියට නගරයට සේවයක් කළ යුතුයි කියන හැඟීම අපිට තිබෙනවා. නගරයේ මිනිසුන්ගෙන් බැණුම් අහන්න අපි කැමති නැහැ. හොඳ දෙයට අපි ඇත්තටම අසරණ වෙනවා උදවු නොකොළොත් එහෙම. අපි සවුත්තු වෙන්නේ. එමනිසා ඒ හින්දා අනිත් දේවල් වලටත් අපිට ඒ ස්භාවය අනුමත කරන්න බැහැ. ඔබතුමා මේ සියළු දෙනා එකතු කරගෙන සහයෝගයෙන් වැඩ කරන්න කියන ඉල්ලීම කරනවා. ඔබතුමාට ගරුත්වය අදත් තිබෙනවා. හෙටත් තිබෙනවා. හැමදාම තිබෙනවා. යම් දෙයකට විරුද්ධ වුණා කියා. අපේ අදහස් ප්‍රකාශ කරන එක අපේ අයිතිය. මොකද පෝරඹ ජනතාව මා එවා තිබෙන්නේ මගේන් යමක් බලාපොරෝත්තුවෙන්. එය මාගේ වගකීමක් . මාගේ යුතුකමක්. ඒ යුතුකම වගකීම මා ඉෂ්ඨ කළ යුතුයි නගර සභාවට. ඔබතුමාට හරිදෙයට මා අත ඔසවනවා. වැරදි දෙයට අත ඔසවන්නේ නැහැ. ඔබතුමා පුද්ගලික මට ගොඩක් දේවල් කරනවා. මාත් එක්ක ගොඩක් හිතවත්. නොමිලේ ලබා දෙන අභ්‍යාස පොත් අයදුම් පත් 10ක් වුණත් වැඩිපුර මට දුන්නා. ඒවා මාගේ හිතේ තියෙනවා. ඒ ගරුත්වය තිබෙනවා . මේ කාගේවත් කිම් වලට නෙමේ නැගිට්ටේ. ඔබතුමා මේ සභාව වැදගත් විදියට අරගෙන යනලෙස ඉල්ලීම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා විසින්ම යෝජනා කරන යෝජනාවකට අනුව පින්නදූව මං සන්ධියේ ඒ පාර මාරුවන ස්ථානයේ පවතින අවධානම ගැන මා කලින් කතා කළා. මා ගිය සභාව දිනයේම හතර පස් දෙනෙකුගේ අත්සන් එක්ක මා එය සභාවට ඉදිරිපත් කළා. ඒක න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා නැහැ. මොකද එතැන හරි අවධානම් තත්ත්වයක් පවතිනවා. එයට අපි යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ සභාව සම්මත වෙලා පැති කණ්නාඩි සවිකිරිමට තීරණයක් ගත්තා. නමුත් දැන් මේ වනකොට අවුරුද්දකටත් වැඩියි. යෝජනාව ඉදිරිපත් කරලා සම්මත වෙලා ඊළඟට තීරණයක් අරගෙන මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මෙය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියා. මොකද එතැන ඉතාමත් අවධානම් තත්ත්වයක් තිබෙන්නේ. එතැනින් පාර මාරුවන ස්ථානය ගැන මිනිසුන් කතා වෙනවා. මෙතැනින් පාර මාරු වෙන්න අමාරුයි කියා. වාහන එනවා. දෙපැත්තෙන් එන වාහන පෙන්නෙත් නැහැ. එමනිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න. එමනිසා ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ පවතින කොරෝනා වසංගතය නිසා මහජන සෞඛ්‍ය පරික්ෂක

මහතුන් විසින් සමහර නිවැසියන්ට නිවෙස් තුළම ස්වයං නිරෝධානයට ලක් වෙන්න කියනවා. නමුත් සමහර අය සිටිනවා තමුන් නිරෝධානය කරනවා කියා දැනුම් නොදෙන කොටස්. ඉතිං එක මේ අවස්ථාවේ අවධානම් තත්ත්වයක්. මා ඉල්ලා සිටිනවා අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ගෙන් අඩුම ගණනේ මේ නිරෝධානය වෙන්න කියන අසල්වැසි පුද්ගලයන් කිහිප දෙනෙක්ටත් ඒ පිළිබඳව දැනුවත් කරන්න කියා. අපේ ගමේම ඒ වගේ සිද්ධියක් සිද්ධ වුණා. එමනිසා ඒ පිළිබඳවත් මා සභාවේ අවධානය යොමු කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය එවූ ලිපිය ලැබුණා. සභාවට දමන්න ඕන නැහැ. මා එය ලේකම්තුමියට යොමු කළා. මොකද ඒ යෝජනාව මෙතැන සම්මත වුණාම එය ක්‍රියාත්මක කිරීම සභාපතිතුමාගේ ක්‍රියාවලියක් නෙමේ. එය ලේකම් සහ කාර්ය මණ්ඩලයේ වගකීමක්. මෙයට පිළිතුරු දෙන්න කියා දමා ඇති. එතකොට ඒ අය විසින් එම ක්‍රියාදාමය අනුගමනය කර වැඩ කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අනවසර වෙළඳුන් වෙනුවෙන් මොකද කරන්නේ. එය ආදායම් පරික්ෂක මහතුන් ලවා එය ඉවත් කරන්න. පිටස්තර පුද්ගලයන් ඇවිත් වෙළඳාම් කරන්නේ මේ අම්බලන්ගොඩ නගරයේ. ව්‍යාපාර කරන කට්ටිය අසරණභාවයට පත්වෙලා තිබෙන්නේ මේ වෙළඳාම නිසා. මොකද බඩු ලොරි ගණන් ගෙනත් හලනවා. ඒ මිනිසුන්ට සතියකට පාරක් වත් බඩු ගෙනවිත් විකුණන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ. ඉතිං නගර සභාව විදියට අපි ඒ ගැන සැලකිලිමත් විය යුතුයි. මොකද අම්බලන්ගොඩ නගර සභාවට බදුගෙවන ව්‍යාපාර කරන කට්ටිය ඉන්නේත එමනිසා ගරු සභාපතිතුමා මොකක් හරි තීරණයක් ගන්න අද හෙටම මේ ගැන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා යෝජනාවක් කරනවා මේ අනවසර වෙළදාම් කරන අය මේ නගරයෙන් ඉවත් කරන ලෙස .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පසුගිය දිනවල මා නිරෝධානයට ලක් වුණා. මගේ දියණිය නිරෝධානයට සිදුවීම නිසා. එමනිසා මටත් සිද්ධ වුණා නිවැසියෙක් හැටියට නිරෝධානයට ලක් වෙන්න. අද තමයි එහි වාර්තාව මට මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා විසින් දැනුම් දුන්නේ. ඒ අතර තුරදී මා ගෙදර සිටි කාල සීමාව තුළදී නිකුත් කරන ලද බඩු මල්ල ගැන . බඩු මලු දෙකක් මටත් ලැබුණා. ඉතිං මේ රජය ගෙන යන වැඩපිළිවලට හා ඔබතුමලා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටම මා ස්තුති වන්ත වෙනවා. අවුරුදු 65 ක් වෙන මා ජීවිතයේ පලමු වතාවට රජයෙන් දුන් ආධාරයක් මා

ලැබුවේ එදා. ඉතිං ඒ සම්බන්ධව වර්තමාන රජයටත් සමස්ත කාර්ය මණ්ඩලයටත් මා ස්තූති වන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර පෙර පාසැල වටා තාම සැලැස්මක් හම්බ වෙලා තිබුණේ නැහැ. මොකද දන්නේ නැහැ එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතා සිටිනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

විදුලි කණු වලට මුදල් බැඳ තිබුණා. එහි තත්ත්වය කොහොද දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා ඔය ප්‍රශ්නය ඇහුවා . අදාල මන්ත්‍රීතුමා දවසක් හරි පැමිණ මේ ගැන ඇහුවාද කියා. අද දිනයේ ඒ මේවා ගෙන්න ගියා. ගබඩාභාරකරු නැති නිසා අද පටවන්න බැහැ කියා තිබුණා. අපි මුදල් බැඳලත් ඉවරයි. ඔබතුමා මිට වැඩියේ ටිකක් උනාන්දු වෙලා මෙය කර ගන්න. මේ වැටේ චිත්‍රයක් ඉල්ලනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මානාන ක්‍රිඩාංගණයේ දැල නැවත කපලා. සභාපතිතුමනි මේ කපන අය ගැන සෙවිලෙන් සිටිය යුතුයි. දෙපලක් කපලා . මේ පොඩි ළමයින්ට සෙල්ලම් කිරිමට අපහසුතාවයට පත්වෙලා. පොඩි ළමුන් සෙල්ලම් කරන්න එනවා. නැවත වරක් සකස් කරන ලෙස මා ඉල්ලිමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අභ්‍යාස පොත් ලබා දිමේ අවසාන දිනය කවදාද දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ මස 11 වෙනිදා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

හෙට දෙන්න විදියක් නැහැ. ටිකක් කල් දෙන්න. දිර්ඝ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කෙන්ති ගන්න එපා. කෙන්ති ගන්නැතුව වැඩ කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කොච්චර කළත් වැඩක් නැහැ. අත ඔසවන්න කිවුවාම අත ඔසවනවා. හේතුවක් රහිතව කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

අපි නවක මන්ත්‍රීවරු. ඔබතුමාට මා එකයි යෝජනාවක් කළේ. ලක්ෂ කෝටි ගණන් මුදල් අනුමත කර ගන්න. මේ ලොකු ගණන් වල ඒවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මුල්‍ය කමිටුවට දැමිය හැක්කේ සැපයුම් වලට ගෙවන්න විතරයි. එතකොට අනිත් මේ කොන්ත්‍රාත් වලට ගෙවීම් මේ සභාව ඉතිරි කරගෙන තිබෙනවා. එහෙම නම් අපි සභාවෙන් එකටත් පවරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ඔබතුමා කිවුවානේ සභාවට පවරනවා කියා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පවරනවානම් එය අපි සභාවෙන් වෙනස් කරන්න ඕනේ. තිබ්බිච්ච මේවා. ලබන පාර එහෙනම් එවා දමන්න. මුල්‍ය කමිටුවට ගෙවන්න තිබෙන එවා තමයි අපි මෙතනට එවා තිබෙන්නේ. මුල්‍ය කමිටුවට ගෙවන්න බලයක් නැති නිසා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපිනම් කැමතියි එහෙම කරනවාට . අධිභාරය වෙයි කියා. අපි ඕවා දන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

තව එකක් තිබෙනවා . අපි දැනුවත් කිරිමක් කරන්න ඕන ඔබතුමාට. නගර සභාවේ මුදල් වලින් කොට්ඨාශ වලටත් වැඩ තිබෙනවානේ.දැන් ක්‍රිඩාංගණය අපිට පුළුවන්නේ මහජන අයිතියට දෙන්න. අර ඉතිරි වැඩ කොටස දේශපාලන සම්බන්ධකම් හරහා ඔබතුමා කර ගන්න බලන්න. ගරු අමාත්‍යවරුන්ගෙන් හරි අරගෙන.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මේවා කොච්චර හැදුවා කියා කොට්ඨාශ වල වැඩ කිරිම නතර වෙලා නැහැ. දැන් මන්ත්‍රීවරුන්ට මුදල් දී තිබෙන්නේ. ඔය වැඩ කරන්න දිලා තිබෙන්නේ.ඔය මහත්වරුන්ගේ නෝනාවරුන්ගේ මුදල් ගෙවන්න එවිනේ . එතකොට ඉතිං බලන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

නැහැ. එහෙම නෙමේ. ගන්න තිබෙන ඒවා සාධාරණ හේතුවක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එතකොට අත්සන් කරන හැටි බලා ගන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

දේශපාලන සම්බන්ධකම් මත ඔබතුමාට ගන්න පුළුවන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ පි.එච්.සී ද සිල්වා පස් සැපියිම වෙනුවෙන් ලක්ෂ 8ක ගණක් තිබෙනවා. පස් කියුබ් කියක්ද දන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අන්න එක බලා කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පස් කියුබ 100කටයි. අධික්ෂණය කලේ මා. ඉන් එහාට මා අත්සන් කර නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලිපි ගොණු ගෙනියන්නේ කොහේද? ලිපි ගොණු බලා කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පාසැල් අභ්‍යාස පොත් ලබා දීමේ අයදුම් පත් මා ගාව තිබෙනවා. අවශ්‍ය මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් ඉල්ලා ගන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

මා අර ළිඳේ ප්‍රශ්නයක් තිබෙනවා. ළිඳේ එම කොන්ක්‍රිට් එක ගන්න බැහැලු. සිලින්ඩර පුරවා ගන්න බැහැලු. වෙනත් පැත්තකින් මොකක් ද මැෂින් එකක් දමා ඉවත් කරන්න වෙනත් මැෂින් එකක් ගෙනාවාලු. අතර මැද කොන්ත්‍රාත්කරු හිරවෙලා සිටිනවා මේ ප්‍රශ්නය නිසා. මේ බස්සපු වළලු එම කොන්ක්‍රිට් එක නිසා එම වළලු බසින්නේ නැහැලු.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒක බලන්න පොඩ්ඩක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ විදිය පාරේ මිනිසුන් වතුර බැස යන කාණුවලට කොන්ක්‍රිට් දමා වසා තිබෙනවා. පුද්ගලික මුදල් යොදවා. එයට මොකක් හරි පියවරක් ගන්න. කාණු අවහිර කර තිබෙන්නේ. රෝයල් පොත්හල අසළ. අර බුදු පිළිම පැත්තට යන්න කාණු ඔක්කොම අවහිර කර තිබෙන්නේ. තම තමන්ගේ නිවෙස් වලට යන ජල කාරාම දමා තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන සෞඛ්‍ය නිලධාරිතුමනි , මේ කියන ඒවා බලන්න. සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.